ISSN 1391 - 1031
2014 සැප්තැම්බර්
20 වෙළුම 06 කලාපය

ආධාරය රු 30/=

# ✪ නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.

"අප පාලනය කරනු ලබන්නේ (එමෙන්ම අපගේ රාජ්‍යය 'තලා හැඩගස්වනු ලබන්නේ') ධනපති නිලධාරීන් විසිනි; ධනපති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසිනි; ධනපති විනිශ්චයකරුවන් විසිනි. ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී ධනපති රටවල් ඇතුළු සියලු ධනපති රටවල සිටින කෝටි සහ දසකෝටි සංඛ්‍යාත පීඩිත ජනතාවන් ඔවුන්ගේ අත්දැකීම්වලින්, දිනක් දිනක් පාසාම හඟින සහ අවබෝධ කරගන්නා සරල, පැහැදිලිව පෙනෙන හා අවිවාදී සත්‍යය එයයි."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
*09 වෙළුම*
*30 - පිටුව*









# හදිසි ජනාධිපතිවරණයකට

# බාධා රැසක්!

**මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා එළඹෙන වසරේ හදිසි ජනාධිපතිවරණයක් කැඳවීමට කටයුතු කරනු ඇති බවට ආණ්ඩුවේ නායකයින් ඇතුළු මැති ඇමතිවරුන් විසින් සහ ආණ්ඩුවට සමීප මාධ්‍ය ආයතන විසින් පසුගිය කාලය පුරා ප්‍රචාරයන් ගෙන ගියද මේ වන විට හදිසි ජනාධිපතිවරණයකට අතිශය බාධාකාරී තත්වයන් මතුවෙමින් ඇතැයි 0වාර්තා වේ.**

මෙම බාධාකාරී තත්වයන් අතරට දේශපාලන හේතු මෙන්ම නීතිමය කරුණුද හේතු වී තිබේ. රාජපක්ෂ ආණ්ඩුවේ පූර්ව ගණන් බැලීම වී තිබුණේ, බස්නාහිර හා දකුණු පළාත් සභා මැතිවරණවලින් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා තනි කොට පවත්වන්නා වූ ඌව පළාත් සභාවෙන් එම ජයග්‍රහණය උපරිම කරගැනීමෙන් අනතුරුව ජනාධිපතිවරණයකට යෑමය. කෙසේ වුවද මේ වන විට වර්ධනය වී ඇති සහ තවදුරටත් වර්ධනය වෙමින් ඇති තත්වයන් ආණ්ඩුවේ හදිසි ජනාධිපතිවරණ උත්සාහය ව්‍යර්ථ කරවනසුළු ඒවා වී ඇත යන්න දේශපාලන විචාරකයින්ගේ අදහසයි.


බස්නාහිර හා දකුණු පළාත් සභා මැතිවරණවලින් ආණ්ඩුව ජය ගත්තද එවා ආණ්ඩුවේ ඡන්ද පදනමේ බරපතළ ගරාවැටීමක් සනිටුහන් කළේය. ලබා ගත් ඡන්ද ප්‍රමාණයෙන් සහ ආසන ගණනින්ද එය ප්‍රකාශයට පත් වූයේ, ආණ්ඩුව දුබල වෙමින් යන බවට වූ සැඟවිය නොහැකි සත්‍යයක් සමගිනි. මෙම පසුබෑම ඉන්පසුව ආණ්ඩුවේ අභ්‍යන්තරය තුළින්ද පුපුරා ගිය අතර සන්ධානයේ විවිධ පක්ෂ ආණ්ඩුව සම්බන්ධයෙන් තම තමන්ගේ නොරිස්සුම්සහගත බව සටහන් කිරීමට ගත් උත්සාහයද කැපී පෙනුණි. එසේම හුදෙකලා කොට පැවැත්වීමෙන් ජයග්‍රහණය උච්චතම අදියරකට ගෙනයාමට අපේක්ෂා කළ ඌව පළාත් සභා මැතිවරණයේ අභ්‍යන්තර මත විමසුම් මගින් පළවී ඇත්තේ, එය ආණ්ඩුවට අනපේක්ෂිත ප්‍රතිඵලයක් ගෙන එනු ඇති බවය.

මේ අතර සන්ධානයේ හවුල්කාර පක්ෂ විසින් ආණ්ඩුවේ ඇතැම් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පළකර ඇති විරෝධතා යම් පමණකට ප්‍රදර්ශනය වෙමින් තිබේ. කෙසේ වුවද දේශපාලන හා ආර්ථික බලය කේන්ද්‍රගත කරගනිමින් සිටින රාජපක්ෂවරුන් සම්බන්ධයෙන් ශ්‍රීලනිප ජ්‍යෙෂ්ඨයින් තුළ වර්ධනය වන සීතල විරෝධය මේ දක්වා පුපුරා ගොස් නොමැති වුවද එය සැලකිය යුතු ලෙස වර්ධනය වෙමින් ඇති බවත් ඔවුන් ජනාධිපතිවරණයක් ඉලක්ක කර ගනිමින් කේවල්කිරීම්වලට යනු ඇති බවත් නොරහසකි.

රාජපක්ෂ ආණ්ඩුවේ හදිසි ජනාධිපතිවරණ උත්සාහයට අලුත්ම බාධාව එල්ල වී ඇත්තේ නීතිමය පාර්ශවයෙනි. ඒ, 18වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරණයට ඉදිරිපත්විය හැකි වාර ගණනේ සීමාව රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් ඉවත් කර ගනු ලැබුවද එය අතීතයට බලපාන පරිදි සිදුනොවීම නිසා ඔහුට එම අවස්ථාව හිමි නොවන බවට වූ ප්‍රබල නීතිමය තර්කය. එය, එම සංශෝධනය කඩිනමින් ගෙනඒම නිසා සිදුව ඇති අතපසුවීමක් බව පෙන්වා දෙන ඔවුහු ඒ හේතුවෙන් 'ජනතාව විසින් දෙවරක් තෝරා ගන්නා ලද තැනැත්තෙකු ඉන්පසු ජනාධිපති ධූරයට සුදුස්සෙකු නොවන බවට' වූ ව්‍යවස්ථාවේ 31(2) වගන්තිය රාජපක්ෂ ජනාධිපතිවරයාට නැවත ඉදිරිපත්වීමට බාධාවක් වන බව ප්‍රකාශ කරති.

මේ සියලු තත්වයන් සලකා බලන දේශපාලන විචාරකයින් පෙන්වා දෙන්නේ, ආණ්ඩුව අපේක්ෂා කළ තරම් පහසුවෙන් ජනාධිපතිවරණයක් ජයග්‍රහණය කිරීමට තබා එවැන්නක් කැඳවීමට පවා නොහැකියාවකට රාජපක්ෂ ආණ්ඩුව මේ වන විට පත්වී ඇති බවය.

**3 සංවාදය**



"මෙම ඒකාධිපති පාලනයත් මෙවැනි ඒකාධිපතියන් බිහිකරන ...

**5 පොදු අපේක්ෂක...**



විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට හා සැබෑ ලෙසම ප්‍රජාතන්ත්‍රවාදය...

**10 ජල හිඟයේ...**



ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වූ කෘෂිකාර්මාන්තය සඳහා 40% ජල කෝටා ප්‍රතිපත්තිය...

**11 අතිරික්ත ගොඩගැසීම...**



ඒකාධිකාරය අධි ලාභ උපදවයි. එනම්, ලොව මුළුල්ලේම සිරිතක් ...

තරුණ.................... 04
දැක්ම.................... 08
ජාත්‍යන්තර............ 09
කාන්තා................ 12
වේදිකාව............... 13
විශේෂාංග.............. 14

යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!



# වැඩ බිම



## ආණ්ඩුවේ බාධා හමුවේ ඌව පළාත් මැන් පවර් සේවකයින්ගෙන් දැවැන්ත සමුළුවක්



පසුගිය 17 වැනි දින ඌව පළාතේ විදුලි බල මණ්ඩල මැන් පවර් සේවකයින් බලමුළු ගන්වමින් පැවති මහ සමුළුව බදුල්ල තැපැල් ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ලංකා විදුලි බල මණ්ඩලයේ දිවයින පුරා පිහිටි සේවා ස්ථානවල මැන්පවර් සමාගම් මගින් සේවයට රැගෙන තිබෙන සේවකයින්ගේ වහල්භාවය අහෝසිකර ඔවුන් ලංවිම තුළ ස්ථිර සේවයට පත්කිරීමට ඉල්ලා පළාත් මට්ටමින් මෙම සමුළු පැවැත්වේ. ඌව පළාත් සමුළුව පැවැත්වීමට පෙර සිටම ආණ්ඩුවේ දේශපාලඥයින් විසින් විවිධ බාධාකිරීම් කරමින් ප්‍රචාරක කටවුට් පවා ගිනි තැබීමට කටයුතු කළ බවත් එම සියලු උත්සාහයන් පරදවා සමුළුව සාර්ථකව පැවැත්වූ බවත් රංජන් ජයලාල් සහෝදරයා පැවසීය. මෙම අවස්ථාව සඳහා මෙවර ඌව පළාත් සභා මැතිවරණය සඳහා ජනතා විමුක්ති පෙරමුණෙන් ඉදිරිපත් වී සිටින කණ්ඩායම් නායක සමන්ත විද්‍යාරත්න සහෝදරයාද සහභාගි විය.

## 'සියලු සේවක වැටුප් වැඩිකරනු' - පෙත්සම ගම්පහටත්



හතර දෙනෙකුගෙන් යුත් පවුලක මාසික ජීවන වියදම රුපියල් 50,792 /= ක් දක්වා වැඩිවීම හේතුවෙන් සියලු සේවක වැටුප් වැඩිකිරීමටත් එල්ලා ඇති රාජ්‍ය සේවක දීමනා මූලික වැටුපට එකතු කිරීමටත් ආණ්ඩුවට බලකරමින් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය මගින් අරඹන ලද පෙත්සම් අත්සන් කිරීමේ ව්‍යාපාරය පසුගියදා ගම්පහදී පැවැත්විණි. වැඩබිම් මට්ටමින් හා ආයතන මට්ටමින් දිවයින පුරා මෙම පෙත්සම අත්සන් කරනු ලබන බවත් එහි එක් පියවරක් ලෙස ගම්පහ දුම්රියපොළ ඉදිරිපිටදී මෙම පෙත්සම අත්සන් තැබුණු බවත් ඒ සඳහා විශාල ජනතා උනන්දුවක් පැවති බවත් මෙම අවස්ථාවට එක් වූ ගම්පහ දිස්ත්‍රික් වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුවේ කැඳවුම්කරු ජල සම්පාදන හා ජලාපවහන සේවක සංගමයේ ප්‍රධාන ලේකම් උපාලි රත්නායක සහෝදරයා පැවසීය.

## ලිඛිත පොරොන්දුවෙන් පසු සෞඛ්‍ය වර්ජනය අවසන්



සෞඛ්‍ය සේවාවට අයත් ශ්‍රේණීන් 30 ක මූලික ඉල්ලීම් 7 ක් මුල්කර ගනිමින් පසුගිය 20 දා ආරම්භ කළ අඛණ්ඩ වැඩ වර්ජනය මාස 3 ක් දක්වා තාවකාලිකව නතර කිරීමට සමස්ත ලංකා සුවසේවා සංගය තීරණය කර ඇත. එම වැඩවර්ජනය අතරතුරදී ජනාධිපතිවරයා විසින් වෘත්තීය සමිති කැඳවා මාස 3 ක් ඇතුළත විසඳුම් ලබාදීමට කටයුතු කරන බව පැවසීමත් ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය මගින් ලිඛිතව එකඟවීමත් හේතුවෙන් මෙම වැඩවර්ජනය මාස 3 ක් දක්වා අත්හිටුවීමට කටයුතු කරන බව සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් සමන්ත කෝරලේආරච්චි සහෝදරයා පැවසීය.

06/2006 හිඟ වැටුප් ලබානොදීම, ආදේශක සේවකයන් ස්ථිර නොකිරීම, P/L සහ MN කාණ්ඩවලට අයත් සෞඛ්‍ය කාර්යමණ්ඩල ගැටලු මෙතෙක් නොවිසඳීම යන ගැටලු මෙම වැඩ වර්ජනය සඳහා හේතු වී ඇත. උක්ත ඉල්ලීම් දිනා ගැනීම වෙනුවෙන් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩල සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් දිගින් දිගටම පෙනී සිටිමින් දැඩි වෘත්තිය සමිති ක්‍රියාමාර්ග ගත් වෘත්තිය සමිතිය වන්නේ සමස්ත ලංකා සුව සේවා සංගමය බවද සමන්ත කොර්ලේආරච්චි සහෝදරයා ප්‍රකාශ කර සිටී.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා සේවක ප්‍රශ්න ගැන විසඳුම් ලබා දීමට එකඟ වුවත් එහි ඇති විශ්වාසය සම්බන්ධයෙන් තම සංගමය දැඩි අවධානයෙන් සිටින බවද තමනට පිළිගත හැකි විසඳුමක් ලබා නොදුනහොත් නැවත සෞඛ්‍ය කාර්ය මණ්ඩල අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාමාර්ගයන්ට එළැඹීමට තම සංගමය කිසිදු මොහොතක පසුබට නොවන බවද ඔහු අවධාරණය කර සිටියේය.

## ලංගම EPF මුදල් කෝටි 768ක් බැංකුගත නොකිරීමට එරෙහිව නඩු



ශ්‍රී ලංගම සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් රුපියල් කෝටි 768 කට ආසන්න මුදලක් බැංකුගත කිරීම පැහැර හැරීමට එරෙහිව පසුගිය 27 දින සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය මගින් අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කරනු ලැබිණි. මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා, කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්වරයා, ප්‍රවාහන ඇමතිවරයා සහ ශ්‍රී ලංගම සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය වගඋත්තරකරුවන් බවට පත්කර CA (WRIT) /293/2014 අංක යටතේ මෙම නඩුව ගොනු කරනු ලැබිණි. ඉහත වගඋත්තරකරුවන් ලෙස නම්කරනු ලැබුවන්ගෙන් තම සංගමය දිගින් දිගටම මෙම මුදල් බැංකු ගත කරන ලෙස ඉල්ලා සිටියද කිසිදු යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු බවද මේ නිසා සියලු සේවකයින්ට ඉමහත් අසාධාරණයක් සිදු වී ඇති බවද එබැවින් වගකිවයුතු වෘත්තීය සමිතියක් වශයෙන් සේවකයින්ට සාධාරණය ඉටු කිරීම සඳහා මෙලෙස නඩුවක් ගොනු කිරීමට සිදු වූ බව සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ලේකම් සේපාල ලියනගේ සහෝදරයා නියමුවා වෙත පැවසීය.

## උසස් පෙළට බාධා කළ පෙළපාලිකරුවන්ට නීතිය නැද්ද? ජ.වි.පෙ. මැ.කො.ට ලියයි

විභාගයට පෙනී සිටින සිසුන්ට බාධා විය හැකි නිසා නාමයෝජනා අවසන් දිනයේ පෙළපාලි නොපවත්වන ලෙස දැනුම්දී තිබියෙදී පෙළපාලි ගිය හා මැතිවරණ නිලධාරීන්ගේ රාජකාරිවලට බාධාකළ සන්ධාන නායකයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින් පසුගිය 07වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් යොමුකළේය. එම ලිපියේ මෙසේ සඳහන්ය.

ඌව පළාත් සභා ඡන්ද විමසීමට අදාලව ඔබතුමා විසින් ඌව පළාත් සභා ඡන්දයට තරඟ කරන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන් අමතා එවන ලද ඔබේ අංක PEC/2014UVA/2 දරන 2014.07.30 දිනැති ලිපියෙන් හා ඊටම අදාළව එවන ලද PEC/2014/UVA/4B දරන 2014.07.31 දිනැති ලිපියෙන් මැතිවරණ නීති රැකීමේ අවශ්‍යතාවය තදින් අවධාරණය කර තිබුණි.

එහිදී විශේෂයෙන්ම එම ලිපි මගින් ඔබතුමා ඉල්ලා තිබුණේ, අගෝස්තු 05 දින සිට උසස් පෙළ විභාගය ආරම්භ වන බැවින් විභාගයට පෙනී සිටින සිසුන්ට බාධා විය හැකි නිසා නාමයෝජනා අවසන් දිනයේ කිසිදු පෙළපාලියක්, රථ පෙළපාලියක් නොපවත්වන ලෙසය. පෙළපාලි පැවැත්වීම මැතිවරණ නීතියට පටහැණි බැවින් එලෙස නීති නොසළකා පෙළපාලි පවත්වන අයට එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක කරන බවද එහි සඳහන් කර තිබුණි.

උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ගේ විභාග කටයුතුවලට බාධා නොකළ යුතු නිසාත්, මැතිවරණ නීතිය ආරක්ෂා කළ යුතු නිසාත් නාමයෝජනා අවසන් දිනය වන අගෝස්තු 06 වැනිදා රථ පෙළපාලි යාම, ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීම හා අපේක්ෂකයින් පිළිගැනීමේ උත්සව පවා නොකර සිටීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කරන ලදී. ඒ බව 2014 අගෝස්තු 01 දා පැවැති ජනමාධ්‍ය සාකච්ඡාවේදීද ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ජනතා විමුක්ති පෙරමුණ අගෝස්තු 06 වැනිදා රථ පෙළපාලි පැවැත්වීම් ඇතුළු ප්‍රචාරක කටයුතුවලින් වැළකී සිටින ලදී.

එහෙත් එදින මැතිවරණ නීතිය හා ඔබගේ ඉල්ලීම නොසලකා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂකයන් හා එක්සත් ජාතික පක්ෂයේ සමහර අපේක්ෂකයන් වාහනවල නැගී සෝෂා කරමින් පෙළපාලි යනවා දක්නට ලැබුණි. එම රථ පෙළපාලි නැවැත්වීමට බොහෝ තැන්වල ආරක්ෂක අංශ උත්සාහ දැරූ බවක්ද දකින්නට නොලැබිණි. ඒ අතර මහියංගණය ප්‍රදේශයේ එවැනි රථ පෙළපාලියක් නැවැත්වීමට ගිය මැතිවරණ නිලධාරීන්ට එකී පෙළපාලිය මෙහෙයවූ එ.ජ.නි.ස. නායකයින් තර්ජනය කොට රාජකාරියට බාධා කළ බවද දැනගන්නට ලැබුණි.

මැතිවරණ ව්‍යාපාරය ආරම්භයේදීම සිදුවූ මෙම තත්වය ඉතාම බරපතළ තත්වයක් ලෙස අපි සලකමු. මැතිවරණ නීති අපක්ෂපාතී ලෙස රැකීම සිදුවේදැයි යන සැකය මේ තත්වය හරහා මතුවීම වැළැක්විය නොහැක. එබැවින් මැතිවරණ නීති උල්ලංඝණය කරමින් අගෝස්තු 06 වැනිදා රථ පෙළපාලි පැවැත්වූ අය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාවට නැගීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇතැයි අපේක්ෂා කරමු.

## විදෙස්ගත ලාංකික ශ්‍රමිකයින්ගේ ගැටලු පිළිබඳව ආණ්ඩුව නිහඬයි

### 'එතෙර අපි' සංවිධානයේ සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා




ශ්‍රී ලාංකිකයින් ලක්ෂ 18ක් පමණ මේ වනවිට විදෙස්ගතව සේවය කරමින් රුපියල් බිලියන ගණනක විදේශ විනිමය රටට ගෙනඑමින් සිටියද ආණ්ඩුව ඔවුන්ගේ ගැටලු සම්බන්ධයෙන් මුණිවත රකිමින් සිටින්නේයැයි 'එතෙර අපි' සංවිධානයේ සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා පැවසීය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ පසුගිය 31වැනි දින එතෙර අපි සංවිධානය විසින් ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී කැඳවන ලද ජනමාධ්‍ය සාකච්ඡාවකදීය. එම සංවිධානයේ ලේකම් ලක්ෂමන් නිපුනආරච්චි සහ භාණ්ඩාගාරික නීතිඥ ජානක අධිකාරි යන සහෝදරවරුන්ද එක්ව සිටි මෙම මාධ්‍ය හමුවේදී හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද කීය.

"පසුගියදා මාධ්‍යවල පළවී තිබුණා, ආණ්ඩුව විදෙස් ශ්‍රමිකයින්ගෙන් ඉදිරි වසර තුළ රු. කෝටි 130,000ක විදේශ විනිමයක් උපයා ගැනීමට බලාපොරොත්තු වෙනවා කියලා. රු. බිලියන 6.3ක විදේශ විනිමය ආදායමක් 2013දී ලැබුණු බවද ඩිලාන් පෙරේරා ඇමතිවරයා පවසා තිබුණා. ඔහු වැඩිදුරටත් පවසා තිබෙන්නේ, විදෙස් ශ්‍රමිකයින්ගේ වාර්ෂික ආදායම රු.280,000ක් වන බවයි. මේ අනුව ගත්තාම විදේශ ශ්‍රමිකයෙකුගේ මාසික ආදායම රු.23,333යි. ඔවුන් ණය වෙලා, ඉඩකඩම් උගස් තියලා, තමන්ගේ ඥාති හිතමිත්‍රාදීන් අතහැරලා, විදෙස් රටකට ගොස් තිනවෙලා දහදුක් විඳලා උපයන මුදල මාසයකට රු.23,000ක් බව ඇමතිවරයා පිළිගන්නවා. ලංකාවේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ගණනයට අනුව හතර දෙනෙකුගෙන් යුත් පවුලක ජීවන වියදම මේ වනවිට 50,792ක් වෙනවා. එසේ නම් විදෙස්ගත ශ්‍රී ලාංකිකයෙකුගේ පවුලක් රු. 23,333කින් ජීවත් වෙන්නේ කොහොමද?

● ආණ්ඩුව උත්සාහ කරන්නේ විදෙස්ගත ශ්‍රමිකයින්ගේ ජීවන මට්ටම උසස් කරනවා වෙනුවට රට පටවන ප්‍රමාණය වැඩිකර පෙන්වීමටයි. කටාර්වල, කුවේට්වල, සෞදිවල, වෙනත් රටවල අයට අවම වැටුපක් සහතික කර තිබෙනවා. විශේෂයෙන් පිලිපීනය අවම වැටුප තහවුරු කර තිබෙනවා. එම අවම වැටුප ලැබෙන්නේ නැත්නම් ඔවුන් විදේශ සේවයට ශ්‍රමිකයින් යවන්නේ නැහැ. විදෙස්ගතවන ශ්‍රී ලාංකිකයින්ට අවම වැටුපක් සහතික කළ යුතුයි. මේ සම්බන්ධයෙන් අපි ඉදිරි අයවැයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට බලාපෙරාත්තු වෙනවා.

● ඒ වගේම තමයි කොරියන් රැකියා ප්‍රශ්නය. මේ පිළිබඳව ආණ්ඩුවට, ඇමතිවරයාට, විදේශ සේවා නියුක්ති කාර්යාංශයට විවිධ විග්‍රහ තිබෙනවා. නමුත් ඔවුන් ශ්‍රී ලාංකිකයින්ට කොරියන් රැකියා අහිමි කිරීමේ කොටස්කරුවන් බවට පත්වෙලා තිබෙනවා. කොරියන් රැකියා බලාපොරොත්තුවෙන් සිටි 2541 දෙනෙකුට 2011දී අවස්ථාව අහිමි වුණා. ආණ්ඩුව වරද පැටෙව්වේ කොරියානු රජයටයි. නමුත් ආණ්ඩුව කළේ තමන්ගේ දේශපාලන ලැයිස්තුවලින් හිතවතුන්ට කොරියන් රැකියා ලබාදීමයි. ඒ නිසා තමයි 2012, 2013 කණ්ඩායම්වලටවත් පෙරකී 2541ක පිරිස ඇතුල් වුණේ නැත්තේ. ඔවුන් 2014.06.18 වන දින උපවාසයක් පවා ආරම්භ කළා. මෙය ඉතා සාහසික දෙයක්. ආණ්ඩුව ඔවුන්ගේ සියලු බලාපොරොත්තු බිඳ වට්ටවා තිබෙනවා. මෙය අවසානය නොවේ. තවත් එවැනිම පිරිසකට මෙම ඉරණම අත්විය හැකියි. විශේෂයෙන් කිවයුතු දෙයක් තිබෙනවා. කොරියන් රැකියා අහිමිවුණු 2541 දෙනා අතර බදුල්ලේ එක් අයෙක්වත් නැහැ. හම්බන්තොට අය ඉන්නේ තිදෙනෙක් පමණයි. ඒ නිසා මෙය දේශපාලන වුවමනාවක් මත සිදුවූ දෙයක් බව පැහැදිලියි.

● යුරෝපා රටවල වසර ගණනාවක් රැකියා කරමින් ජීවත් වන විශාල ශ්‍රී ලාංකිකයින් පිරිසක් තමන්ගේ දූදරුවන්ට ද්විත්ව පුරවැසිභාවය බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔවුන්ට එම අවස්ථාව ලබාදීමට ආණ්ඩුව කටයුතු කරන්නේ නැහැ. නමුත් දේශපාලනඥයින් විශාල පිරිසකට මෙම ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන තිබෙනවා. එනිසා අපි ආණ්ඩුවට බලකරනවා, ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින ගැටලු සොයා බලා එම ශ්‍රී ලාංකිකයින්ගේ ගැටලුව විසඳන්න මැදිහත් වෙන්න කියලා.

● විදෙස් රටක සේවය කරන ශ්‍රී ලාංකිකයෙකුට වසර 05කින් පසු නැවත ලංකාවට පැමිණෙන විට ඔහු පාවිච්චි කළ වාහනය බදු ගෙවීමකින් තොරව ලංකාවට ගෙනඒමේ හැකියාව තිබුණා. නමුත් මේ ආණ්ඩුව එම පහසුකම අහිමි කරලා තිබෙනවා. ආණ්ඩුව රටවිරුවෝ කියමින් බිලියන 06ක විදේශ විනිමයක් ගෙනෙන පිරිස ගැන කිඹුල් කඳුළු හෙළුවට රුපියලක්වත් වියදම් නොකර ඔවුන්ට ලබාදිය හැකි පහසුකම් පිළිබඳව අවධානය යොමුකරන්නේ නැහැ. මේ ආණ්ඩුවලට නාස්ති කරන්නත් මුදල් හොයලා දෙන්නෙත් මේ රට විරුවෝ කියන පිරිසමයි.

● කොරියාවේ සේවය කරන ශ්‍රී ලංකිකයින්ගේ පාරිතෝෂිතය සම්බන්ධයෙන්ද අර්බුදයක් පැනනැගී තිබෙනවා. ඔවුන්ට ලැබෙන කුක්මින් නම් පාරිතෝෂික මුදල ලංකාවට එන විට ලබාගැනීමේ හැකියාවක් ඔවුන්ට තිබෙනවා. නමුත් පසුගියදා සමාජ ආරක්ෂණ අරමුදලේ සභාපතිනිය ජනාධිපතිවරයා වෙනුවෙන් පෙනී සිටිමින් කියා සිටියේ කොරියන් සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින්ට ලැබෙන එම ප්‍රතිලාභය යොදාගනිමින් එම සේවකයින්ට වසර 60ක් 15වැනි පිටුවට

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## නිවැරදි මඟට ගතයුතු වැරදි තැනින් පුපුරා යන පීඩාව

වත්මන් සමාජය දැන් පවතින්නේ පුපුරා යාමට ආසන්න ගිනිකන්දක් සේය. පොදුවේ සමාජය තුළ මෙන්ම හැම කෙනෙක් තුළමද විශාල පීඩාවක් ගොඩ ගැසී තිබේ. කාලාන්තරයක් තිස්සේ ගොඩ ගැසුණු, විසඳුමක් නැති ජීවන ගැටලු, ආර්ථික හා සමාජීය ප්‍රශ්න විසින් බහුතරයක් ජනතාව විශාල පීඩාවකට පත්කර තිබේ. ඒ අතරම අතළොස්සක් දෙනා මහජනතාවගේ පීඩාව මත සුඛ විහරණ සහිත ජීවිතද ගත කරනු පෙනේ.

ධනවාදයේ වෙළඳපොළ හැම අතකටම ප්‍රසාරණය වෙමින් ධනේශ්වර නිෂ්පාදන මිලට ගන්නා ලෙසත්, ජීවිතය විඳින ලෙසත් නිතිපතා මිනිසුන්ට බලකරමින් සිටී. එහෙත් එම ජීවිතය විඳීමට පොදු ජනයාට අවස්ථාවක් නැත. ඒ නිසාද ඔවුහු පීඩාවට පත්වෙමින් සිටිති. ආණ්ඩුවේ ආර්ථික සංවර්ධනය ගැන කියන පම්පෝරි මැද මිනිස් ජීවිත දූවිලි බවට පත්ව ධනවාදී පරිභෝජනවාදී ජීවන රටාව සඳහා තරඟයට වැටෙන ජනතාව ඒ තුළට සමාජයටද හානිකරමින් තමන්ටද හානි කරගනිමින් තිබේ.

මෑත කාලයේ වැඩිවී ඇති අපරාධ තුළ දැකිය හැක්කේ, වත්මන් මිනිසුන්ගේ බලාපොරොත්තු කඩවීමේ වේදනාව හා පීඩනය පුපුරා යන ආකාරයන්ය. මැදපෙරදිග ගිය සිය බිරිඳ යළි තමන් වෙත නොපැමිණෙන බව දැනගත්විට තම දරු දෙදෙනා නිදි යහනේම මරා දමා තමන්ද දිවි නසා ගැනීමට තැත්කළ යටියන්තොට පියා තුළින්ද තම දරු දෙදෙනා නිල්වලා ගඟට දමා තමන්ද එයට පැන දිවි නසාගත් මාතර පියා තුළින්ද මෑතදීම වයස අවුරුදු 1 මාස 9ක කිරිකැටි බිළිඳිය පොළොවේ ගසා මරා දැමූ පියා තුළින්ද එමෙන්ම, සිත් තැවුලෙන් දිවි නසාගන්නා අය තුළින්ද ප්‍රකාශයට පත්වෙමින් තිබෙන්නේ මෙම සමාජ පීඩනයමය. එහෙත් තමන් පෙළන තමන්ගේ කිට්ටුම අය මගින් වරින්වර පුපුරා යන මෙම සමාජ පීඩනය ඇතිවූ ආකාරය ගැන හෝ ඊට සැබෑ ලෙසම වගකිව යුත්තේ කවුද යන්න ගැන පොදුවේ ජනතාවට අවබෝධයක් නැත. ඒ නිසාම එකිනෙකාගේ පුපුරා යන කෝපයට ගොදුරුවන්නේ ඊට වගකිවයුත්තන් නොව ඊට කිසිසේත් වගකිව යුතු නැති අයය; දරුවන්ය; ඥාතීන්ය; අසල්වැසියන්ය. මෙය දැන් සමාජ බේදවාචකයක් දක්වා වර්ධනය වෙමින් තිබීම ඉතාම බරපතළය.


රටක සංවර්ධනය මැනිය හැකි හොඳම මිනුම් දණ්ඩ වන්නේ, ජනතාවගේ මුහුණේ තිබෙන සිනහව යයි වරක් එක් දාර්ශනිකයෙක් පවසා තිබුණි. ඒ අර්ථයෙන් ගත්විට අපේ රටේ මුහුණේ සිනහව ඇත්තේ බලයට සම්බන්ධ පවුල් කිහිපයක හා සුපිරි පැළැන්තියේ අය තුළ පමණි. පොදු ජනතාවගේ මුහුණේ සිනහව නැත. ඒ වෙනුවට ඔවුන්ගේ සිත්තුළ ඇත්තේ ජීවන බර හා පීඩාව නිසා උපන් බලාපොරොත්තු කඩවීම හා කෝපයකි. දැන් විටින් විට හුදකලාව පිට වන්නේ එම කෝපයයි.

ලංකාවේ ආර්ථිය හා දේශපාලනය තුළ දිනපතා වැඩිවෙන ඇති නැති පරතරය විසින්, පොදු මිනිසා මත බර පටවමින් සුපිරි පැළැන්තියකගේ සතුට වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග විසින් මේ තත්වය තව තවත් වර්ධනය කරමින් තිබේ. ආණ්ඩුවේ සංවර්ධනය පෙන්වන කැටපත් ලෙස තිබෙන කොළඹ නගරය ලස්සන කිරීම, අධිවේගී මාර්ග, නෙළුම් පොකුණ, නෙළුම් කුළුණ හා පාවෙන වෙළඳපොළ යන සියලු දෙයම පෙන්වන්නේ පොදු ජනයා නොසලකන, ඔවුන් මත බර පටවා සුපිරි පැළැන්තියක සතුට වෙනුවෙන් සිදුකරන කාර්යයන්ය.

දැන් සිදුවිය යුත්තේ කුමක්ද? දැන් අවශ්‍ය කුමක්ද? සැබැවින්ම දැන් සමාජයට අවශ්‍යව ඇත්තේ, වර්තමාන සමාජයේ පවතින මෙම අසාධාරණයත්, පීඩාවත් නිවැරදිව ජනතාවනට තෝරා බේරා දෙන, ඊට හේතු හා එහි වගඋත්තරකරුවනුත් ඊට විසඳුමත් උගන්වන මතවාදී අරගලයකි. සියලු බුද්ධිමතුන්ද මත හදන්නන්ද, කලාකරුවන්ද තම කාර්යභාරය ලෙස එය සලකන්නේනම් අහිංසකයන්ට හානිකරමින් හුදකලාව පුපුරා යන මේ ජනතා විරෝධය, මේ පීඩාව ධනවාදය අවසන් කොට නව සමජයක උපත සඳහා යොදාගත හැක.

සැබෑ ලෙසම දැන් විය යුත්තේ, ජනතාව තුළ ඇති පීඩාව පීඩිතයන්ටම එරෙහිවම යෙදවීම වළකා එය තමන් පීඩාවට පතකළ වත්මන් සමාජ ක්‍රමයට හා එහි වගඋත්තරකරුවන්ට එරෙහිව සංවිධානාත්මකව යෙදවීම සඳහා ජනතාව දැනුවත් කිරීමය. ජනතාව තුළ පවත්නා පීඩනය සමාජයට හානිකරන බලයක් වනවා වෙනුවට සමාජය වෙනස් කරන, පොදු ජනතාවට යහපතක් වන බලයක් බවට පත් කිරීමය. ඒ සඳහා තම තමන්ගේ ක්ෂේත්‍රවල සිට තම තමන්ගේ මෙවලම්ද සහිතව මැදිහත්වීම හැම දෙනාගේම වගකීම වේ.

# ජනතාවට ජයග්‍රහණ ගෙනෙන මාවතකට රට යොමු කළ යුතුයි!



ජ.වි.පෙ. ප්‍රධාන ලේකම්
**ටිල්වින් සිල්වා සහෝදරයා**

*නියමුවා:- මේ වනවිට ඌව පළාත් සභා මැතිවරණය කෙරෙහි මුළු රටේම අවධානය යොමුවෙලා තිබෙනවා. ජනතා විමුක්ති පෙමුණත් ඊට විශාල බරක් දාලා තිබෙන බව පේනවා. මේ විශේෂය කුමක්ද?*

*ටිල්වින් සිල්වා සහෝදරයා:-*

ඌව පළාත් සභා ඡන්දය ආණ්ඩුව වෙන්කරලා, හුදකලා කරලා පැවැත්වීමට තීරණය කළේ විශේෂ හේතුවක් මතයි. ඒ, අනෙක් පළාත්වල පළාත් සභා වරින් වර පවත්වලා, ඒව දිනලා එම ජයග්‍රාහී මානසිකත්වය උපයෝගී කරගෙන ඌවත් දිනලා, ඒ සමඟම ඉක්මන් ජනාධිපතිවරණයකට යාම සඳහායි. ඒ නිසා මෙම ඡන්දය පළාත් සභා පෙළේ අවසාන ඡන්දය වගේම ඉදිරියේ පැමිණීමට නියමිත ඉක්මන් ජනාධිපතිවරණයට පෙර තබන අවසන් ඡන්දය වෙනවා. මෙහි ප්‍රතිඵලය හැම පක්ෂයකටම ජාතික මට්ටමින් බලපානවා. ඒ නිසයි මෙය ජාතික ඡන්දයක හැඩය අරගෙන තිබෙන්නේ. මෙම ඡන්දයට අපි ලොකු බරක් දාලා මැදිහත් වෙන්නේ ඒ නිසයි. අපි හිතනවා, මේ ඡන්දය අපේ රටේ මෙතෙක් පැවති ධනපති කණ්ඩායම් දෙකක් අතර වරින් වර බලය මාරුවුණ, හැමදාම ඡන්දය දුන් ජනතාව රැවටුන හා පැරදුන, සම්ප්‍රදායික දේශපාලනය වෙනස්කරලා රට නව ජයග්‍රාහී දේශපාලන මඟකට රැගෙන යාමට තබන විශාල පියවරක් කරගත යුතුයි කියලා. ඒ අරමුණින් තමයි අපි මෙම ඡන්දය තුළ ක්‍රියාත්මක වෙමින් සිටින්නේ.

*නියමුවා:- දැනට මැතිවරණ ව්‍යාපාරය තුළ ඔබ නිරීක්ෂණය කළ දේ අනුව මැතිවරණයේ ප්‍රතිඵලය කුමක් වේවිද?*

*ටිල්වින් සිල්වා සහෝදරයා:-*

පැහැදිලිවම මෙම ඌව පළාත් සභා ඡන්දයෙන් ආණ්ඩුවේ ඡන්ද අඩුවෙනවා. දකුණ හා බස්නාහිර පළාත් සභා ඡන්දවලින් ආරම්භ වුණු ආණ්ඩුවේ පසුබෑම තවත් වටයකින් වැඩිවෙනවා. මේ පළාත තුළ ආණ්ඩුවට විශාල ජනතා විරෝධයක්, ජනතා අප්‍රසාදයක් තියෙනවා. ඒ නිසා ආණ්ඩුව මෙහිදී විශාල ලෙස පසුබෑමකට ලක්වෙනවා. එමඟම ජ.වි.පෙ.ට ඡන්ද හා මන්ත්‍රීධූර ප්‍රමාණය වැඩිවීමද ස්ථිර ලෙසම සිදුවෙනවා. බස්නාහිර හා දකුණු පළාත් සභා ඡන්දයෙන් ජ.වි.පෙ. ලද ජයග්‍රහණ මෙම පළාත් සභා ඡන්දයෙන් තවත් වැඩිවේවි. **ආණ්ඩුව මේ පළාත් සභා ඡන්දයට ආවේ අනෙක් පළාත් සභා දිනාගෙන දිනාගෙන ඇවිල්ල අන්තිම හයේ පාර ගහලා මැච් එක ජයග්‍රහණයෙන් අවසන් කිරීමට හිතාගෙනයි. ඒත් දකුණෙන් හා බස්නාහිරෙන් ආණ්ඩුවේ විකට් ගැලවුණා. ඒ නිසා ඌව පළාත් සභා ඡන්දය ආණ්ඩුව තම ජයග්‍රාහී හයේ පාර ගහන ඡන්දය වෙනුවට ආණ්ඩුවේ විකට් එක කැඩෙන ඡන්දය බවට පත්වෙලා තිබෙන බව පේනවා.**

> "මෙම ඒකාධිපති පාලනයත් මෙවැනි ඒකාධිපතියන් බිහිකරන බංකොලොත් ධනේශ්වර ක්‍රමයත් දෙකම පැරදවිය හැකි සැබෑ ජනතා ව්‍යාපාරයක් ගොඩනැගිය යුතු වෙනවා."

*නියමුවා:- මේ පළාත් සභා ඡන්දය අවසන්වූ වහාම ඉක්මන් ජනාධිපතිවරණයකට යාමට ආණ්ඩුව සූදානම් වන බව පේනවා. ඒ පිළිබඳ ඔබේ පක්ෂයේ අදහස කුමක්ද?*


*ටිල්වින් සිල්වා සහෝදරයා:-*

මහින්ද රාජපක්ෂ මහතා ඉක්මන් ජනාධිපතිවරණයකින් තුන්වන වතාවටත් බලයට ඒම සඳහා කටයුතු කරන බව අපත් දකිනවා. මෙහිදී සැලකිය යුතු කරුණු කිහිපයක් තියෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට වසර 06ක් බලයේ සිටීමට හැකියාව තිබියදී වසර 04කින් ඡන්දයක් තියන්නේ ඇයි? ඒ, පැහැදිලිවම ඔහුගේ බලය අඩුවෙමින් තිබෙන නිසා. ආණ්ඩුවට එරෙහි ජනතා විරෝධය වැඩිවෙමින් තිබෙන නිසා. තවත් කල් යනවිට පරාජයට පත්වේවි යයි ඇති බිය නිසා. ඉන් කියවෙන්නේ ආණ්ඩුවේ නායකයින්ට පරාජයේ බිය දැනී ඇති බවයි.

අනෙක් අතට රාජපක්ෂ ජනාධිපතිවරයා තුන්වන වරටත් තරඟ කරන ඉදිරි ජනාධිපතිවරණය සදාචාරමය හා නෛතික ගැටලු ගණනාවක් සහිත එකක්. රාජපක්ෂ ජනාධිපතිවරයාට තුන්වන වරටත් තරඟ වැදීමට හැකි වන සේ 2010දී සම්මත කරගත් 18වැනි ව්‍යවස්ථා සංශෝධනය සදාචාරමය වශයෙන් ගත්විට බල රහිතයි. 2010 මහ මැතිවරණයේදී සන්ධානයට ජන වරමකින් තුනෙන් දෙකේ බලයක් ලැබුණේ නැහැ. පාර්ලිමේන්තුවේ තුනේ දෙකේ බලය ඔවුන් හදාගත්තේ අල්ලස් දී ගත්තු එ.ජා.ප. හා මු.කො. මන්ත්‍රීවරුන්ගෙන්. ඒ නිසා 18වැනි සංශෝධනයට සැබෑ ජනවරමක් නැහැ. එය සදාචාර විරෝධීයි. ඊට අමතරව නීති ක්ෂේත්‍රයේ සමහර අයගේ මතයට අනුව 18වැනි සංශෝධනයට අනුව වුවත් රාජපක්ෂ ජනාධිපතිවරයාට තුන්වන වරට ඡන්දය ඉල්ලන්න හැකියාව නැති බව කියනවා. කොහොම වුණත් සදාචාරය, නීතිය පසෙක තබා මහින්ද රාජපක්ෂ මහතා මේ සූදානම් වන්නේ, සිය ඒකාධිපති පවුල් පාලනය තව තවත් තහවුරු කරගැනීමට බවත්, මේ ඉක්මන් ජනාධිපතිවරණය ඒ සඳහා බවත් අපි දකිනවා.

*නියමුවා:- මෙම තත්වය පැරදවීම සඳහා ජනතා විමුක්ති පෙරමුණට තිබෙන වැඩපිළිවෙළ හෝ ක්‍රියාමාර්ග මොනවාද?*

15වැනි පිටුවට





# තරුණ

# ශීතන්න

## සාහිත කෙතක් වී කුමට

පයට මිරිවැඩි නැතිව
ගතට සුසිනිඳු සලු ඇතිව
හිස් අහස දෙස
බලා හිඳිනා
අපේ කාලයේ
මිනිස් ජීවිත
හෙළන කඳුළින්
වැසි වැටෙන දා
සාහිත කෙතක් වී කුමට
එදුක් කඳුළින් ගොයම් බරවන....

## සිත්තමක කතාව



Life
of modern people

# YES WE CAN

## ගෝර්කිගේ 'අම්මා' හමුවෙමු

අපේ රටේ සමාජය අම්මා ගැන අලුතින් කථා කිරීමට පටන් ගෙන තිබේ. තවත් පිරිසක් ජීවිතේ කොහේදී හෝ තමන්ට මගහැරුණු අම්මා සොයමින් සිටිති. මේ ලෝකයේ උපන් සෑම දරුවෙකුටම අම්මා කෙනෙක් සිටී. ඒ අම්මාවරුන් විවිධාකාරය. බොහෝ අම්මාවරුන් ජීවිතයේ අපමණ දුක් ගැහැට විඳ තම දරුවන් උස් මහත් කරති. ඒ තම දරුවා 'ලොකු මිනිසෙකු' කිරීමටය. ඒ අතර තවත් අම්මා කෙනෙක් තම දරුවාගේ කුසගින්න ඉවසිය නොහැකි තැන දරුවා ගඟට විසි කරන්නීය. නැතහොත් මහමග අතරමංකර යන්නීය. ලෝකයේ තවත් දරුවන් පිරිසක් තම මව කවුරුන්දැයි නොහඳුනති. ඒ ඔවුන් උපදින විටම අම්මාවරුන් ඔවුන් හැරගොස් හෙයිනි. ඒ දරු සෙනෙහසේ අඩුවක් නිසා නොව බඩගින්නේ දරුණුකම නිසාවෙනි.

මේ අතර අම්මා ගැන වෙනස් සමාජ කතිකාවතක් පසුගියදා අසන්නට ලැබුණි. උපුල් ශාන්ත සන්නස්ගලයන් ඔහු විසින් රචිත 'අම්මා' නවකථාව ජනගත කළ වේදිකාවේදී මේ කතිකාවත අසන්නට ලැබුණේ ලාල් කාන්ත සහෝදරයා වෙතිනි. ඒ මෙසේය.

''මම හිතන්නෙ මේ පොතේ මුල සිට අග දක්වාම කියවෙන්නේ බඩගින්නේ කතාව. දුප්පත්කමේ කතාව. දරිද්‍රතාවයේ කතාවත් මේක ඇතුළෙ තියෙනවා. ගම්බද 60,70,80 දශකවල, ඒ අපි පුංචිකාලෙ. ඒ අවදියේ බඩගින්න, කුසගින්න ගැන කියවෙච්ච කතාව මේ පොතේ අන්තර්ගතය වෙලා තියෙන්නෙ කියල මට හිතෙනවා. මේ අම්ම ගැන කියැවෙන කතාවද, එහෙම නැත්නම් අපේ රටේ එක ඓතිහාසික පරිච්ඡේදයක්, ඉතිහාසයේ එක පරිච්ඡේදයක් ගැන ලියවෙච්ච කතාවකද කියල හිතෙනවා.''

''මගේ දුවගෙ අම්මත් පාන්දර හතරට නැගිටින්නෙ. රස්සාවට යන්න. හැමදාමත්, අවුරුදු ගාණක් උදේ හතරට නැගිටිනවා. එයා ගුරුවරියක්. එයාගෙ පඩිය මදි ජීවත් වෙන්න. එයා මේ දුක දරාගෙන වැඩ කරනවා. මං කොහේ හරි රට වටේ යනකොට අපේ සහෝදර සහෝදරියන් දෙන මොනවහරි හාල් ටිකක්, පොල් ටිකක් ආදී වශයෙන් විවිධ දේවල් ගෙදෙට්ට ගෙනත් දානවා. ඒකෙන් වැඩේ හරියන්නෙ නෑ. එතකොට මේ අම්ම කොළඹ ඉන්නෙ. අර අම්මට වෙනස් තමයි. නමුත් දුක් විඳිනවා තවමත්.''

''මෙතැන සෞන්දර්යාත්මක ප්‍රතිනිර්මාණයක් තියෙනවා. මේකෙ කලාව තියෙනවා. හැබැයි මැක්සිම් ගෝර්කිගේ අම්මා මේකෙන් බලාපොරොත්තු වෙන්නෙ නෑ. මැක්සිම් ගෝර්කිගේ අම්මා මේකෙ නෑ. මැක්සිම් ගෝර්කිගේ අම්මා තියෙන කටුකත්වයට යට වෙමින් ඒකට මුහුණ දෙමින්, ඒකත් එක්ක පොරබදිමින් ඉන්න අම්මා කෙනෙක්. අපේ අම්මලා ඔක්කොම මේ කටුක යථාර්ථ ආර්ථිකය ඇතුළේ. මෙතැන තියෙන ආර්ථික අර්බුදය ආර්ථික ප්‍රශ්නයක්. ඒක පතුලේ, ගැඹුරේ තියෙන්නේ. අම්මට සාධාරණය කවදාවත් ඉටු කරන්න බෑ මේ ආර්ථික ප්‍රශ්නයට උත්තර හොයන්නෙ නැතිව. මේවට අපිට අඬන්න පුළුවන්, වැළපෙන්න පුළුවන්. කේන්ති යන්න පුළුවන්. ඉන් එහා වෙන උත්තර නෑ. ගේ ඇතුළෙ තියෙන ප්‍රශ්න එළියට දාන්නෙ නැතිව මේක විසඳන්න බෑ. ගේ ඇතුළෙ තියෙන ෆැක්ටරි තුන නිසා මොනතරම් දුක් විඳිනවද? රෙදි හෝදන-රෙදි මදින ෆැක්ටරිය, වළං පිඟන් හෝදන-උයන පිහන ෆැක්ටරිය, දරුවො බලාගන්න-කවන පොවන ෆැක්ටරිය කියල ඒ අයට ෆැක්ටරි තුනක් තියෙනවනෙ. මේ ෆැක්ටරි තුන එළියට ගත්ත දවසට සෑහෙන විමුක්තියක් අපට හොයා ගන්න පුළුවන් වෙයි.''

ගෝර්කිගේ 'අම්මා' අපට ඒ විමුක්තියේ මග පෙන්වූ අම්මාය. ඈ අපේ අම්මලාද ඇතුළු සමස්ත පීඩිත අම්මලා වෙනුවෙන් අරගල කළ අම්මාය. ඈ තම පුතා ගත් සමාජ විප්ලවීය ගමන් මග වටහාගෙන අරගලය උදෙසා සටන් කළ, තම පුතුගේ සමාජ විප්ලවීය ගමන් මගට ශක්තියක් වූ පාවෙල්ගේ අම්මාය. 'ලොකු මිනිසුන්'' නොව 'හොඳ මිනිසුන්' විය යුතු බව අපට කියා දුන් අම්මාය. ඒ සියල්ලටමත් වඩා අනාගත පරපුරකට විප්ලවයේ මඟ කියාදුන් අම්මාය. අප සැම ගෝර්කිගේ 'අම්මා' හමුවිය යුත්තේ එහෙයිනි.

## ආදරණීය මහේල...



ලාංකේය ක්‍රිකට් ක්‍රීඩා ක්ෂේත්‍රයේ නොමියෙන නමක් තැබූ ඔබ මේ වන විට ජාත්‍යන්තර ටෙස්ට් ක්‍රිකට් පිටියට සමුදී හමාරය. එමෙන්ම එළැඹෙන ලෝක කුසලාන තරඟාවලියෙන් අනතුරුව එක් දින තරඟ බිමෙන්ද සමු ගන්නා බව මේ වන විටත් ඔබ ප්‍රකාශයට පත් කොට ඇත. ක්‍රීඩාව තුළ ඔබ දැක්වූ ප්‍රතිභාව මෙන්ම මහත්මා ගුණයද අපි අගය කරන්නෙමු. ඒ ක්‍රීඩා කෞශල්‍යයත්, මහත්මා ගුණයත් වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය ලෙස අපි ඔබට ආචාර කරන්නෙමු. ඔබේ ඉදිරි දිවියේදී ඒ මහත්මා ගුණය එලෙසින්ම ආරක්ෂා කර ගනු ඇතැයි ක්‍රීඩා ලෝලීන් වශයෙන් අපි උදෙක්ම බලාපොරොත්තු වන්නෙමු. මන්දයත් ඉතිහාසය ඊට සාක්ෂි දරන නිසාවෙනි. ඔබට ජය!

# JUST A MOVEMENT

## වාරියපොළ කෙලී කියන කතාව



වාරියපොළ බස්නැවතුම් පලේදී තරුණියක විසින් තරුණයෙකුට කරන පහරදීම් සිද්ධිය පසුගියදා ජනමාධ්‍ය තුළ ආන්දෝලනයක් ඇති කළේය. මේ සටහන තබන විට සිදුවීම දුර දිග ගොස් අදාල තරුණිය පොලීසියේ රඳවාගෙන ඇප මත නිදහස් කර තිබේ.

මේ සිදුවීම වීඩියෝ කර තිබූ අයෙක් මෙය සමාජ ජාලා වෙබ් අඩවිවලට නිකුත් කර තිබුණි. එම වීඩියෝවේ මේ තරුණිය තරුණයාට බැනවදින්නේ තමාට අපහාස කළ බව කියමිනි. ඇය දිගටම තරුණයාගේ කම්මුලටත් හිසටත් අතින් පහර දෙන්නේ අවට පිරිස් බලා සිටියදීය. ඒ අතර තරුණයා කිසිදු ප්‍රතිප්‍රහාරයකට නොගොස් පහර කමින් සමාව ඉල්ලන අයුරුද පෙනේ.

මේ සිදුවීම මෙතරම් ජනප්‍රිය වූයේ ඇයිද යන්න කතා බහ කිරීම වටී.

සාමාන්‍යයෙන් අපට වැඩිපුර අසන්නට දකින්නට ලැබෙන්නේ පිරිමින් විසින් ගැහැණුන්ට පහරදීම්ය. ප්‍රේම සම්බන්ධතා සම්බන්ධවද, පවුල් ජීවිත තුළද මෙය අප සමාජයේ සුලභ අත්දැකීමකි. එය එසේ වන්නේ අප ජීවත්වන්නේ පූරුෂාධිපත්‍ය මුල් වූ සමාජ වටපිටාවක නිසාය. සමාජ සම්මතය වී ඇත්තේ ගැහැණිය පිරිමියාට අවනත විය යුතුය යන්නයි. බිරිඳ හෝ ප්‍රේමවන්තිය හැසිරිය යුත්තේ ස්වාමියන්ගේ හෝ ප්‍රේමවන්තයාගේ අභිමතයට අනුවය. එසේ නොවුව හොත් ඇය පිරිමියාගෙන් දඬුවම් ලැබීමට සුදුසුකම් ලබන්නීය. එවැනි සමාජ රටාවක තරුණියෙකු තරුණයකුට පහරදීම සම්මතයට පටහැණිය. එවිට එය අවධානය දිනාගන්නා ප්‍රවෘත්තියක් බවට පත් වේ.

සිදුවීම පැත්තෙන් බලන විට මේ පහර කන තරුණයා ආර්ථික අතින් දුප්පත් දමිළ තරුණයෙකි. තරුණියද ප්‍රදේශයේම පදිංචිකාරියක නිසා ඒ බව දැනගෙනම මෙම පහරදීමට ප්‍රවේශ වූවා විය යුතුය. තරුණයාගේ දෙමළකමත්, දුප්පත්කමත් ඇයව පහරදීමට පෙළඹෙව්වා විය යුතුය. මන්දයත් ඇයට විහිළු හෝ අපහාස කරන සියලු තරුණයින්ට ඇය මෙසේ පහරදෙනවා විය නොහැකි නිසාය. කෙසේ නමුත් ඇයද ඇඟලුම් කම්හල් සේවිකාවක් නිසා ඇයද විශාල වත්පොහොසත්කම් සහිත කෙනෙකු යැයි නොහැඟේ.

අප ජීවත් වන්නේ ප්‍රධාන වශයෙන්ම ධනය හා බලය මත පීඩිතයන් හා පීඩකයන් ලෙස බෙදුණු සමාජ පරිසරයක් තුළය. එසේම පසුගාමී වැඩවසම් ලක්ෂණද සහිත ධනවාදයත් සහිත රටකය. ඒවාට ජාතිවාදය හා පුරුෂාධිපත්‍යද එක් වූ විට නිර්මාණය වන්නේ සම්පූර්ණයෙන්ම විකෘතියකි. එවැනි සමාජ වටපිටාවක අනෙකා තේරුම් ගැනීම, වෙනස් සංස්කෘතීන් වටහා ගැනීම, මානව දයාව, සහෝදරත්වය වෙනුවට පවතින්නේ කුහකකම්, ඊර්ෂ්‍යාව, වෛරය, හා අධිපති මානසිකත්වයත්ය. නැතහොත් "මං පොර" මානසිකත්වයත්ය. මෙවැනි අංගවිකල සමාජ වටපිටාවක ඊට වැඩි දේවල් බලාපොරොත්තු විය නොහැකිය.

සිදුවීමෙන් පසු තරුණියගෙන් පළිගැනීමට විවිධ ප්‍රකාශ නිකුත් වීමත් ඇයට බැණවැදීමත්, තරුණයා රෝහල් ගත වී තරුණිය අත්අඩංගුවට ගැනීමත් ආදී කතා දිගහැරෙමින් තිබේ.

සැබැවින්ම කළ යුතුව ඇත්තේ අප ජීවත්වන්නේ කෙතරම් දුෂ්ට සමාජයක දැයි තේරුම් ගැනීමයි.

සමාජ, පරිසරය යහපත් නම් එහි ජීවත්වන මිනිසුන්ද යහපත් වන්නේය. ඒ නිසා යහපත් මිනිසුන් තැනීමට ආදර්ශයන් පමණක් ප්‍රමාණවත් නොවේ. සමස්ත සමාජයම යහපත් කළ යුතුය.

# පොදු අපේක්ෂක සංවාදය තුළ සැඟවී යන ජනතාවගේ සැබෑ ප්‍රශ්න



"මධ්‍යතනවාදය හා සමඟ සසඳන කළ ධනපති ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රගතිශීලී විය. ඒ අනුව එයින් ප්‍රයෝජන ගැනීම කළ යුත්තක් විය. නමුත් දැන් එය කම්කරු පංතියේ වුවමනාවන්ට සෑහෙන්නේ නැත. දැන් අපි ආපසු බලනවා වෙනුවට ඉදිරිය බැලිය යුත්තෙමු. ධනපති ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය ආදේශ කිරීමට බලාපොරොත්තු විය යුත්තෙමු."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**09 වෙළුම**
**45 - පිටුව**

ඉක්මන් ජනාධිපතිවරණයක් සඳහා මහින්ද රාජපක්ෂ පාලනය සූදානම් වීමත් එම ජනාධිපතිවරණයෙන් මහින්ද පරදා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කිරීම පිළිබඳව සංවාදයක් විවරවෙමින් පැවතීමත් තුළ රටත් ජනතාවත් මුහුණපා ඇති සැබෑ ප්‍රශ්න යළිත් සැඟවී යෑමට පටන් ගෙන තිබේ. මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව "සියලු බලවේග" එක්කර ගත් පෙනුමෙන් පොදු ලෙස පෙනෙන එහෙත් හරයෙන් ධනවාදී දේශපාලන ව්‍යාපාරයක් සඳහා විවිධ කොටස් වෙන් වෙන්වත්, එක් තැනෙක සිටත් කටයුතු කරන ආකාරය, හඬනගන ආකාරය මේ දිනවල සුලභ දසුනක් වී තිබේ. ඔවුන් සියලු දෙනාම ඔවුන්ට පහසු හා සියලු දෙනා එක්කර ගත හැකි යැයි සිතන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සටන් පාඨය මූලික තේමා පාඨය බවට පත්කර ගෙන තිබේ.

ප්‍රජාතන්ත්‍රවාදය, එය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය වුවද, ජනතාවට අහිමි වී තිබේනම් එය දිනාගත යුතුය. එය අහිමි වෙමින් තිබේ නම් රැකගත යුතුය. ඒ පිළිබඳ විවාදයක් නැත. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය දිනාගත් පමණින් සියල්ල විසඳෙන්නේ නැත. එය ඇලඩින්ගේ පුදුම පහන නොවේ. අනෙක් අතට මහින්ද රාජපක්ෂට පමණක් නොව ධනවාදය කරපින්නාගෙන එයම පවත්වාගෙන යන කුමන පාලනයකට වුවද, කුමන පාලකයෙකුට වුවද, සැබෑ ලෙසම ප්‍රජාතන්ත්‍රවාදය ලබා දීමටද, නොහැකිය. ඒ, එය තවදුරටත් ඔවුනගේ කැමැත්ත හෝ අකමැත්ත පිළිබඳ ප්‍රශ්නයක් නොව අර්බුදයට පත් බංකොලොත්, පසුගාමී ධනවාදයට එවැන්නක් ලබා දිය නොහැකි නිසාය. එබැවින් ජනතාව ධනවාදී කුණුවල තුළම තබා ගැනීමට, එයට සුදුහුණු පිරියම් කිරීමට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සටන්පාඨ යොදාගන්නේ නම් එය වංචාවක් හා රැවටීමක්ම වේ.

ලෝකයේ බොහෝ රටවල මෙන්ම ලංකාවේද ධනේශ්වර පංතිය නියෝජනය කරන දේශපාලන පක්ෂ, සංවිධාන හා පුද්ගලයෝ හැම විටකම තමන් වෙත බලය ලබා ගැනීමට පහසු මාවත් හා සටන්පාඨ සෙවූහ. එහිදී ප්‍රජාතන්ත්‍රවාදය ඔවුන්ට ඇති පහසු හා ලෙහෙසි සටන්පාඨය විය. ඒ, දැන් හාල් සේරු දෙක, ඇට අට වැනි සරල පොරොන්දු වලංගු නොවන බැවින් හා ජනතාව සැබෑ ලෙසම ප්‍රජාතන්ත්‍රවිරෝධී පාලනයෙන් බැට කන නිසාය. එහෙත් ප්‍රශ්නය වන්නේ, දැන් යළිත් ප්‍රජාතන්ත්‍රවාදයට පණ දීමට ඉදිරිපත් වී සිටින එම සටන් පාඨයට මුවා වී බලය ලබා ගැනීමේ 

කෑදර කමින් පෙළෙන බොහෝ දෙනා ප්‍රජාත්නත්‍රවාදයේ මළගම වෙනුවෙන් වැඩකළ අය වීමය. 1978 දී විධායක ජනාධිපති ක්‍රමය සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කළ, එයට අත එසවූ එය යොදාගෙන ජනතාව මර්දනය කළ අය විධායක ක්‍රමය අහෝසි කිරීමට, ප්‍රජාතන්ත්‍රවාදය දීමට, පොරොන්දු දෙන විට ඒ පිළිබඳ දෙවරක් නොව තුන් හතර වරක්ම සිතා බැලිය යුතුය. එපමණක් නොව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා 18වැනි සංශෝධනය ගෙනා විට ඊට සහය පළ කළ අයම දැන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කිරීම විහිළුවකට වඩා එහා ගිය විගඩමක් වන්නේය.

රටකට ජනතාවකට ප්‍රජාතන්ත්‍රවාදය අත්‍යාවශ්‍යය. එහෙත් එය තවදුරටත් ධනපති පංතියට හෝ ධනපති ආණ්ඩුවකට ධනපති ක්‍රමය තුළම ලබා දිය නොහැකිය. ධනවාදයේ ආරම්භක උත්පාත අවධියේදී පවා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පීඩිත පංතීන්ට යථාර්ථයක් වූයේ නැත. ඒ පිළිබඳව වරක් ලෙනින් පැවසුවේ මෙසේය. "**මධ්‍යතනවාදය සමග සංසංදනය කරන කළ ධනපති ප්‍රජාතන්ත්‍රවාදයෙන් මහා ඓතිහාසික ඉදිරිග මනක් සලකුණුවන නමුත්, එය කවදත් සීමාකළ, කප්පාදු කළ ව්‍යාජ හා වංචනික ප්‍රජාතන්ත්‍රවාදයක්ද, ධනපතියන්ට පාරාදීසයක් හා සූරාකනු ලබන්නන්ට, දුප්පතුන්ට උගුලක් හා රැවටිල්ලක්ද වූයේය. ධනපති ක්‍රමය යටතේ එය එසේම පැවතීම නොවැළැක්විය හැකිය. (ලෙනින්, තෝරාගත් කෘති, 09 වෙළුම, 23 පිටුව)**

ලෙනින් පැවසූ ලෙස ධනවාදයේ උත්පාත ප්‍රගතිශීලී අවධියේදී පවා ධනපති ප්‍රජාතන්ත්‍රවාදය පීඩිතයන්ට රැවටිල්ලක් හා මායාවක් වූයේනම් දැන් ධනවාදය යල් පැන ගිය මෙම යුගයේ ධනපති පංතියට ප්‍රජාතන්ත්‍රවාදී වීමට හෝ එය ලබා දීමට කොහෙත්ම හැකියාවක් නැත.

අනෙක් අතට මේ මොහොතේ ලාංකේය ජනතාව මුහුණපා ඇති සැබෑ ගැටලු රැසකි. ධනවාදය මුහුණදී ඇති විශාලතම ආර්ථික අර්බුදය

> විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට හා සැබෑ ලෙසම ප්‍රජාතන්ත්‍රවාදය මේ බිම තුළ තහවරු කිරීමට නම්, සමාජය වෙත ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණය, සාමය හා සමගිය ඇතිකිරීමට නම් වත්මන් ධනවාදය පරදා නව සමාජයක් නිර්මාණය කරන දේශපාලන ගමනකට මුලපිරිය යුතුය.

නිසා අයිතීන් අහිමිව, සහන නොමැතිව, එදා වේල සොයා ගැනීමට නොහැකිව ඔවුහු දුක් විඳිති. නිසි ප්‍රතිකාර නොමැතිව හෝ ඒ සඳහා මුදල් නොමැතිව රෝගීහු පීඩා විඳිති; මිය යති. නිදහස් අධ්‍යාපනය බරක් බවට පත්ව අධ්‍යාපනයෙන් පිටමං වන සිසුන් ප්‍රමාණය වැඩිවෙමින් තිබේ. අපරාධ, මත්කුඩු වැඩිවීම නිසාද, පොදු ජනතාව පීඩාවට පත්ව සිටිති. ඒ අනුව බලය හොබවන අය සිදුකරන බලහත්කාරය, වංචා දූෂණ හොරකම් ආදිය නිසාද, ධනවාදී පාලනයේ අරාජිකත්වය නිසාද පොදු ජනතාව පීඩාවට පත්ව සිටිති. අනෙක් අතට ජාතිවාදය හා ආගම්වාදය ඇවිළවීම නිසා එම ගැටලුවලින්ද ජනතාව පීඩාවට පත්ව සිටිති. ජාතික සමගිය බිඳවැටී තිබේ. දැන් අවශ්‍යව ඇත්තේ, මෙම දැවෙන සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ප්‍රශ්නවලටද විසඳුම් ලබා දෙමින් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කළ හැකි පාලනයකි; සමාජ ක්‍රමයකි. එහිදී ධනවාදය, එහි සුක්කානම කා අත තිබුණත් ජනතා අපේක්ෂා ඉටුකිරීමට අසමත්ය.

මේ තත්වය තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සටන් පාඨය තිබිය යුත්තේ කොතැනද? කා අතද? සැබැවින්ම තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය යනු පීඩිත පොදු ජනතාව රැවටීම සඳහා ධනේශ්වර හා සුළු ධනේශ්වර කණ්ඩායම් අත පවතින මෙවලමක් විය යුතු නැත. ඒ වෙනුවට ධනවාදය පරදා නව සමාජයක් ගොඩනගන සටන සඳහා ජනතාව දැනුවත් කරන, සංවිධානය කරන පොදුජන ව්‍යාපාරයක් අත, වමේ ව්‍යාපාරය අත තිබිය යුතු, ඔවුන් විසින් අත්පත් කර ගත යුතු සටන් පාඨයකි. දැන් ප්‍රජාතන්ත්‍රවාදය තිබිය යුතු වන්නේ, ධනපති ක්‍රමය රකින ධනපති කණ්ඩායම්වලට නොව ධනවාදය පැරදවීම සඳහා සටන් කරන පීඩිත පංති හා ප්‍රගතිශීලී බලවේග අතය. දැන් පොදු ජනතාව විශ්වාසය තැබිය යුත්තේ, අනෙකුත් සමාජ ප්‍රශ්නවලින් වියෝකර, වෙන්කරගත් ප්‍රජාතන්ත්‍රවාදයේ සටන්පාඨය ගැන නොව සියලු සමාජ ප්‍රශ්න සමග ඒකාබද්ධ කරගත් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ සටන් පාඨය වෙතය.

ධනවාදයේ මළගිය අවතාරවලට ප්‍රජාතන්ත්‍රවාදය හරහා යළි පණ දීමට දරන වෑයම හොඳින් හඳුනාගෙන එය වහාම පරාජය කළ යුතුව තිබේ. ධනවාදය තුළ මළගිය පරණ අවතාර යළි කැඳවමින්, ඒවාට අලුත් ඇඳුම් අන්දවා, අලුත් මුහුණු පළඳවා කරළියට ගෙන එමින් තිබෙන්නේ අර්බුදයට ගොස් ඇති ධනපති ක්‍රමය රැක ගැනීම සඳහා මිස අන් යමකට නොවේ. ඉතිහාසයක් පුරා නැටූ මේ නාඩගමට අවසන් තිත තැබීමට දැන් අවසන් කාලය එළඹ තිබේ. අපේ පංතියට ප්‍රජාතන්ත්‍රවාදය අවශ්‍ය වන්නේ ඒ සඳහාය. ඒ සඳහා දැනුවත් වීමට හා දැනුවත් කිරීමටය. ජනතාව සංවිධානය කිරීමටය. ඒ නිසාම කොතරම් සුන්දර වුවත්, පහසු ලෙස පෙනුණත්, සාධාරණ ලෙස පෙනුණත් 'විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරමු' යයි බෙරිහන් දෙන කපටි ආරක්ෂකයින්ගේ සැබෑ ස්වරූපය හඳුනාගත යුතුය.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට හා සැබෑ ලෙසම ප්‍රජාතන්ත්‍රවාදය මේ බිම තුළ තහවරු කිරීමට නම්, සමාජය වෙත ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණය, සාමය හා සමගිය ඇතිකිරීමට නම් වත්මන් ධනවාදය පරදා නව සමාජයක් නිර්මාණය කරන දේශපාලන ගමනකට මුලපිරිය යුතුය. ඒ සඳහා වන ජනතා ව්‍යාපාරයක් නිර්මාණය විය යුතුය. නිර්මාණය කළ යුතුය. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ හා ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමේ සටන් පාඨයේ අයිතිය සතු විය යුත්තේ, එම ජනතා ව්‍යාපාරයටය. එසේ නොවනතාක් මෙය රැවටිල්ලට මඟක්ම වනු ඇත.

මේ මොහොතේ රට තුළ සිට සැබෑ ජනතාවාදී, ප්‍රගතිශීලී, දේශප්‍රේමී ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂා කරන බලවේගයන්ගේ හා පුද්ගලයන්ගේ වගකීම වන්නේ කුමක්ද? ධනවාදයේ මළගිය අවතාරවලට පණ දීමේ ව්‍යාපාරවලින් වෙනස්ව නව ජයග්‍රාහී දේශපාලන ගමනක් සඳහා නව දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට දායක වීමය. පෙරමුණ ගැනීමය. ඒ සඳහා තවදුරටත් දෙගෙඩියාවක් තිබිය යුතු නැත. ලෙනින් වරක් කී පරිදි "**මළවුන්ට ඔවුන්ගේ මිනී වළලා ගැනීමට ඉඩ හරිමු. වැනෙන්නන්ට සහය වීමට නම් පළමුව ඔබ නොවැනී සිටිය යුතුය.**"

# ඌවට ජ.වි.පෙ.න්





ආණ්ඩුව විසින් කිරා මැන බලා සලාක ක්‍රමයට පැවැත් වූ මැතිවරණ රැල්ලේ අවසන් මැතිවරණය වන්නේ ඌව පළාත් සභා මැතිවරණයයි. බස්නාහිරින් සිදුවූ ආණ්ඩුවේ පසුබෑම ඌවෙහි සිදුනොවීමට ආණ්ඩුව උපරිම වශයෙන් රාජ්‍ය බලය භාවිතා කරමින් සිටියි. ආණ්ඩුවේ ඇතැම් පක්ෂ පක්ෂ නාම යෝජනා බාර දීමට ගොස් රටම හිනැස්සූ අතර ඒ මොණරාගලින් සන්ධානයෙන්ද බදුල්ලෙන් තනිවමද යනාදී වශයෙනි. එ.ජා.ප.යද අභ්‍යන්තර ගැටුම් රාශියක් මධ්‍යයේ නාම යෝජනා භාර දුන් අතර මේ සියලු තත්වයන් මැද ජ.වි.පෙ. ජනතාවට සැබෑවටම ආදරය කරන අපේක්ෂකයින් ගෙන් සමන්විත නාම යෝජනා පත්‍ර මොණරාගල සහ බදුල්ල යන දිස්ත්‍රික්ක සඳහා ඉදිරිපත් කරන ලදී.

පසුගිය අගොස්තු 05 වැනිදා නාම යෝජනා භාර දීම සිදුවූ අතර බදුල්ල දිස්ත්‍රික්කය සඳහා නාම යෝජනා භාරදීම ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් ඌව පළාත් ජ.වි.පෙ. නායක සමන්ත විද්‍යාරත්න , ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා ඇතුළු පිරිසකගේ සහභාගිත්වයෙන් බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සිදු කෙරිණි. මොණරාගල දිස්ත්‍රික්කය සඳහා නාම යෝජනා භාරදීම ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් මොණරාගල දිස්ත්‍රික් කණ්ඩායම් නායක ඩී.එම්. ජයවර්ධන සහෝදරයා ඇතුළු පිරිසකගේ සහභාගිත්වයෙන් මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සිදුකෙරිණි.

# 'මැරවරණයට' එරෙහිව ජනතාව රොද බඳිති



ආණ්ඩුව ඌව පළාත් සභාව හුදකලා කර මැතිවරණය පැවැත්වීමට තීරණය කරනු ලැබුවේ ඌවෙන් ඉහළ ඡන්ද ප්‍රතිශතයක් ලබා එම ජයග්‍රහණයත් සමග ජනාධිපතිවරණයකට යෑමටය. එහෙත් මැතිවරණය සදහා නාම යෝජනා භාර දී සති කිහිපයක් යන විට තම සිහිනය බොඳ වෙමින් යන බව ආණ්ඩුවට වැටහී තිබේ. එනිසාම ආණ්ඩුව එක අතකින් භාණ්ඩ බෙදීමේ දන්සැල්ද අනික් අතින් ප්‍රචණ්ඩත්වයද මුදා හරිමින් මැතිවරණ ව්‍යාපාරයට අවතීරණ වී තිබේ. විශේෂයෙන් මොණරාගල දිස්ත්‍රික්කය තුළ ප්‍රචණ්ඩත්වය උපරිම අන්දමින් ක්‍රියාත්මක වන අතර ඒ පිටුපස සිටිනුයේ මහ ඇමති අපේක්ෂකයා බව පැහැදිලිය. මේ සියලු බාධා කිරීම් මධ්‍යයේ ජ.වි.පෙ. තම ඡන්ද ව්‍යාපාරය ඉතා සාර්ථකව පවත්වාගෙන යමින් සිටින අතර පසුගිය අගෝසතු 26 වෙනිදා අනුර දිසානායක සහෝදරයා සහභාගි අති සාර්ථන ජන හමුවක් මොණරාගල බඩල්කුඹුර වූ නගරයේදි පැවැත්වුණි. මෙහි විශේෂත්වය වන්නේ ජන හමුවට පෙරදා (25) රාත්‍රී එම භූමියට පැමිණි ආණ්ඩුවේ මැර පිරිස් වටපිටාවට වෙඩි තබමින් එම ස්ථානයේ සැරසැලි කටයුතුවල නිරතව සිටි ජ.වි.පෙ. සමාජිකයින්ට පහරදී සැරසිලි සියල්ල විනාශ කර වේදිකාවටද ගිනි තබා තිබීමය. එම බාධා කිරීම් හමුවේ මොණරාගල දිස්ත්‍රික් ජ.වි.පෙ. කණ්ඩායම් නායක ඩී.එම්.ජයවර්ධන සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම ජන හමුව සඳහා පක්ෂ බේදයකින් තොරව විශාල පිරිසක් සහභාගි වී සිටියේ ආණ්ඩුවේ මැර ක්‍රියාවලට එරෙහිවය.

# පලස්තීනයට සහය




මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පලස්තීනයට ඇමරිකන් ඩොලර් මිලියනයක් පරිත්‍යාග කළ බව මාධ්‍ය වාර්තා කර තිබුණි. රටේ දිස්ත්‍රික්ක නවයක ජනතාව වතුර පොදක් නොමැතිව නියගයෙන් පීඩා විදිද්දී, එම ජනතාවට අවම මට්ටමේ වත් ආධාර දෙන වැඩපිළිවෙළක් නොමැති සිටි ආණ්ඩුව පලස්තීනයට ඩොලර් මිලියනයක් පරිත්‍යාග කිරීම පිළිබදව ආණ්ඩුවේ ඇතැම් ඇමතිවරුන් ප්‍රකාශ කර සිටියේ ජනාධිපතිවරයා රාජ්‍යතාන්ත්‍රික ගනුදෙනු පිළිබඳ පරිණත පුද්ගලයෙක් බැවින් එවැනි තීරණයක් ගත් බවය. 'ඇමරිකන් විරෝධී' 'දේශප්‍රේමී' රාජපක්ෂ ආණ්ඩුව ඇමරිකන් ගැති ඊශ්‍රායලය විසින් පලස්තීන ජනතාව ම්ලේච්ඡ ලෙස ඝාතනය කිරීමට එරෙහිව මෙම මිලියනය පරිත්‍යාග කළේයැයි ඇතැමෙකු සිතන්ට පුළුවන. එහෙත් පෙනෙන දේම සත්‍යයයි පිළිනොගෙන එය මදක් විශ්ලේෂණය කර බැලූ විට සැබෑ සත්‍ය සොයා ගත හැකි වනු ඇත. මෙරට පාලනය කරනු ලබන්නේ ජනාධිපතිවරයා සහ ඇමරිකානු පුරවැසිභාවය ලැබූ ඔහුගේ සොහොයුරන් විසින් බව සැවොම දන්නා කරුණකි. මෙරට තුළදී ඇමරිකාවට එරෙහිව බෙරිහන් දුන්නද ඔවුන් එසේ නොවන බව ඇමරිකාව හොඳින් දනී. ඊශ්‍රායලය විසින් පලස්තීනයට එරෙහිව සිදුකරනු ලබන ම්ලේඡ ප්‍රහාරයන්ට එරෙහිව මුස්ලිම් සංවිධානයක් විසින් සූදානම් කළ උද්ඝෝෂණ පාගමන අතර මගදී කඩාකප්පල් කර දැමුවේ ආණ්ඩුවේ බලසේනා විසිනි. මේ සියල්ලෙන් පෙනෙන්නේ, මතුපිටින් පලස්තීනයට සහය දෙන පෙන්වන යටින් ඊශ්‍රායලය ප්‍රමුඛ ඇමරිකාවට සහය දෙන ආණ්ඩුවේ දෙබිඩි පිළිවෙතය.

ආණ්ඩුව මෙසේ දෙබිඩි හැසිරීමක් සිදු කරද්දී ජ.වි.පෙ. නිවැරදි ආස්ථානයක සිටිමින් පලස්තීනයට සහය දීමේ වැඩපිළිවෙළක ජාතිකව මෙන්ම ජාත්‍යන්තරවත් යෙදී සිටී. මෙහි එක් පියවරක් ලෙස පසුගිය අගෝස්තු 08 වැනිදා ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති කාර්යාලය ඉදිරිපිටදී ජ.වි.පෙ. විසින් උද්ඝෝෂණයක් පත්වන ලදී. මේ සඳහා ප්‍රචාරක ලේකම් විජිත හේරත්, දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක, මධ්‍යම කමිටු සාමාජිත නලින්ද ජයතිස්ස යන සහෝදරවරු සහභාගි වූහ. මීට සමාගාමීව අගෝස්තු 09 වෙනිදා ලන්ඩන් නුවරදීද ජ.වි.පෙ. ලංඩන් කමිටුව ප්‍රගතිශීලී සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින සංවිධාන සමග එක්ව පලස්තීනයට සහය පළකරමින් උද්ඝෝෂණයක නිරත විය.

# 'ගොට්ටන්ට' එරෙහිව ජ.වි.පෙ.ට පැමිණිලි

1948 ලැබුණු ඊනියා නිදහසින් පසු ආණ්ඩු පිහිටවූ එ.ජා.ප. මෙන්ම ශ්‍රීලනිප ප්‍රමුඛ හවුල් ආණ්ඩු තුළ දේශපාලන හෙංචයියන්ට රජයේ නොයෙකුත් නිලතල ලබාදීම් සාමාන්‍ය දෙයක් වී තිබුණි. එහෙත් වර්තමානය වන විට ඉතිහාසය තුළ ක්‍රමයෙන් සිදු වූ දේශපාලන පත් කිරීම් ගුණාත්මක වර්ධනයක් අත්පත් කරගනිමින් සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේ උසස් නිලතල සඳහා සුදුසුකම් සපුරා නැති එහෙත් 'රාජපාක්ෂිකයන්ගෙන්' පුරවමින් තිබේ.
අමාත්‍යංශ ලේකම් වරයෙකු වීමට පරිපාලනයේ සේවයේ විභාග ආදිය සමත්ව එම ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිය යුතු වුවත් ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයාට එවැනි සුදුසුකම් නැත යන්න බොහෝදෙනා දන්නා කරුණකි. තවද තානාපති සේවයේ නිලතල දරන්නන් බෙහොමයකගේ 'සුදුසුකම්ද' ජ.වි.පෙ. විසින් මෑතකදී හෙළිදරව් කරන ලදී. මේ අතර ඉදිරි මැතිවරණ ඉලක්ක කරගනිමින් ඇතැම් තීරණාත්මක ආයතනයන්හි ඉහළ තනතුරු සඳහා ආණ්ඩු හිතවාදීන් පත්කිරීමේ වැඩපිළිවෙළක්ද ක්‍රියාත්මක වෙමින් තිබේ. එවන් එක් පත් කිරීමක් පසුගියදා රජයේ මුද්‍රණාලයෙන් වාර්තා විය. එහි සේවකයන් පවසන පරිදි මුද්‍රණාලාධිපති ලෙස එම තනතුර



සඳහා සුදුසුකම් නොමැති එහෙත් රාජපක්ෂවරුන්ට හිතවත්කම් දක්වන පුද්ගලයෙකු පත් කර තිබේ. මැතිවරණ සඳහා ඡන්ද පත්‍රිකා සියල්ල මුද්‍රණය කරනු ලබන්නේ රජයේ මුද්‍රණාලයේ බැවින් එහි මුල් පුටුව සඳහා ආණ්ඩුවේ හිතවතෙකු පත් කිරීම තුළ මැතිවරණ දූෂණ ආදිය සිදුවිය හැකි අතරම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කටයුතුවලට අදාල පෝස්ටර්, පත්‍රිකා ආදිය මුද්‍රණය කිරීම නිසා ආයතනය පාඩු ලබන තත්වයටද පත් විය හැකි බව එහි සේවකයෝ පවසති.
මෙහි ඇති බරපතළ තත්වය සම්බන්ධයෙන් පසුගිය අගෝසතු මස 22වැනිදා රජයේ මුද්‍රණාලයේ වෘත්තිය සමිති එකතුව ජ.වි.පෙ. සමග සාකච්ඡාවක නිරත විය. බත්තරමුල්ල, පැලවත්ත පිහිටි ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී මෙම සාකච්ඡාව පැවැත්වුණු අතර එය සඳහා ජ.වි.පෙ. නියෝජනය කරමින් සෝමවංශ අමරසිංහ, සුනිල් හඳුනනෙත්ති යන සහෝදරවරුද වෘත්තිය සමිති එකමුතුව නියෝජනය කරමින් සරත් ලාල් පෙරේරා, ටී.ටී.තිඹිරිපොල.අසංග සඳරුවන්,ඉසුරු ශ්‍රී සම්පත්,ප්‍රදීප් රාජසූරිය,ජී.ජී.සෙනෙවිරත්න,එස්.අයි.පෙරේරා සහ ලලිත් ඉන්දික යන වෘත්තීය සමිති නියෝජිතවරුද සහභාගි වූහ.

# "යහපාලන" නිරුවත වසා, ජනතාවට පාඩු පටවන කෝප් වාර්තා!



රාජ්‍ය ව්‍යාපාර ආයතන 48ක කටයුතු පිළිබඳව විමර්ශන සිදුකළ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප්) තවත් වාර්තාවක් පසුගිය අගෝස්තු 05 වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් විය. එම වාර්තාවෙන් පෙන්වා දී ඇති මූල්‍ය වංචා, අක්‍රමිකතා ප්‍රමාණය රුපියල් කෝටි 30,000ක පමණ වෙතැයි එහි සභාපති අමාත්‍ය ඩිව් ගුණසේකරම කියා තිබුණද ඒ පිළිබඳව සමාජයේ ඇත්තේ ඇලි-මැලි, කම්මැලි සංවාදයක් පමණි. ඒ තරම් දැවැන්ත මුදල් රාජ්‍ය ආයතනවල දූෂණයට ලක් වුවත් සමාජ කතිකාවක් ඇති නොවෙන්නේ මන්ද? ඒ තරමටම සමාජයේ සංවේදී නහරවැල් හිරිවැටී අවසන්ද? නැතිනම් වෙනත් හේතුවක් මේ සඳහා බලපා තිබේද?

බැලූ බැල්මට රටේ ඇත්තේ රටේ ජනාධිපතිවරයා ගමේ ප්‍රාදේශීය සංවර්ධනයද විමසා බලන රැස්වීම් තබා අඩුපාඩු ප්‍රශ්න කරන තරමේ "යහපාලනයක්ය". ජනාධිපති පාර්ලිමේන්තු සැසිවාරවලටද සහභාගි වෙන්නේ ඒ තරමට යහපාලනයට ලැදි බව පෙන්වීමටය. නමුත්, ඒ සියල්ල ඇත්ත නොව ව්‍යාජ වෙස් ගැනීම බව ජනතාව තේරුම් ගත යුතුව ඇත. පොදු ව්‍යාපාර කාර්ක සභා වාර්තා පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිචාර තේරුම් ගැනීමෙන්ම මේ බව වටහා ගත හැකිය.

2005 දී රාජපක්ෂ චින්තනය පදවි ප්‍රාප්ත වනවිටම පාර්ලිමේන්තුවේ දැවැන්ත ආන්දෝලනයක් සහිතව ඉදිරිපත් වුයේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජේදාස රාජපක්ෂ සභාපති ධුරය දැරූ පොදු ව්‍යාපාර කාරක සභාවේ වාර්තාවය. එය ආන්දෝලනයට තුඩු දුන්නේ රුපියල් කෝටි 15,000ක පමණ මූල්‍ය වංචා ඒ මගින් හෙළිකළ නිසා පමණක් නොවේ. එවකට කලින් ආණ්ඩුවේ කැබිනට් අමාත්‍ය ධුර දැරූ මිලින්ද මොරගොඩ, කරු ජයසූරිය වැනි අයගේ සෘජු සම්බන්ධකම් සහිත ගනුදෙනු එම වාර්තාව මගින් හෙළිකළ නිසාය. මහ බැංකුව සම්බන්ධ කර ගනිමින්ද මොරගොඩ පවුලේ බංකොලොත් මූල්‍ය ආයතනවලට ලබාදුන් ණය සහ ගෙවිය යුතු නොගෙවා පැහැර හරින ලද ණය වාරික-පොලී ගැන එම වාර්තා හෙළි කළේය. ජයසූරිය ගැනද එහෙමය. බ්ලූමැන්ඩල් ඉඩම් ගනුදෙනුව ඇතුළු බොහෝ මතභේදාත්මක ගනුදෙනු ඒ තුළ විය. බලයට ඒමට කෝප් වාර්තාව හොඳ පාරක් කපා දෙන ලදී. නමුත් බලය ලද විගස රාජපක්ෂ චින්තනය ක්‍රියාත්මක වූයේ දූෂිතයින්ට දඬුවම් දීමට නොව ඔවුන් රැකීමටය. දූෂිතයින් හෙළිකළ විජේදාස රාජපක්ෂට විපක්ෂයට යාමට සිදුවිය. දූෂිතයින් ලෙස උසාවියට යා යුතු අයට ඇමතිකම් සහිතව රැකවරණය ලැබුණි. කෝප් වාර්තාව හමස් පෙට්ටියට වැටුණි.

තවත් අවස්ථාවක වි.ජ.මු. ලොකුබණ්ඩාර කථානායක ලෙස සිටියදී විවාද කළ කෝප් වාර්තාවක් අල්ලස් හා දූෂණ කොමිසමට යොමු කර අවශ්‍ය නීතිමය පියවර ගෙන දූෂිතයින් නීතිය හමුවට පමුණුවා පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටද නියෝග කළේය. නමුත් ඒ වැයම එයින්ම අවසන් විය.

සියලුම රාජ්‍ය ආයතන සිය වාර්ෂික ගිණුම් පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනිවාර්යයකි. මුදල් වර්ෂය ඉකුත් වී දින 150ක් යාමට පෙර ඔවුන් එය ඉටු කළ යුතුය. නමුත් මෙවර ඉදිරිපත් කළ ආයතන 48ක විමර්ශනයට අදාලවද, 2011 වසරට අදාල වාර්ෂික වාර්තා 2014 ජුනි දක්වා අවු. 04ක කාලයක් ගතවී තිබුණද පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකල ආයතන ගණන 06කි. ඒ අතර ඉතා විශාල ලෙස පාඩු ලබන ඛනිජ තෙල් නීතිගත සංස්ථාවද වේ. ඊට සමුපකාර තොග වෙළඳ සංස්ථාවද (සතොස) අයත්ය.

> රාජ්‍ය ආයතනවල දූෂණ හෙළිකළත් එම දූෂකයින්ට අදාලව ගත හැකි කිසිදු පියවරක් මේ ධනේශ්වර පාලක පංතියට නොමැත. ධනපති පංතිය තම ධනය රැස්කරන්නේ පිරිසිදු ක්‍රමයකට නොවේ; දූෂණ - අක්‍රමිකතා මගිනි. ධනවාදය දූෂිතයන් රකින්නේය. ඒ නිසාම දූෂිතයෝ ධනපති ක්‍රමය ආරක්ෂා කරති.

2014 ජුනි 30 දක්වා මූල්‍ය වාර්තා ලබා නොදුන් 2012 වසරට අදාලව වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ආයතන ගණන 34කි. ඒ යටතේ නාගරික සංවර්ධන අධිකාරිය (රාජපක්ෂ පවුලේ ලේකම්), ලේක්හවුස් ආයතනය, ලංකා විදුලි බල මණ්ඩලය සහ කොළඹ විශ්ව විද්‍යාලය ඇතුළු ආයතන රැසක් ඒ අතර වෙයි.

රාජ්‍ය මූල්‍ය ආයතන පිළිබඳව කෝප් කමිටුව පසුවට රාජ්‍ය ව්‍යාපාර ආයතනයක් කැඳවන විට, එයට පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂව තෝරා පත් කළ මන්ත්‍රීවරුන් පිරිසකට අමතරව, විගණකාධිපතිවරයා ඇතුළු අදාල ආයතයන් විගණන කටයුතු කරන විගණකාධිපති දෙපාර්තමේන්තු නිලධාරීන්ද මුදල් අමාත්‍යාංශයේ, මහ භාණ්ඩාගාරයේ නිලධාරීන්ද අදාල ආයතනය භාර විෂය බාර අමාත්‍යවරයා වෙනුවෙන් එහි ලේකම්වරයාද සහභාගි වේ. එම අවස්ථාවේදී විගණකාධිපතිවරයාට සෑහීමට පත්විය නොහැකි විගණන මතයක් යම් ආයතනයකට අදාලව ඉදිරිපත් කිරීම බරපතළය. නමුත්, එම විගණකාධිපති මතය මෙවර විමර්ශනයට ලක් කරන ලද ආයතන 48 න් 36 කටම හිමිවී තිබීම තුළ ආණ්ඩුවේ රාජ්‍ය ආයතන පිළිබඳව ඔබට තේරුම් ගැනීමට හැකිය. රාජ්‍ය ආයතනවල දූෂණ හෙළිකළත් එම දූෂකයින්ට අදාලව ගත හැකි කිසිදු පියවරක් මේ ධනේශ්වර පාලක පංතියට නොමැත. ධනපති පංතිය තම ධනය රැස්කරන්නේ පිරිසිදු ක්‍රමයකට නොවේ; දූෂණ - අක්‍රමිකතා මගිනි. ධනවාදය දූෂිතයන් රකින්නේය. ඒ නිසාම දූෂිතයෝ ධනපති ක්‍රමය ආරක්ෂා කරති.

මේ බව මනාව පැහැදිලි වන්නේ, මෙම කෝප් වාර්තාව ඉදිරිපත් කරමින් පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී එම කමිටුවේ සභාපති අමාත්‍ය ඩිව් ගුණසේකර මහතා විසින් කරන ලද අපූරු ප්‍රකාශයෙනි. එය කෝප් කමිටු වාර්තාවේ හෙළිදරව්වේ සියල්ලටම වඩා අපූරු හෙළිදරව්වකි. ඒ, ධනවාදයට හොරුන් දූෂිතයින් ආරක්ෂා කරනු මිස ඔවුන් හෙළිදරව් කළ නොහැකි බවයි.

රාජ්‍ය ආයතනවල දූෂිත බව හෙළි කළත්, එම දූෂිකයින්ට අදාලව ඔවුන්ට එරෙහිව ගනු ලබන නීතිමය පියවර කවරේදැයි මාධ්‍යවේදීහු ප්‍රශ්න කළහ. එහිදී ඩිව් ගුණසේකරගේ පිළිතුර වූයේ "දූෂිතයින්ට එරෙහි නීතිමය පියවර ජනාධිපතිවරයා විසින් ගත යුතු බවත්, තමන්ට කළ හැක්කේ හෙළිදරව් කිරීමක් පමණක් බවත්ය."

රාජපක්ෂ පාලනයේ 'යහපාලනය' ගැන දන්නා කුඩා දරුවකු පවා ජනාධිපතිවරයා දූෂිතයින්ට එරෙහිව පියවර නොගන්නා බව හොඳින් දන්නේය.



"දූෂණය, සංවර්ධනයේ සහ යහපාලනයේ සතුරා වෙයි. එය පැරදවිය යුතුය. ආණ්ඩුව සහ ජනතාව මෙම ජාතික අරමුණ සාක්ෂාත් කරගැනීමට කැපවිය යුතුය."

**ප්‍රතිභා පටෙල්**

**හිටපු ඉන්දීය ජනපතිනි**

### පොදු ව්‍යාපාර කාරක සභාවෙන් හෙළිදරව් කරන ප්‍රධාන ගනුදෙනු

(1) ලංකා ඛනිජ තෙල් සංස්ථාව 2011.06.01 සිට 2012.06.30 දක්වා කාලය තුළ මිලදී ගත් ප්‍රමිතියෙන් තොර ඛනිජ තෙල් නිෂ්පාදන වෙනුවෙන් ගෙවීම නිසා - සංස්ථාව ලද පාඩුව රු. බිලියන 8.3 කි.

(2) තෙල් සංස්ථාවට ඉන්ධන මිලදී ගැනීම වෙනුවෙන් විදේශීය UAE සමාගමට ගෙවන වාරිකය දෙවරක් ගිවිසුමේ සඳහන් කිරීම නිසා තෙල් සංස්ථාව එම සමාගමට ඇ.ඩොලර් 20,60,842ක් වැඩිපුර ගෙවීමට සිදුවීම

(3) රතුපස්වල අත්වැසුම් නිෂ්පාදන කම්හල සඳහා පාරිසරික සහතික නිකුත් කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරිය නිසි විමර්ශනයක් සිදු නොකොට තිබූ අතර, එම කම්හලේ අයිතිකරු විසින් සපයන ලද ජල සාම්පල පමණක් පරීක්ෂා කිරීමෙන් එම සහතික නිකුත් කොට තිබූ බව

(4) කෝප් විමර්ශනය සිදුකරන දිනය වනවිට, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් හෙජිං ගනුදෙනුව සඳහා දරා ඇති මුළු අලාභය ඇමරිකානු ඩොලර් මිලියන 75.28කි. (රු.9786.4 ආසන්න වශයෙන්)

(5) 2005 වසරේදී පැවැති සාක් ක්‍රීඩා උළෙලට භාවිතා කිරීමට රු. මිලියන 44ක් වියදම් කර සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයට මිලදී ගත් කාලය ගණනය කිරීමේ යන්ත්‍රය 2010 සිට ක්‍රියාත්මක නොවේ.


(6) 2011 දී ජාතික තරුණ සේවා සභාව රු. 12,87,440ක් වියදම් කර සකස් කළ වොලිබෝල් පිටිය ඉන් මාස 07කට පසුව ඉවත් කරන ලදී.

(7) සේවක අර්ථසාධක අරමුදල් මණ්ඩලය භාණ්ඩාගාර චක්‍රලේඛ උල්ලංඝනය කරමින් රු. මිලියන 74.8ක දිරිදීමනාද රු. මිලියන 44.5ක ප්‍රසාද දීමනාද 4.2%ක පොලියට රු. මිලියන 338.9ක ණයද ගෙවා ඇත.

(8) සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි 400,000කට ආසන්න සාමාජිකයින් සංඛ්‍යාවක් සිටින නමුදු, එයින් 75% ක්ම අක්‍රීය සාමාජිකයින් බව.

පවුල හා සමාජය 2

# පවුලේ ආරම්භය; මැවීමක්ද? පරිණාමයේ ඵලයක්ද?



නූතන 'පවුල' ගැන කරන අධ්‍යයනයකදී, එහි අඩංගුව හා ආකාරයත් එහි ඇති මානව සබඳතාවල ස්වභාවයත් එය වර්තමානයේ මුහුණ පා ඇති අර්බුදයේ සැබෑ ස්වභාවය හා ඊට හේතුත් වටහා ගැනීමේදී, පවුලේ ආරම්භය හෙවත් පවුල බිහිවූ ආකාරය වෙත අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ. වර්තමානයේ බොහෝ දෙනා සිතා සිටින ආකාරය වන්නේ, නැතිනම් පිළිගැනීමට කැමති ආකාරය වන්නේ නූතන පවුලේ ස්වභාවය හා වත්මන් පවුලේ ආකෘතිය සැමදා මෙලෙස පැවති බවය. එය පරිණාමීය ක්‍රියාවලියක් තුළ මානව සමාජයේ සමාජ සංවර්ධනය ක්‍රියාවලියට අනුරූපීව වෙනස් වෙමින් පැමිණ, වර්තමාන තත්වයට පත්වූ බව පිළිගැනීමට බොහෝ දෙනා මැළිවේ. ඒ වත්මන් පවුල, පවුලේ හොඳම ආකාරය හෙවත්, වත්මන් පවුල 'ශුද්ධවූ පවුල' ලෙස සලකන නිසාය. ඒ නිසාම එක්තරා කාලයක් යනතුරු මිනිසා මෙන්ම පවුලද මැවුම්වාදය තුළ විග්‍රහ කරනු ලැබීය. වත්මන් පවුල දෙවියන්ගේ හෝ වෙනත් බලවේගයක මැවීමක් ලෙස සලකනු ලැබීය. වර්තමානයේදී එය එලෙස විශ්වාස කරන බොහෝ දෙනා සිටිති.

එහෙත්, මානව සමාජයේ කුඩාම තැනුම් ඒකකය වූ 'පවුල' කිසිවෙකුගේ මැවීමක් නොවන බවත් එය මානව සමාජයේ සංවර්ධනය සමග ඊට අනුරූපීව සිදුවූ පරිණාමයක ප්‍රතිඵලයක් බවත් නවීන විද්‍යාවත් මානව විද්‍යාවත් ඉතිහාසය පිළිබඳ ගවේෂණයන් හා පරිණාමවාදයේ මූලධර්මත් විසින් නිසැක ලෙසම තහවුරු කරනු ලැබ ඇත. පවුල පිළිබඳව එංගල්ස් රචනා කළ ඔහුගේ අගනා කෘතිය වූ 'පවුල, පෞද්ගලික දේපළ හා රජය ඇති වූ සැටි' නම් කෘතියේ 1891 4වැනි මුද්‍රණයට ලියූ පෙරවදනේ මේ පිළිබඳව මෙලෙස සඳහන් කර තිබේ. "එක්දහස් අටසියහැට ගණන්වල ආරම්භය තෙක් පවුලේ ඉතිහාසය නමින් කිසිවක් නොතිබිණි. මේ අංශයේ ඓතිහාසික විද්‍යාව මෝසෙස්ගේ පනත් පහට හා එහි බලපෑමට මුළුමනින්ම යටවී තිබිණි. අන්කවර තැනකටත් වඩා දිගු ලෙස පවුලේ පීතෘ මූලික ක්‍රමය ඒවා මගින් විස්තර කර ඇති අතර, එය පවුලේ පැරණි ආකෘතිය ලෙස නිසැකවම පිළිගත්තා පමණක් නොව (බහු භාර්යා ව්‍රතය ඉවත් කිරීමෙන් පසු) වත්මන් කාලයේ ධනවාදී පවුල සමග එක්කොට පෙන්වා තිබෙනුයේ, සැබවින්ම පවුල ඓතිහාසික සංවර්ධනයකට මුහුණ නොපෑවාක් මෙනි."

**පරිණාමයේ අවස්ථාවක් ලෙස**

එහෙත් පවුල හැමදාම පැවතියේ එකම ආකාරයකින් නොවේ. එය විවිධ රටවලදී, විවිධ වෙනස්කම් සහිතව වුවද පොදුවේ අතීතයේ සිට පොදු අනුපිළිවෙළකට අනුව ඓතිහාසිකව ක්‍රමිකව විකාශනය වී ඇත. සත්‍යය එයයි.

මානව සමාජය අධ්‍යයනය කිරීමේදී හා වටහා ගැනීමේදී වර්තමානයේ විද්‍යාත්මක ලෙස පිළිගන්නා මතය වන්නේ පරිණාමවාදයයි. එනම් එම පරිණාමයේ එක් අවස්ථාවකදී වානර ප්‍රභේදයකින් මිනිසා බිහිවූ බවයි. එලෙස මිනිසා හෙවත් හෝමෝ සේපියන්ස් නම් සත්වයා බිහිවූයේද එක් රැයකින් නොව වසර දස දහස් ගණනක්, නැත්නම් වසර ලක්ෂ ගණනක් පුරා සිදුවූ පරිණාමීය ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙසය. එය එලෙස පිළිගන්නේ නම් එවිට මානව සමාජයේ තැනුම් ඒකකය වන පවුලද, එක් රැයකින් බිහිවූවක් හෝ කිසිවෙකු විසින් මැවූ දෙයක් නොව පරිණාම ක්‍රියාවලිය තුළම බිහිවූවක් බව පිළිගැනීම අසීරු නැත.

> මානව සමාජයේ කුඩාම තැනුම් ඒකකය වූ 'පවුල' කිසිවෙකුගේ මැවීමක් නොවන බවත් එය මානව සමාජයේ සංවර්ධනය සමග ඊට අනුරූපීව සිදුවූ පරිණාමයක ප්‍රතිඵලයක් බවත් නවීන විද්‍යාවත් මානව විද්‍යාවත් ඉතිහාසය පිළිබඳ ගවේෂණයන් හා පරිණාමවාදයේ මූලධර්මත් විසින් නිසැක ලෙසම තහවුරු කරනු ලැබ ඇත.

පවුලේ ඉතිහාසය පිළිබඳ ලුවිස් මෝර්ගන්ගේ සොයා ගැනීම් උපුටා දක්වන එංගල්ස් මෝර්ගන් විසින් මානව සමාජයේ සංවර්ධනය අවධිවලට වෙන්කොට බෙදා දැක්වූ ආකාරය විස්තර කරයි. මානව සමාජය එලෙස අවධිවලට බෙදා දක්වන මෝර්ගන් එම එක් එක් අවධිවලට අනුරූපීව පවුලේ ආකෘතීන් වෙනස් වූ ආකාරයද දක්වයි. මෙම යුග බෙදා දැක්වීම වඩාත් නිවැරදි වන්නේ, එකී බෙදීම සඳහා ඔවුන් මානව සමාජයේ නිෂ්පාදන උපකරණයන්ගේ සංවර්ධනයේ මට්ටම එක් එක් යුගවල පදනම ලෙස සලකා තිබෙන නිසාය. එසේ නැතිව මනෝමූලික සාධක හෝ වෙනත් මතුපිට ලක්ෂණ ඊට පදනම් කරගෙන නැති නිසාය.

**ම්ලේච්ඡත්වය හා එහි අවධි**

මෝර්ගන්ගේ ඉගැන්වීම්වලට අනුව මානව සමාජය ප්‍රධාන යුග තුනකට බෙදා වෙන්කර තිබේ. ඒවා නම් i ම්ලේච්ඡත්වය ii අශිෂ්ටත්වය හා iii සභ්‍යත්වය ලෙසය. මෙම ම්ලේච්ඡත්වය හා අශිෂ්ටත්වය යන යුග දෙක යළි කොටස් 3 බැගින්, එනම් පහත්, මැද හා උසස් ලෙස නැවතද බෙදා වෙන්කර දක්වා තිබේ. ඒ බෙදීම්වල රේඛා සඳහා ඔහු යොදාගෙන ඇත්තේ නිෂ්පාදන උපකරණයන්ගේ සංවර්ධනය මත මානව සමාජය තුළ සිදුවූ ගුණාත්මක වෙනස්වීම්ය. මේ පිළිබඳව එංගල්ස් මෙසේ සටහන් කළේය. "ම්ලේච්ඡත්වය, අශිෂ්ටත්වය හා සභ්‍යත්වය යන මේ යුග තුන අතුරෙන් ඔහු වැඩි උනන්දුවක් දැක්වූයේ පළමු යුග දෙකට සහ තෙවැනි යුගය දක්වා පරිවර්තනය වීම ගැන පමණි. යැපීම සඳහා අවශ්‍ය මාධ්‍යවල දියුණුවීම අනුව ඔහු මේ දෙයුගය පහත්, මැද හා උසස් වශයෙන් තෙකොටසකට බෙදා වෙන් කරයි. 'මේ අංශයේ ඔවුන්ගේ දක්ෂතාවය අනුව මිනිස් ආධිපත්‍ය පිළිබඳ මුළු ප්‍රශ්නය රඳා පැවතිණි. ආහාර නිෂ්පාදනය මත සම්පූර්ණ පාලනයක් ඇති කරගත් එකම සත්ත්ව වර්ගයා මිනිස් වර්ගයා බව කිව හැකිය. ජීවිකා වෘත්තියට අවශ්‍ය නිධාන විශාල වී පුළුල්වීමත් සමගම, අඩු වැඩි වශයෙන් එක එල්ලේම, මිනිස් සංවර්ධනයේ මහා යුග හඳුන්වා තිබේ.' පවුලේ පරිණාමය සිදුවන නමුදු කාලපරිච්ඡේද බෙදා වෙන් කිරීම සඳහා නිසැක මිම්මක් එයින් නොලැබේ."

පවුලේ විකාශනය සමාජ සංවර්ධනයේ යුගවලට අනුරූපව විග්‍රහකර තිබෙන නිසා එම සමාජ සංවර්ධනයේ විකාශනය බෙදා දැක්වූ යුගවල විශේෂ ලක්ෂණ වටහා ගැනීම පවුලේ විකාශනය තේරුම් ගැනීම සඳහා අවශ්‍ය වේ. ඒ අනුව එම බෙදීම් එකින් එක පළමුව හඳුනාගත යුතු වේ.

එංගල්ස් විසින් අඩුපාඩු සපුරාලමින් ඉදිරිපත්කර ඇති මෝර්ගන්ගේ බෙදීමට අනුව මානව සමාජයේ ආරම්භක යුගය හඳුන්වා ඇත්තේ ම්ලේච්ඡත්වය ලෙසය. මෙම ම්ලේච්ඡත්වය යනු වර්තමානයේ අප ව්‍යවහාර කරන ම්ලේච්ඡ යන තේරුමට සර්ව සම නොවේ. මින් අදහස් වන්නේ, මිනිසා සතුන්ගෙන් වෙන්වූ වහාම සභ්‍යත්වය හෙවත් නූතන සමාජය වෙත ඒමට පෙර පියමංකළ පළමු හෙවත් ප්‍රාථමික අවධිය පිළිබඳව වේ. එම ම්ලේච්ඡත්වය නම් යුගයද, පහත්, මැද හා උසස් ලෙස උප බෙදීම් තුනකට වෙන්කර තිබේ. එහිදී ම්ලේච්ඡත්වයේ පහත් අවධිය එංගල්ස්ගේ පොතේ 25 හා 26 වන පිටුවල විස්තර කර ඇත්තේ මෙසේය.

**මිනිසාගේ බිළිඳු අවධිය**

"1. පහත් අවධිය: මිනිස් වර්ගයාගේ බිළිඳු අවධිය වේ. මිනිසා තම මුල් ජන්ම භූමිය වන නිවර්තන (සර්ම කලාපික) හෝ අර්ධ නිවර්තන කැලෑවල වාසය කළේය. අඩ වශයෙන් ගස්වලද වාසය කළේය. මිනීකන විශාල වන සතුන්ගෙන් ගැලවී දිගටම ජීවත්වීමට ඔහු සමත් වූයේ මේ හේතුව නිසාය. පලතුරු, ඇට, හා ගස්වල මුල් වර්ග ඔහුගේ ආහාර විය. මේ කාලයේ ප්‍රධාන ජයග්‍රහණය වූයේ, පැහැදිලි ලෙස කථා කිරීම ඇති වීමය. ඓතිහාසික යුගයේදී ප්‍රසිද්ධියට පැමිණි එකද ජන කොටසක්වත් මේ ආදිකල්පික තත්වයේ තව දුරටත් නොසිටියේය. මේ අවධිය අවුරුදු දහස් ගණනක් පැවතිනැයි සිතිය හැකි වුවද, එහි පැවැත්ම ගැන අපට සාක්ෂි නොමැත. මිනිසා සත්ව පරපුරෙන් පැවත එතියි අප පිළිගත් විට, මේ පරිවර්තන අවධිය පිළිගැනීම නොවැළැක්විය හැකිය."

ඉහත විග්‍රහය අනුව මිනිසා එක් රැයකින් හෝ එක් දිනකින් සත්වයාගේ සිට එනම් මානව කල්ප වානරයාගේ සිට මිනිසා දක්වාත්, මිනිස් සමාජයක් දක්වාත් පරිවර්තනය වී එදාම පවුල නැමති ආකෘතියද ගොඩ නගා ගත්තේ නැත. මිනිසා සත්වයාගේ සිට මිනිසා දක්වා ක්‍රමිකව පරිවර්තනය විය. සතුන් අතර ලිංගික සබඳතා සිදුවූවත් වර්ගයා බෝකිරීම සිදුවූවත්, ඔවුන්ට නූතන මිනිස් සමාජයේ මෙන් ආධ්‍යාත්මික බැඳීම් සමාජ චාරිත්‍ර-වාරිත්‍ර හා නීති මත ගොඩ නැගුණු සවිඥානික 'පවුල' නැත. එය එසේ නම් සත්වයා මිනිස් සමාජයක් බවට පරිවර්තනය වන විට මානව සමාජයේ පවුල නැමති ඒකකය බවට පරිවර්තනය වන්නේ, සතුන් අතර තිබූ ලිංගික සබඳතාවයන්ය. එවිට ම්ලේච්ඡත්වයේ පහත් අවධිය ලෙස සලකන මිනිසාගේ බිළිඳු අවධියේ අංග සම්පූර්ණ පවුලක් පවතින්නේ නැත. එය සත්ව ස්වභාවයේ සිට මානව සමාජයේ පවුලක ස්වාභාවය දක්වා වෙනස් වෙමින් පවතී. මෙය අවබෝධකර ගැනීමට අප මෝර්ගන් ඉදිරිපත් කළ ම්ලේච්ඡත්වය හා අශිෂ්ටත්වය යන යුගවල මානවයාගේ හා සමාජයේ ස්වභාවය හා විශේෂ ලක්ෂණ වටහා ගත යුතුය.

ම්ලේච්ඡත්වයේ මැද අවධියේ සිට එය තේරුම් ගැනීම සඳහා මීළඟ කලාපයෙන් හමුවෙමු.

# Ebola: ආර්ථික දේශපාලන අවියක් ලෙස




මේ දිනවල බටහිර අප්‍රිකානු රටවල භයානක වසංගතයක් පැතිර යමින් පවතී. එය ඉබෝලා වෛරසය නිසා ඇතිවන රෝගී තත්වයයි. එය ඉබෝලා රක්තපාතය ලෙසද හැඳින්වේ. මෙම රෝගය හේතුවෙන් බටහිර අප්‍රිකානු රටවල පුද්ගලයින් 1300කට වැඩි පිරිසක් මේ වන විට මිය ගොස් ඇතැයි වාර්තා වේ.

ඉබෝලා රෝගයේ භායානකකම වන්නේ එය වැළඳෙන අයගෙන් 90%ක්ම මරණයට පත්වීමයි.

### අලුත් එන්නත

මේ වනවිට සමස්ත ලෝකයාගේම අවධානය ඉබෝලා වෛරස රෝගය වෙත යොමු වී තිබේ. මේ පිළිබඳව ලෝක අවධානය යොමු වීමත් සමගම එක්සත් ජනපදය ඉබෝලා රෝගයට එරෙහිව නිපදවූ අලුත් එන්නතක් අප්‍රිකානු රටවලට හඳුන්වාදීමට ඉදිරිපත් විය. එහෙත් ඒ සමගම එක්සත් ජනපදයේ එම හදිසි පියවර පිළිබඳව බොහෝ දෙනෙකු සැක පළ කරන්නටද පටන් ගෙන තිබේ. එලෙස සැක කිරීමට හේතු වශයෙන් ඔවුන් ඉදිරිපත් කරන කරුණුද නොසලකා හැරිය හැකි ඒවා නොවේ.

ඉබෝලා රෝගය බටහිර අප්‍රිකානු රටවලදී සොයා ගනු ලබන්නේ හැත්තෑවේ දශකයේදීය. එය වන සතුන්ගෙන් මිනිසාට බෝවූ රෝගයක් ලෙස සලකනු ලබයි. දැන් එය පුද්ගලයාගෙන් පුද්ගලයාට සිරුරේ ශ්‍රාවයෙන් මගින් බෝවන බව සොයා ගෙන තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ඉබෝලා වෛරසය සඳහා මෙතෙක් පිළිගත් එන්නතක් සොයා ගෙන නොමැත. එක්සත් ජනපදය මගින් මේ හඳුන්වාදීමට යන්නේද පර්යේෂණාත්මකව තහවුරු කෙරුණු එන්නතක් නොවේ. එක්සත් ජනපදය පවසන අන්දමට අප්‍රිකාවේදී ඉබෝලා රෝගය වැළඳුන ඇමරිකන් ජාතික වෛද්‍යවරයෙකු වන කෙන්ට් බ්‍රැක්ලිට එම එන්නත ලබාදීමෙන් පසු ' ආශ්චර්යමත්' ලෙස සුවපත් වී ඇත. ඊට අමතරව රෝගය වැළඳුන වඳුරන් ආශ්‍රිතව කරන ලෙද පර්යේෂණවලදී මෙම එන්නත සාර්ථක බවට තහවුරු වී ඇතැයි ඔවුහු පවසති. එහෙත් ඔවුන් විසින් ඒ පිළිබඳව වැඩිදුර විස්තර ඉදිරිපත් කරනු නොලබයි. උදාහරණයක් ලෙස මෙම වඳුරන් ස්වභාවික පරිසරයෙන් ගෙන ආ සතුන්ද? ඇතිදැඩි කරගත් සතුන්ද උන්ට රෝගය බෝ කරන ලද්දේ කෙසේද? ආදිය පිළිබඳව තොරතුරු ඉදිරිපත් නොවේ.

එක්සත් ජනපදයේ මෙම ඉදිරිපත් වීම පිළිබඳව සැක පහළ කරන පුද්ගලයින් පවසන්නේ, එක්සත් ජනපදය මේ සූදානම් වන්නේ බටහිර අප්‍රිකානු රටවල ජනතාව පරීක්ෂණාගාර මීයන් බවට පත්කර ගැනීමට බවය. එහෙත් එවැනි පියවරක් පිළිගත් සාදාචාරයන්ට පටහැණි බවද සඳහන් කරන ඔවුන් ඒ අතරම පවසන්නේ බටහිර අප්‍රිකාව පුරා පැතිරයන මෙම දරුණු වසංගත තත්වය ඉදිරියේදී 'වාර්ගික අවියක්' ලෙස භාවිතා කිරිමට ඇති හැකියාව පිළිබඳව එක්සත් ජනපදය මෙහිදී සොයා බලනු ඇති බවය.

### පරණ කතන්දරය

මෙම එන්නත නිපදවීමට අදාළ පසුබිම සොයා බැලීමේදීද, ඉහත ආකාරයේ සැකයක් මතුවීම සාධාරණ බව වැටහේ. එක්සත් ජනපදය හඳුන්වා දීමට යන මෙම එන්නත නිපදවන ලද්දේ සැන්දියාගෝහි පිහිටි Mapp Biopharmaceutical නම් සමගම විසිනි. මෙම සමාගම එක්සත් ජනපද යුද්ධ හමුදාවේ ඩෙට්රික්ස් බලකොටුවේ කටයුතුද සමග සහයෝගයෙන් ක්‍රියා කරන්නකි. එක්සත් ජනපදයේ හේරිලන්ඩ්වල පිහිටා ඇති මෙම හමුදා බලකොටුව ජීව විද්‍යාත්මක අවි සහ රසායනික අවි පිළිබදව අවුරුදු 50ක් පුරා පර්යෙෂණ සිදු කරනු ස්ථානයක් ලෙස ප්‍රචලිතය.

දෙවන ලෝක යුධ සමයේදී ඩෙට්රික් යුධ හමුදා බලකොටුවේ දී ජීව විද්‍යාක්මක අවි පිළිබඳව දැවැන්ත වැඩසටහනක් ආරම්භ කරන ලදී. එහි උපදේශකයා වූයේ හිට්ලර්ගේ කිට්ටුවන්තයෙක් වූ සහ එක්සත් ජනපදයේ විශාලතම ඖෂධ නිෂ්පාදන කර්මාන්තකරුවෙකු වන ජෝර්ජ් මර්ත්ය.

### හිට්ලර් සරණ යාම

1949 දී එවකට එක්සත් ජනපද ජනාධිපති හැරි ටෲමන් හිට්ලර් යටතේ ජීව විද්‍යාත්මක අවිආයුධ පර්යේෂණවල යෙදුණු විද්‍යාඥයින් ගණනාවක් බඳවා ගත්තේය. ෆයිල් කටු මෙහෙයුම යටතේ (Operation Paperclip) එක්සත් ජනපදය නාසි විද්‍යාඥයින්, තාක්ෂණවේදීන් එක්දහස් පන්සියයකට අධික පිරිසකගෙන් රසායන අවි සහ ජීව විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳව රහස් තොරතුරු රැසක් ලබා ගත්තේය. හිට්ලර්ගේ ජීව විද්‍යාත්මක අවි අංශයේ ප්‍රධානියා වූ ට්‍රොබ් එරික් 1949 දී එක්සත් ජනපදයට පැමිණුණි. මොහු වෛරස් රෝග පිළිබදව විශේෂඥයෙකු වූ අතර එක්සත් ජනපද නාවුක හමුදාවට අනුයුක්ත කරන ලදී. එතැන් සිට ඔහු වෛරස් වර්ග 40කට අධික ප්‍රමාණයක් පිළිබදව පර්යේෂණ කටුයතු ආරම්භ කළේය. ඒ අතර ජීව වි්‍යාත්මක අවි පිළිබඳව CIA ද සංවිධානයට සහ ඩෙට්රික්ස් බලකොටුවේ පර්යේෂණයන්ට උපදෙස් ලබා දුන්නේය.

HIV වෛරසය, ඉබෝලා වෛරසය, බටහිර නයිල් වෛරසය, මහාමාරිය වෛරසය ආදී වෛරසයන් මෙම බලකොටුවේ දී නිපදවන ලද ඒවායැයි විශ්වාස කෙරේ.

හැත්තෑව දශකයේ දී මෙම බලකොටුව ෆෙඩ්රික් පිළිකා පර්යේෂණ ආයතතනය ලෙස නැවත නම්කර එහි පාලනය එක්සත් ජනපදයේ ආරක්ෂක දෙපාර්තමේන්තුවටත් CIA සංවිධානයටත්, අභ්‍යන්තර ආරක්ෂාව පිළිබදව දෙපාර්තමේන්තුවටත් එක්සත් ජනපද ජාතික පිළිකා ආයතනයටත් පවරන ලදී.

### මතක සටහන්

මීට අමතරව ජීව විද්‍යාත්මක අවි පිළිබඳව එක්සත් ජනපදයේ භාවිතයද ඉහත අදහස තහවුරු කරන්නක් වේ. දැනට හෙළිදරව් වී ඇති තොරතුරු අනුව,


- 1946- 1948 වසර වල දී ගුවාතමාලාව තුළ සමාජ රෝග පතුරුවා හැරීම
- 1951 දී උතුරු කොරියාව තුළ ඇන්ත්‍රැක්ස් රෝගය පතුරුවා හැරීම සහ කහ උණ වසංගතය ඇති කිරීම
- 1970 දී ඩෙට්රික්ස් බලකොටුව තුළදී HIV වෛරසය නිපදවීම
- 1981 දී කියුබාවට ඩෙංගු වෛරසය මුදා හැරීම
- 1966 දී එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර උමං මාර්ග යක් තුළදී සාමාන්‍ය ජනතාව ආසාදනය වන අයුරින් බැක්ටිරියාවක් මුදා හැරීම
- 1990 දී ලොස් ඇන්ජලීස් හා කැලිෆෝනියා නගරවල කළු සහ හිස්පැනික් ජාතික ළමුන්ට සරම්ප වෙරසය එන්නත් කිරීම

ආදිය එක්සත් ජනපදයේ සෘජු මැදිහත් වීමෙන් සිදු වීඇත.

ඉබෝලා වසංගතය ඇති කිරීම පිටුපස බහුජාතික සමාග මේද සිටින බව බොහෝ දෙනාගේ මතයයි. වසංගතය ඇති කිරීමත් එහි භයානකකම පිළිබඳව මාධ්‍ය ප්‍රචාරයන් විසින් ඔවුන්ගේ ලාභ පංගුව හදිසියේ ඉහළ දමා ඇත.

අනෙක් අතට මේ මොහොතේ ජාත්‍යන්තතර වශයෙන් වර්ධනය වී ඇති පලස්තීනයට එරෙහිව සිදු කරනු ලබන ඊශ්‍රාලයයේ මිලේච්ජ ප්‍රහාරයන් හා ඊට සෘජු අනුබලයක් ලබා දෙනු ලබන එක්සත් ජනපදයේ ක්‍රියාකාරීත්වය පිළිබදව ලෝක අවධානය වෙනතකට යොමු කිරීමත් මෙම වසංගතයට මුවා වී සිදු කර ගත් බව ඇතැමුන්ගේ මතයයි.

එබැවින් මේ මොහොතේ ඉබෝලා වසංගතය රෝග තත්වයක සිට දේශපාලන හා ආර්ථික මෙවලමක් ලෙසද හැසිරෙන බව පෙනෙන්නට තිබේ.



"ඖෂධ රෝගයන් පමණක් නොව දෙගිඩියාවද සුවපත් කරයි."

**කාල් මාක්ස්**

# සමාජවාදයේ අනාගතය විමසූ සාඕ පාවුලෝ සංසදය

ලතින් අමරිකානු හා කැරිබියන් කලාපීය රටවල වාමාංශික පක්ෂ, කණ්ඩායම් සහ වාමාංශික ව්‍යාපාරයන්ගෙන් සැදුම්ලත් 'සාඕ පාවුලෝ සංසදයේ' මෙවර සමුළුව 2014 අගෝස්තු මස 25 සිට 29 දක්වා බොලීබියාවේ ලා පාස් නුවරදී පැවැත්වුණි. මෙම සංසදය 1990 වසරේදී බිහිකෙරුණේ කියුබානු නායක ෆිදෙල් කැස්ත්‍රෝගේ සහ බ්‍රසීලයේ එවකට ජනාධිපති ලූලා ද සිල්වාගේ මැදිහත්වීමෙනි.

එය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ සමාජවාදී කඳවුර බිඳවැටීමෙන් පසු ජාත්‍යන්තර තත්වය සහ ලතින් අමරිකානු සහ කැරිබියන් කලාපය තුළ නව ලිබරල්වාදයේ ප්‍රතිඵල සාකච්ඡා කිරීමය. එහි පළමු සමුළුව 1991 දී මෙක්සිකෝ සිටිහිදී පැවැත්වුණ අතර මෙවර පැවැත්වූයේ එහි 19වැනි සමුළුවය.

මෙවර සමුළුවට ලතින් අමරිකානු කලාපීය සහ ලෝකයේ අනෙකුත් රටවල වාමාංශික පක්ෂ සහ සංවිධාන 180ක පමණ නියෝජිතයින් සහභාගි විය. මෙවර සමුළුවේදී ධනවාදයේ අර්බුදය ජාත්‍යන්තර හූ දේශපාලනයේ තත්වය සහ සමාජවාදයේ අනාගතය පිළිබඳ පුළුල් සාකච්ඡාවක් සිදුකර ගැනිණි.

# ජල හිඟයේ මුල කොතැනද?



"නියඟය", "නියඟයෙන් පීඩාවට පත් ජනතාවට මානුෂීය ආධාර", "බීමට ජල බිඳක් නොමැතිව ඉරිතැලී ගිය වැව් පතුල් කාල්ගාන ජනතාව" මේ දිනවල මාධ්‍ය තුළ ජනප්‍රිය මාතෘකා බවට පත්ව තිබේ. දිවයිනේ දිස්ත්‍රික්ක 11ක ජනතාව කෘෂිකාර්මික කටයුතු සඳහා පමණක් නොව දෛනික ජීවිතයේ අවශ්‍යතා සඳහාද ජලය නොමැතිව පීඩාවට පත්ව සිටිති.

මෙලෙස ජනතාව පීඩාවට පත්ව ඇත්තේ දැඩි නියං තත්වයක් හේතුවෙන්ද නැතහොත් වර්ෂාපතන රටාවේ සිදුවූ වෙනස් තත්වයක් නිසියාකාරව කළමනාකරණය කරගැනීමට නොහැකි වූ නිසාද යන්න සලකා බැලීම වැදගත්ය.

ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම 03ක් වේ.

1. මෝසම් වර්ෂාව
   - නිරිත දිග මෝසම් වර්ෂාව
   - ඊසාන දිග මෝසම් වර්ෂාව
2. සංවහන වර්ෂාව (අන්තර් මෝසම් වර්ෂාව)
3. වාසුළි වර්ෂාව

මේ වන විට ජල හිඟයකට මුහුණපා සිටින වියලි කලාපීය ප්‍රදේශවලට වර්ෂාව ප්‍රධාන වශයෙන් ඊසාන දිග මෝසම තුළින් ලැබෙන අතර සංවහන වර්ෂාවද වැදගත් වේ. පසුගිය වසරේ සැප්තැම්බර් 15 සිට ඇරඹෙන අන්තර් මෝසම් වර්ෂාවද ,ඔක්තෝම්බර් සිට ජනවාරි දක්වා ව්‍යාප්තව පවතින ඊසාන දිග මෝසම් වර්ෂාවද ප්‍රමාණවත් පරිදි නොලැබුණ අතර මෙය මහා නියඟයක් ලෙස ආණ්ඩුවේ බලධාරීන්ද මාධ්‍යයද හුවා දක්වමින් මෙම ප්‍රදේශවල ලක්ෂ ගණනක් පීඩාවට පත්වූ ජනතාවද රටේ පොදු ජනතාවද රැවටීමට පත් කරමින් සිටී.

### ජල ගබඩා

වසරේ වැඩි කාලයක් වියලි කාලගුණයක් පවතින මෙම ප්‍රදේශවල කෘෂිකාර්මික කටයුතු මෙන්ම දෛනික ජීවිතයේ අවශ්‍යතාවයන් සඳහාද ජලය එක් රැස් කර ගැනීම සඳහා ඉතිහාසයේ වැව ප්‍රමුඛ කරගත් වාරි පද්ධතියක් ගොඩනගා තිබුණි. කෙටි කාලයක් තුළ වැටෙන අධික වර්ෂාව මුහුදට ගලා යා නොදී එක් රැස් කර ගැනීම මෙහි අරමුණ විය.

| | වැව | ජල ධාරිතාවය |
|---|---|---|
| 01 | කලා වැව | අක්කර අඩි ලක්ෂ 01 |
| 02 | රාජාංගනය වැව | අක්කර අඩි 81,600 |
| 03 | පදවිය වැව | අක්කර අඩි 85,000 |
| 04 | නුවර වැව | අක්කර අඩි 36,050 |
| 05 | කන්තලේ වැව | අක්කර අඩි 110,000 |

කලා වැව තුළ අක්කර අඩි ලක්ෂයක් ජලය ගබඩාකර ගැනීමේ හැකියාවද, පදවිය වැව තුළ අක්කර අඩි 85000ක් වැනි ප්‍රමාණයක්ද කන්තලේ වැව තුළ අක්කර අඩි එක් ලක්ෂ දස දහසක් පමණද ගබඩා කර ගත හැකි බව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අදහසක් පවතී. එහෙත් වර්තමානය වන විට මේවායේ තත්වය ඛේදජනකය. ඉතිහාසයේ මෙම වැව් හා ගැට ගැසුණු වාරි පරිසර පද්ධතියක් විය. පෝෂක ප්‍රදේශය, වැව් ඉහත්තෑව, රළපනාව, වැව් බැම්ම, සොරොව්ව, පමණක් නොව කුළු වැව් නමින් කුඩා වැව් පද්ධතියක්ද එයට අයත් විය. ඉතිහාසයේ වර්ෂාපතනය ලැබෙන විට පෝෂක ප්‍රදේශය තුළ ඇති කුළු වැව්වලට ජලය පිරී ජලය පෙරී වැව් ඉහත්තාව හරහා පිරිසිදු ජලය වැවට ලැබේ. ඒ තුළින් වැවට රොන් මඩ හෝ පස් පිරීමත් සිදුවුයේ අල්ප වශයෙනි. වර්තමානයේ ප්‍රධාන අර්බුදය ඇත්තේ එතැනය. එදා තිබු වැව් පෝෂක ප්‍රදේශය අද නැත. කුළු වැව් පද්ධතිය පවා විනාශ කොට ඇත. නිදසුන් ලෙස මහවැලි ා කලාපය ගොඩ නඟන විට කුඩා වැව් 300ක් පමණ කපා විනාශ කොට ඇත. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ, වැව් පතුල ගොඩ වීමය; රොන් මඩ පිරීමය. එයට ආණ්ඩුවෙන් විකල්ප නැත. එබැවින් ජල මාපක කුළුණ පැරණි ලෙස පිහිටා ඇත. සුළු වැස්සටත් ජලය පිරී වාන් දමයි. එහෙත් ජලාශවල සැබෑ ධාරිතාවය ජල මාපක කුළුණට පමණක් සීමා වී තිබේ.

නිදසුනක් ලෙස අක්කර අඩි ලක්ෂයක ධාරිතාවය ඇතැයි පවසන කලා වැව තුළ සැබෑ ලෙස ගබඩා වන්නේ අක්කර අඩි 65,000ත් -70,000ත් වැනි ප්‍රමාණයකි. රට පුරාම වැව් සහ ජලාශවල තත්වය මෙයට වෙනස් නොවේ.

ආණ්ඩුව විටින් විට වැව් හා ජලාශ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යැයි මුදල් වියදම් කරයි. ඒ වැවේ ජල ධාරිතාවය වැඩි කිරීම සඳහා නොවේ. වැව් බැම්ම අලංකාර කිරීම, රළපනාව ඇල්ලීම, වාන් දොරටුව අඟල් කීපයකින් එසවීම ඒ අතර ප්‍රධාන වේ. කන්තලේ වැව, පදවිය වැව, වැනි වැව් නිදසුන්ය. වැව් හා ජලාශ මුහුණ දී ඇති ප්‍රධානම අභියෝගය රොන් මඩ තැන්පත් වීමය. ඒ සඳහා ආණ්ඩුවේ මැදිහත් වීමක් නොමැත. මෙය ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ගය හා සමපාත වේ. එනම් අලංකාර වැවක් අවශ්‍ය වන්නේ සංචාරක කර්මාන්තය සඳහාය. ජල ධාරිතාවය වැඩි වැවක් අවශ්‍ය වන්නේ කෘෂිකර්මාන්තයට සහ අනෙකුත් ජනතා අවශ්‍යතා සදහාය. ආණ්ඩුව තෝරාගෙන ඇත්තේ, අලංකාර වැවක් යන සංකල්පයය. අද වියළි කලාපයේ ජනතාව පීඩා විඳින්නේ ආණ්ඩුවේ මෙම ප්‍රතිපත්තිය නිසාය.

### විකල්ප ජල සැපයුම

ආණ්ඩුවේ ජල කළමනාකරණය අයුරු වර්ගීකරණයක් පෙළ ගස්වා තිබේ. ඒ අනුව

1. පානීය ජලය
2. ජල විදුලිය නිපදවීම
3. කෘෂිකාර්මික කටයුතු ලෙස දක්වා තිබේ.

කෘෂිකාර්මික කටයුතු සදහා ඔවුන් වෙන් කරන්නේ ජල ධාරිතාවයෙන් 40% ක් පමණි.මෙයද මෙම ප්‍රදේශවල ජල හිඟයට බලපාන ප්‍රධාන සාධකයක් වී තිබේ.

ජාතික ජල කළමනාකරණ කමිටුව ඒ ඒ වර්ෂයේ ජල සැපයුම පිළිබඳ තීන්දු තීරණ ගනී. වියලි කලාපයට වර්ෂාපතනයේ සුළු අඩුවක් වූවද එම අභියෝගය ජය ගැනීමට විකල්ප ක්‍රියා මාර්ග පවතී. එනම් නිදසුනක් ලෙස නිරිත දිග මෝසම් වර්ෂාවෙන් මහවැලි ජලධාර ප්‍රදේශයට ලැබෙන ජලය වියලි කලාපීය වැව් වෙත ගෙන යාමේ විකල්ප මාර්ගයක්ද පැවතීමය.

පොල්ගොල්ලෙන් මහවැලි ජලය උමඟක් මගින් සුදු ගඟට ඇතුල් කෙරේ. බෝවතැන්න ජලාශය තුළින් එක් ජල සැපයුම් මාර්ගයක් දඹුළු ඔය හරහා කලාවැවටද, අනතුරුව රාජාංගනයටද සම්බන්ධ කෙරේ. අනෙක් පසින් හුරුළුපෝෂක ඇළ හරහා කණ්ඩලම වැවටද හුරුළු වැවටද ජලය සැපයෙයි. බෝවතැන්නෙන් ජල විදුලිය

> ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වු කෘෂිකාර්මාන්තය සඳහා 40% ජල කෝටා ප්‍රතිපත්තිය නිසා මධ්‍යම කඳුකරයට ලැබෙන වර්ෂාපතනයෙන් ජලාශවලට අවශ්‍ය ජල ප්‍රමාණය ගබඩා කර ගන්නේද නැත. එහි ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම කඳුකරයට ධාරාණිපාත වැසි වසිද්දී එහි පාමුල වියළි කලාපීය ජනතාවට බීමට ජල බිඳක් ඉල්ලා හඬා වැටීමට සිදුවී ඇත.

නිපදවා අඹන් ගඟට මුදා හරින ජලය ඇළහැර අමුණ හරස් කොට යෝධ ඇළ මගින් ගිරිතලේ, මින්නේරිය, වැව් තුළින් එක් පසෙකින් කවුඩුල්ල වැවටද අනෙක් පසින් කන්තලේ වැවටද මහවැලි ජලය සැපයිය හැකිය. අඹන්ගග අංග මැඩිල්ලෙන් හරස් කර ගන්නා ජලයෙන් පරාක්‍රම සමුද්‍රයටද ඒ වටා ඇති කුඩා වැව් සමූහයද පෝෂණය කළ හැකිය.

මෙම විකල්ප ජල මාර්ගය වැදගත්වන්නේ වියලි කලාපීය වර්ෂාපතන රටාවෙහි හදිසි වෙනසක් ඇති වුවහොත් එයට මුහුණ දීම සඳහාය. ජල හිඟයට ගොදුරුවී ඇති අනෙකුත් දිස්ත්‍රික්කවලටද එවන් විකල්ප සැලසුම් සකස් කළ හැකිය. එහෙත් ආණ්ඩුවට එවන් වුවමනාවක් නැත. ඉහත කී ජලාශ සියල්ලෙහි රොන්මඩ තැන්පත් වී ඇති බැවින් හා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වූ කෘෂිකාර්මාන්තය සඳහා 40% ජල කෝටා ප්‍රතිපත්තිය නිසා මධ්‍යම කඳුකරයට ලැබෙන වර්ෂාපතනයෙන් ජලාශවලට අවශ්‍ය ජල ප්‍රමාණය ගබඩා කර ගන්නේද නැත. එහි ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම කඳුකරයට ධාරාණිපාත වැසි වසිද්දී එහි පාමුල වියළි කලාපීය ජනතාවට බීමට ජල බිදක් ඉල්ලා හඬා වැටීමට සිදුවී ඇත.

මේ අනුව එකක් පැහැදිලිය. එනම් මේ දිනවල මුහුණ පෑ නියං තත්වය ජයගත හැකිව තිබූ එකක් බවය; එනම් දිගු කාලීනව සැලසුම් සකස් කර මතුවිය හැකි අවදානම් පිළිබඳ පුරෝකථනයන් සිදු කොට එයට මැදිහත්වන පාලනයක් තුළ එය ජයගත හැකි බවය; එමෙන්ම එදාවේල සරි කර ගන්නා දුබල ධනපති ආණ්ඩුවලට "ඉඩෝරයකට" ද මුහුණ දීමට හැකියාවක් නොමැති බවය.

# අතිරික්ත ගොඩගැසීම සහ ඒකාධිකාර බිහිවීම

අප මෙතෙක් අතිරික්ත වටිනාකම පිළිබඳව මාක්ස්වාදී න්‍යායික කරුණු සාකච්ඡා කරනු ලැබීය. ප්‍රායෝගික ධනවාදී ලෝකය තුළ එක් එක් ව්‍යාපාරවලින් සැදුම්ලත් ධනවාදී ආර්ථිකයන්හි මෙම අතිරික්ත ඒකරාශී වීමෙන් සැදෙන ප්‍රාග්ධන සංකේන්ද්‍රණ ක්‍රියාවලිය, ඉන්පසු සිදුකරන ප්‍රායෝගික යාන්ත්‍රණය මින් ඉදිරියට තේරුම් ගනිමු.

19වන සියවස අවසාන වෙත්ම, ලෝක ධනවාදයද එහි අවසාන අවධිය වන අධිරාජ්‍යවාදී අවධියට ළඟා විය. එම නව යුගයට අදාලව දේශපාලන ආර්ථික විග්‍රහය බිහිකරන ලද්දේ, මාක්ස්ගේ හා එංගල්ස්ගේ විශිෂ්ට අනුගාමිකයා වූ ලෙනින් විසිනි. ඒ, අධිරාජ්‍යවාදය පිළිබඳව විද්‍යාත්මක-න්‍යායික ස්ථාවරයයි.

අධිරාජ්‍යවාදයද - ධනවාදයේ සියලුම මූලික අංග ලක්ෂණ සහිතවම තවත් නව අංග එකතු කර ගනියි. අධිරාජ්‍යවාදය ධනවාදයට පිටින්, ධනවාදයේ නොවන අංග සහිත සමාජයක් නොවේ. ධනවාදයේම නව අංග සහිත නව අවධියයි. අධිරාජ්‍යවාදයේ ප්‍රධාන අංග මෙසේය.

**1. අධික ලෙස ප්‍රාග්ධනය සංකේන්ද්‍රණය වීම සහ ඒකාධිකාර පිහිටුවීම**

**2. ඒකාධිකාර බැංකු සහ කාර්මික ප්‍රාග්ධනය ඒකාබද්ධ වීමෙන් මූල්‍ය ප්‍රාග්ධනය සහ අමූල්‍ය කතිපයාධිපත්‍ය බිහිවීම,**

**3. භාණ්ඩ ආනයනය-අපනයනය සමගම ප්‍රාග්ධන අපනයනයද සිදුකිරීම**

**4. ධනවාදී ඒකාධිකාර සමාගම් අතර, ලෝකය ආර්ථික වශයෙන් බෙදා ගැනීම**


**5. ලෝකය ප්‍රාදේශීය-භෞතික ලෙස යළි යළිත් බෙදා ගැනීම සඳහා යුද වැදීම**

අධිරාජ්‍යවාදී යුගයේදීත් ධනවාදී වුවමනාව උපරිම අතිරික්ත වටිනාකම් බිහිකර ගැනීමය. ඒ නිසා අතිරික්ත වටිනාකම් ඉපැයීමේ ප්‍රමාණය සහ ධනපතීන් විසින් නිර්ධන පංතිය සූරාකෑමේ ප්‍රමාණය අතිවිශාල ලෙස වැඩි කරයි.

## ඒකාධිකාරී ආධිපත්‍ය

අධිරාජ්‍යවාදය යටතේ අතිරික්ත වටිනාකම බිහිකිරීම සහ අත්පත්කර ගැනීමේ මූලික වෙනස්කම් ඒකාධිකාර විසින් සිදු කරයි. ඒකාධිකාර ධනවාදී රටවල ආර්ථික ජීවිතය හැඩ ගසන අතර, අතිවිශාල ආර්ථික බලයක් අත්පත් කරගනියි.

ඒකාධිකාරයක් යනු, ධනේශ්වරයම යෝධයකුගේ තත්වය යටපත් වීමයි. අධිරාජ්‍යවාදය ධනවාදයේ ඒකාධිකාරී අවස්ථාවයි.



ඒකාධිකාරය, අතිවිශාල ප්‍රාග්ධනයක් සහිතව අතිවිශාල කම්කරුවන් පිරිසක් සූරාකනු ලබයි.

ඇමරිකානු එක්සෝන් (Exxon) සමාගම ලෝකයේ විශාලතම තෙල් ඒකාධිකාරයන්ගෙන් එකකි. එහි වාර්ෂික ආදායම ඩොලර් බිලියන 100 ඉක්මවයි. මොබිල් ඔයිල්, ජෙනරල් මෝටර්ස්, බ්‍රිතාන්‍යයේ බ්‍රිටිෂ් පෙට්‍රෝලියම්, ජපානයේ ටොයෝටා, ජර්මනියේ ෆොක්ස්වාගන් මෙවැනි ඒකාධිකාරී නිෂ්පාදන සමාගම්වලට උදාහරණ කිහිපයකි.

ඒකාධිකාරවල බලයට ප්‍රධාන හේතුවන්නේ, ඒවා කර්මාන්ත එකක හෝ කිහිපයක නිෂ්පාදනයේ අතිවිශාල කොටසක් සියතට අත්පත් කරගනිමින් කේන්ද්‍රගත වීමය. ඒකාධිකාර වෙළඳපොළවල් පාලනය කරමින් භාණ්ඩ අලෙවි කිරීම පිළිබඳව කොන්දේසි වෙළඳපොළට පනවයි. ඇමරිකා එක්සත් ජනපදයේ ලක්ෂ ගණනක් ව්‍යාපාර තිබුණද මුළු වෙළඳපොළෙන් 43%ක් පාලනය කරන්නේ, ඒකාධිකාර සමාගම් 200කි.

ආරම්භයේදී, ඒකාධිකාරයක් පිහිටුවනු ලැබුවේ, එක් කර්මාන්තයක නිරතව සිටි තනි තනි කර්මාන්තරුවන් කිහිපදෙනෙකුගේ එකතුවක් (සංගමයක්) ලෙසිනි. නමුත්, වර්තමානයේදී කර්මාන්ත ගණනාවක් වසා පැතිරෙන ප්‍රබල ඒකාධිකාරී සමාගම් විශාල ප්‍රමාණයක් දැකිය හැකිය.

## ඒකාධිකාර මිල

ජාතික ආර්ථිකයට තමන්ට කළ හැකි බලපෑම ඉවහල් කරගනිමින්, ඒකාධිකාර තම ලාභ උපරිම කළ හැකි ආකාරයට මිල ගණන් හසුරුවයි. ඒකාධිකාර මිල දෙවර්ගයකි. පළමුවැන්න තමන්ගේ නිෂ්පාදන අලෙවි කරන මිලය. දෙවැන්න

"ඒකාධිකාරය අධි ලාභ උපදවයි. එනම්, ලොව මුළුල්ලේම සිරිතක් වශයෙන් ලැබෙන සහ සාමාන්‍ය ධනවාදී ලාභවලට වඩා වැඩි ලාභ අතිරික්තයක් උපදවයි"

ඒකාධිකරයක් තම අමුද්‍රව්‍ය මිලදී ගන්නා මිලය. විකුණන මිල නිතරම නිෂ්පාදන පිරිවැයට හා නිෂ්පාදිතයේ වටිනාකමට වැඩි වන අතර, මිලදී ගන්නා මිල නිතරම එම භාණ්ඩවල සමාජ වටිනාකම වඩා අඩුය.

ඒකාධිකාර සමාගම ආර්ථික වශයෙන් දුර්වල රටවල් සහ සුළු නිෂ්පාදනයකින් අපනයනය කරන භාණ්ඩ සඳහා බලහත්කාරයෙන් අඩු මිලක් නියම කරයි. ඒකාධිකාර දෙගුණයක් ලාභ ලැබීමට මිලදී ගැනීම සහ අලෙවි කිරීම භාවිතා කරයි. ඔවුන් එසේ මිල කිරීම මගින් ලාභ දෙගුණ කරගන්නේ කෙසේද?

ඒකාධිකාර ධනවාදයට පෙර අවධියේදී-නිදහස් තරඟය පැවැතිණි. එහිදී මිල උච්චාවචනයෙන් සිදුවිය. තනි ගණුම්කරුවන්ට තනි තනි විකුණුම්කරුවන් මුණ ගැසුණි. කිසියම් භාණ්ඩයක් අවශ්‍ය වූ ගැනුම්කරුවෙකුට එය ලබා ගැනීමට අවශ්‍ය විකුණුම්කරු නැතිනම් වෙනත් අයෙකු හමුවිය හැකිවිය. මිල අධික වී නම් මිල අඩුවට විකුණන අයෙකු හමුවිය හැකිවිය. ඒ අනුව, වෙළළඳපොළේ තත්වයන්ට අනුව මිල හෙට්ටු කිරීමේ හැකියාවක් ධනපති ගැනුම්කරුවන්ට සහ විකුණුම්කරුවන්ට තිබුණි.

නමුත්, අධිරාජ්‍යවාදී ඒකාධිකාර යටතේ මේ තත්වය මුළුමනින්ම වෙනස් විය. ඒකාධිකාර සමාගම් භාණ්ඩ නිෂ්පාදනයේ වැඩි පංගුවක් මුළුමනින්ම පාලන කරන බැවින් මිලදී ගැනීමේ සෑම අවස්ථාවකදීම ගැනුම්කරුට ඒකාධිකාරයක් විසින් අලෙවි කරනු ලබන මිලට මිලදී ගැනීමට සිදුවේ. ඒකාධිකාරය යටතේ, එක්කෝ ඒකාධිකාර මිලට ගැනුම්කරු මිලදී ගත යුතුය. නැතහොත් හිස් අතින් යා යුතුය.

ඒකාධිකාර මිල පවත්වා ගැනීමට, ඒකාධිකාර සමාගම් විවිධ ක්‍රම අනුගමනය කරති. වෙළඳපොළට භාණ්ඩ පැමිණීම සීමා කිරීම, රජයේ ආධාර-තීරු බදු සහන, බදු සහන මත භාණ්ඩවල මිල පාලනය, ණය පහසුකමක් සහිත මිලදී ගැනීම්වලින් දිරි ගැන්වීම ලබා ගැනීම, ආදී විවිධ හේතුමත ඉතාමත් ලාභදායක මිල මට්ටම් පවත්වා ගැනීමට ඒකාධිකාර සමත් වේ.

## ඒකාධිකාර ලාභ

ඉතා අධික මිල ගණන්වලට භාණ්ඩ අලෙවි කිරීම මගින් ඒකාධිකාර අති විශාල ආදායමක් උපයයි. එයින් පළමුව නිෂ්පාදන වියදම පියවා ගනී. ඉතිරිය ඒකාධිකාරයේ ලාභය හෙවත් ඒකාධිකාර ලාභයයි.

ඒකාධිකාර ලාභය කොටස් 03කි. පළමුවැන්න එහි ධනපති ස්වභාවය නිසා උපදින **සමාන්‍ය ලාභයයි.** එය යොදන ප්‍රාග්ධනයට අනුව ඒකාධිකාරයේ අයිතිය හිමි සියලු ධනපතීන් වෙත ගණන් බලනු ලැබේ. දෙවැන්න එහි අමතර හෙවත් **අතිරේක ලාභයයි.** එය සමාජ නිෂ්පාදන මිල සහ තනි තනි නිෂ්පාදන මිල ගණන් අතර වෙනස මගින් උපදී. තෙවැන්න **ඒකාධිකාර අධි ලාභයේ කොටසයි.** එය හටගන්නේ ඒකාධිකාර මිල සහ නිෂ්පාදන මිල අතර වෙනස හේතු කොටගෙනය.

අධිරාජ්‍යවාදයට විශේෂ වූ විධි මගින් නිර්මාණය කරනු ලබන සහ අත්පත් කරගනු ලබන අමතර ලාභය ඒකාධිකාර අධි ලාභයට අයත් වෙයි. ප්‍රධාන වශයෙන් එය ඒකාධිකාර ආධිපත්‍ය සහ ඒකාධිකාර ප්‍රාග්ධනයේ අසීමිත බලය ආර්ථික වශයෙන් එල දැරීමකි. ලෙනින්ගේ වචනවලින් කිවහොත්, "ඒකාධිකාරය අධි ලාභ උපදවයි. එනම්, ලොව මුළුල්ලේම සිරිතක් වශයෙන් ලැබෙන සහ සාමාන්‍ය ධනවාදී ලාභවලට වඩා වැඩි ලාභ අතිරික්තයක් උපදවයි".

## ඒකාධිකාර සූරාකෑම

ඒකාධිකාර අධි ලාභ ලැබීමේ එක් ක්‍රමයක් වන්නේ, ඉතිහාසයේ පෙර නොවූ විරූ පරිදි කම්කරු පංතිය සූරාකෑමය. ඒකාධිකාරී ප්‍රාග්ධනය නිරපේක්ෂ සහ සාපේක්ෂ අතිරික්ත වටිනාකම (කලින් ලිපිවල විස්තර කර ඇත) බිහිකිරීමේ නවීන උපක්‍රම යොදා ගනියි. ඒකාධිකාරයක්, එසේ නොවන ඕනෑම තරඟකාරී ධනවාදී වෙළඳ සමාගමකට වඩා අතිකාල වැඩ සැලසුම් යොදා ගනී. සූරාකෑම තීව්‍ර කිරීම සඳහා ඒකාධිකාර නවීනතම යන්ත්‍ර සූත්‍ර මෙන්ම සංවිධාන ක්‍රමද භාවිත කරයි.

ඒකාධිකාරයෙකුට අනෙකුත් සමාගම් ධනපතින් සමග අතිරික්ත වටිනාකම බෙදා ගැනීමට අවශ්‍ය නැත. ඒකාධිකාර ආධිපත්‍ය සියලු කර්මාන්ත අතර ලාභ සමාන කිරීමේ ක්‍රියාදාමය තුළට මෙම අතිරික්ත වටිනාකම ඇදීයාම වළක්වයි. මේ අනුව, ඒකාධිකාරීත්වයට අනෙක් ධනපති ව්‍යාපාර අභිබවා සිය ආර්ථික ශක්තිය තවදුරටත් තහවුරු කරගැනීමට හැකිවේ.

ඒකාධිකාර අධි ලාභ ලැබීම සහ එම අධි ලාභ ලබා ගන්නා මාර්ග පිළිබඳ ලබන කලාපයේදී වටහා ගැනීමට උත්සාහ කරමු.



"ප්‍රශ්නයක් වෙත යොමුවීමේදී, මාක්ස්වාදියෙක් කොටස මෙන්ම මුළු එකත් දැකිය යුතුය. "අහස ළිං කටට වඩා ලොකු නැතැ"යි ළිඳක සිටින මැඩියෙක් කියයි. අහස ළිං කට තරම්ම නොවන නිසා, එය සැබෑ නොවේ. "අහසින් කොටසක් ළිං කට තරම්ය"යි ඌ කීවොත්, එය සැබෑ වනවා ඇත; කවර හෙයින්දයත් එය සත්‍ය කරුණු හා ගැලපෙන නිසාය."

**මාඕ සේතුං**
**උදාත පාඨ, 254 පිටුව**



# සාහිත්‍ය මාසය, නිර්මාණකරණය හා කාන්තා දායකත්වය

එළැඹ ඇත්තේ සාහිත්‍ය මාසයය. සුපුරුදු ලෙසටම මෙවරත් සාහිත්‍ය මාසය පුරාවට විද්‍යුත් මාධ්‍ය තුළ විවිධ වැඩසටහන්, සංවාද හා මුද්‍රිත මාධ්‍ය තුළ ඊට අදාල ලිපි ලේඛනයන්ද අපට අසන්නට, දකින්නට, කියවන්නට ලැබෙනු ඇත. එසේම සැප්තැම්බර් මාසය පුරා පොත් සල්පිල්ද, පොත් එළි දැක්වීම්ද, සාහිත්‍ය දේශනයන්ද, සාහිත්‍ය උත්සවයන්ද දක්නට ලැබෙනු ඇත.

එහෙත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වුවද සාහිත්‍ය නිර්මාණකරණයට යොමුවන පිරිසේ අඩුවක් දක්නට ලැබෙනවා සේම සාහිත්‍ය පතපොත පරිශීලනයට, කියවීමට යොමුවන ප්‍රමාණයද කෙමෙන් කෙමෙන් පහළ වැටී ඇති බව පෙනේ. පොත් සල්පිල්වලින් පොත් මිටි ගණන් රැගෙන ගියද සාමාන්‍ය සමාජය තුළ කියවන ප්‍රමාණයේ අඩුවක්ද දක්නට ලැබේ. සාහිත්‍ය කෘතියක් කියවා විඳීම ඒ ගැන අදහස් හුවමාරු කරගැනීම ඊටත් වඩා අඩු බව පෙනේ.

අපේ සමාජය එවන් තත්වයකට පත්වීමේ අභාවාචකයට ප්‍රධාන වශයෙන් වගකිව යුතු වන්නේ අතීතයේ හා වර්තමානයේ රට පාලනය කළ සහ කරන පාලකයින්ය. සාහිත්‍ය ක්ෂේත්‍රය පෝෂණය කිරීමට, එය වර්ධනය කිරීමට රාජ්‍ය අනුග්‍රහය දක්වනවා වෙනුවට ඔවුන් කළේ සාහිත්‍යය ක්‍රමානුකූලව සමාජයෙන් ඈත් කරවීමට පියවර ගැනීමය; පාසල් අධ්‍යාපනයෙන් සාහිත්‍යය අතු ගා දැමීමට පියවර ගැනීමය. සාහිත්‍යය කන්නදැයි ඇසූ ජේ. ආර්. ජයවර්ධන ගෙන ගිය ආර්ථික, දේශපාලන ප්‍රතිපත්තියම ඉදිරියට ගෙන යන වත්මන් පාලකයන් කටයුතු කරමින් සිටින්නේද ඊට නොදෙවෙනි අයුරිනි.

තවද වෘත්තීය වශයෙන් සාහිත්‍යකරණයට යොමුවන පිරිසේ අඩුවක් දක්නට ලැබෙන්නේ තම නඩත්තුවටවත් ප්‍රමාණවත් තරම් මුදලක් එයින් නොලැබෙන බැවිනි. සාහිත්‍ය නිර්මාණකරණයට හිමිව ඇත්තේ එවැනි කුඩම්මාගේ සැලකිල්ලකි. පොදුවේ සමාජය තුළ සාහිත්‍ය ක්ෂේත්‍රයට කාන්තාවන් යොමුවීමේ විශාල අඩුවක්ද දක්නට ලැබේ. එයට බලපාන පොදු හේතූන් සේම විශේෂ හේතූන්ද පවතී. පාසල් අධ්‍යාපනය ලබන කාලයේදී, නැතහොත් විශ්ව විද්‍යාල ජීවිතයේදී නිර්මාණකරණයට හැකියාවන් ඇති බොහෝ තරුණියන් රැකියාවක් ලැබුණු පසුව හෝ විවාහ ජීවිතයට එළැඹීමෙන් පසුව ඔවුන් නිර්මාණකරණයෙන් ඉවත් වීම බේදනීය තත්වයකි. රැකියාව කිරීමෙන් පසුවද පුද්ගලික ගෙදර වැඩ කටයුතුවල යෙදීමට සිදුවීමෙන් කිසිදු විවේකයක් නොමැති තත්වයකට බහුතරයක් කාන්තාවන් පත්වීමද ඊට හේතු කාරණා වී ඇත.

කෙසේ වෙතත් රටක සංවර්ධනයට භෞතික නිර්මාණ (භෞතික සංවර්ධනය) පමණක් ප්‍රමාණවත් නැත. අධ්‍යාත්මික සංවර්ධනයද අවශ්‍ය වේ. එය කොන්ක්‍රීට්වලින් කාපට්වලින් කළ නොහැක. කලාව සාහිත්‍යය අවශ්‍ය වන්නේ ඒ සඳහාය. මිනිසුන්ගේ සිත්ද කාපට් මෙන්, රළු කොන්ක්‍රීට් මෙන් දැඩි වූ විට මියැදෙන්නේ මිනිස්කමය. නිදි යහනේ දරුවන් මරා දමන, කිරිකැටි බිළිඳියන් පොළොවේ ගසා මරා දමන පියවරු පහළ වන්නේ එවිටය. මෙය සමාජ බේදවාචකයකි. මෙම තත්වය වෙනස් කොට මිනිස්කම පිරුණු සමාජයක් හා මිනිස්කමට ඉඩදෙන සමාජ ක්‍රමයක් වෙනුවෙන් නිර්මාණකරුවෝ පෙරමුණ ගත යුතුය. එහිදී පෙරමුණේම සිටිය යුත්තේ මේ සමාජ බේදවාචකයෙන් වඩාත් පීඩාවට පත්වන කාන්තාවන්ය.

## සිව් දෙසින්

### වසර 14 ක් උපවාස කරමින් අත්අඩංගුවට පත් ෂර්මිලාට නිදහස!




ඉරෝම් ෂර්මිලා නම් 42 හැවිරිදි ඉන්දීය කාන්තාවක් පසුගියදා ඉන්දීය අධිකරණයක් විසින් නිදහස් කරනු ලැබීය.

ඇයට තිබූ චෝදනාව වූයේ දිවි නසා ගැනීමට උත්සාහ කිරීමය. ඉන්දීය නීතියට අනුව දිවි නසා ගැනීමට උත්සාහ කිරීම සිර දඬුවම් ලැබිය හැකි වරදකි. ඉරෝම් ෂර්මිලා නම් මෙම කාන්තාවට මෙම චෝදනා එල්ලවූයේ ඇය පුරා වසර 14 ක් පුරා ආහාර වර්ජනයක යෙදෙමින් සිටින නිසාය.

'මනිපුරයේ යකඩ ගැහැණිය' නමින් ප්‍රසිද්ධ ඇය 2000 වසරේ නොවැම්බරයේ සිට ආහාර වර්ජනය කරමින් උපවාසයක නියැලී සිටියාය. ඇය එසේ උපවාසයේ යෙදී සිටියේ ඉන්දීය හමුදාවට හා පොලීසියට ලබා දී ඇති ත්‍රස්තවාදය මැඩලීමේ නාමයෙන් ක්‍රියාත්මකවන මර්දනකාරී නීතිවලට එරෙහිවය.

මෙම නීතිය 1958 සිට ක්‍රියාත්මක වන අතර විශේෂයෙන් කාෂ්මීර ප්‍රදේශයේ මෙය ක්‍රියාවට නගන අතර මෙම නීතියට අනුව ත්‍රස්තවාදීන් ලෙස සැක කරන ජනතාව අත්අඩංගුවට ගැනීමට පමණක් නොව වෙඩි තැබීමටද ඉඩ ලැබී තිබේ. ෂර්මිලා පළමු වරට උපවාසයේ යෙදුනේ මනිපුරයේ බස් නැවතුම්පලක් අසලදී හමුදාව විසින් වෙඩි තබා සිවිල් වැසියන් 10 දෙනෙකු මරාදමනු ලැබීමේ සිදුවීමට එරෙහිවය.

මෙම වෙඩි තැබීමට හා මර්දන නීතිවලට එරෙහිව ෂර්මිලා ආරම්භ කළ උපවාසය නිසා කීප වරක්ම ඇය පොලිස් අත් අඩංගුවට පත්වූ අතර උසාවියට ඉදිරිපත් කරනු ලැබූයේ දිවි නසාගැනීමේ චෝදනාව යටතේය. එහෙත් අවසානයේ පසුගියදා ඇගේ නීතිඥයන්ගේ කරුණු දැක්වීම හමුවේ ඇය නිදහස් කිරීමට අධිකරණය තීරණය කළේය

ඇගේ නීතිඥයින් තර්ක කළේ ජනතාවගේ අයිතීන් වෙනුවෙන් උද්ඝෝෂණ ක්‍රියාමාර්ගයක් ලෙස උපවාසයක නිරත වීම ගැටලුවක් නොවන බවත් ඉංග්‍රීසි පාලන කාලයේ මහත්මා ගාන්ධි කළ උපවාසවලදී පවා ඊට එරෙහිව උසාවි නොගිය බවත්ය.

කෙසේ වෙතත් කාන්තාවක් ලෙස ෂර්මිලා ගෙනගිය අරගලය කිසියම් ජයග්‍රහණයකින් කෙළවර කරගැනීමට සමත් වී ඇත.

## නිපුණ මෙවලමක නිර්මාණයක්


බොන්සායි ගස
ආකර්ෂණීය බදුනක.

අඩි අසූවක් උසට
වැඩෙන්නට තිබුණා
කන්දක් සමීපයේ
අකුණකින් දෙකඩ වන තුරු,
නමුත් උයන්පල්ලා
ප්‍රවේශමෙන් කප්පාදු කළා
අඟල් නවයකි උස එය.

හැමදාම
කප්පාදු කරන විට අතු
උයන්පල්ලා සිහින් හඬින් මුමුණනවා
එය ඔබේ ස්වභාවයයි
කුඩා වීම හා ආකර්ෂණය වීම,
ගෘහස්ථ හා දුර්වල වීම,
මොන තරම් වාසනාවන්තද පුංචි ගස
හැදෙන්නට බදුනක් තිබීම
ජීවත්වන ප්‍රාණීන් සමග

කෙනෙක් මුලදීම
පටන් ගත යුතුයි
වර්ධනය කරන්නට කුරු වීම,
බැඳුනු පා,
නොවැඩුනු මොළය,
රැළි සහිත කෙස්.
ඔබේ දෑත්
ස්පර්ශ කිරීමට
ආශා කර කරන

*මර්ජ් පර්සි නම් අමෙරිකන් කිවිඳිය විසින් රචිත **A Work of Artifice** නම් කවිය මගින් පවතින සමාජ ක්‍රමය තුළ විශේෂයෙන් ආසියාවේ, කාන්තාව එම සමාජයට ගැලපෙන ලෙස සකස් කර ගන්නා ආකාරය බොන්සායි ගසකට උපමා කර ගනිමින් ඉදිරිපත් කර තිබේ.*



ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

අගෝස්තු 07

# ජනාධිපති ආරක්ෂක ඒකකයේ වාහන මැතිවරණ පෙළපාළියක තිබෙන්නේ කොහොමද?



පාර්ලිමේන්තු මන්ත්‍රී

## අනුර දිසානායක සහෝදරයා

(කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත පිළිබඳ විවාදය)

පාර්ලිමේන්තුවෙන් එක් එක් ආයතනවලට එක් එක් අයට විවිධාකාරයෙන් බලතල පවරා තිබෙනවා. ඒ විධියට බලය පවරපු කෙනෙක් තමයි අපේ රටේ මැතිවරණ කොමසාරිස්වරයා. නිදහස් කහා සාධාරණ මැතිවරණයක් පවත්වා ගෙන යාම වෙනුවෙන් සුවිශේෂ වූ බලතල ගණනාවක් -මේ පාර්ලිමේන්තුව විසින් නීති සම්පාදනය කරලා- ඔහු වෙත පවරා දී තිබෙනවා. හැබැයි ඒ බලතලවලට සිදු වෙමින් තිබෙන්නේ මොකක්ද?

මා ළඟ තිබෙනවා, පසු ගිය 2014.07.30 වැනි දා මැතිවරණ කොමසාරිස්තුමා විසින් සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට, සියලුම කැබිනට් අමාත්‍යවරුන්ට, ඌව පළාත් සභාවේ හිටපු සියලුම අමාත්‍යවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට නිකුත් කළ ලිපියක්. එහි කියන්නේ මොකක්ද? "නාම යෝජනා කාල සීමාව තුළ කිසිදු අයුරකින් පෙළපාලි යාම, රැස්වීම් පැවැත්වීම, ප්‍රචාරක කටයුතු සිදු කිරීම වැනි ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වන ආකාරයේ ක්‍රියාවන් සිදු නොකිරීමට ඔබ පක්ෂයේ සියලු අපේක්ෂකයන්, ආධාරකරුවන් ඇතුළු සියලු දේශපාලන ක්‍රියාකාරීන් දැනුවත් කිරීමට ඔබ ක්‍රියා කරනු ඇතැයි ද, එවැනි නීති විරෝධී ක්‍රියාවන් වැළැක්වීමට පොලීසියට උපරිම සහාය ලබා දීමට ඔබ කාරුණික වනු ඇතැයි ද ඕනෑකමින් අපේක්ෂා කරමි." කියලා සඳහන් වෙනවා. එහි පස්වෙනි කරුණ හැටියට කියනවා, "යම් ලෙසකින් විභාග අපේක්ෂකයන්ට බාධා වන ලෙස කිසියම් දේශපාලන පක්ෂයක ක්‍රියාකාරීන් හැසිරෙන බව පෙනී ගියහොත් ඔවුන්ට එරෙහිව කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින් නීතිය ක්‍රියාත්මක කරන ලෙසද පොලිස් දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇති බවට කාරුණිකව සැලකරමි." කියලා. පෙළපාළි පවත්වන්න බැහැ. රැස්වීම් පවත්වන්න බැහැ. නාම යෝජනා භාර දීමෙන් පසුව සාමාකාමීව හැසිරෙන්නට ඕනෑ. එහෙම සිදු වුණේ නැත්නම් තදින් ක්‍රියාත්මක වන්න පොලීසියට උපදෙස් දීලා තිබෙනවා කියලා සඳහන් වෙනවා.

හැබැයි, ඊයේ සිදු වූයේ මොකක්ද? මේක හරිම බරපතළ තත්ත්වයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාම යෝජනා භාර දීම අවසන් වූ දිනය වන ඊයේ දිනයේ විශේෂයෙන්ම ආණ්ඩුව විසින් තොරා ගන්නා ලද මන්ත්‍රී කණ්ඩායමක් පෙළපාළි ගියා. එහෙත් අවාසනාවන්ත තත්ත්වය නම්, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමකුත් පෙළපාළි යාමයි. රටේ නීතියක් කෝ? ඒ විතරක් නොවෙයි. මහියංගනය ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායක අනුර විදානගමගේ මහියංගනයේදී නීති උල්ලංඝනය කරමින් නගරයේ දැවැන්ත ප්‍රචාරක කටවුට් සැරසිලි කර තිබුණා. මෙදින මහියංගනය, ගිරාඳුරුකෝට්ටේ පොලිසිවල නිලධාරීන් රාශියක් බදුල්ලේ රාජකාරිවලට කැඳවා තිබුණා. මහියංගනයේ නීති විරෝධී කටයුතු සොයාබැලීම සඳහා කුරුණෑගල සහකාර මැතිවරණ කොමසාරිස් නාමල් තලංගම සහ කෑගල්ල සහකාර මැතිවරණ කොමසාරිස් ඇතුළු කණ්ඩායමක් යවා තිබුණා. ඔවුන්ට පොලිස්

> මැතිවරණ නිලධාරීන් ළඟ විඩියෝ කැමරා තිබුණා. ඒගොල්ලො මේ පෙළපාලිය වීඩියෝ කළා. මොකක් ද සිදු වුණේ. එහිදී නිලධාරීන් පොලීසියට දුන් කට උත්තරයේ මෙහෙම සඳහන් කරනවා."වාහන අතර පී.එස්.ඩී. එකට අයත් වාහන දහයක්, දොළහක් පමණ තිබුණා."

නිලධාරීන් හතර දෙනකු සහ සිවිල් ආරක්ෂකයින් පමණක් ලබාදී තිබුණා. පොලීසියෙන් පෙළපාළි නැවැත්වීමට මීගහකිවුල හා ලොක්ගල්ඔය බැරියර්ස් දෙකක් දමා තිබුණා. පෙළපාළි යන්න දෙන්නේ නැහැ කියළා තිබුණා. බැරියර්ස් දමා තිබුණා. වෙනත් දිස්ත්‍රික්කවලින් සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් කැඳවා තිබුණා. මොකක්ද සිදුවුනේ. ලොක්ගල්ඔයදී පෙරකී නිලධාරීන්ට තේනුක විදානගමගේ මහතාගේ රථ පෙළපාළිය හමුවෙනවා. වාහන එකසිය විසිපහක් පමණ තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්ක නායක තමුන්නාන්සේලාගේ පක්ෂයේ නිමල් සිරිපාල ද සිල්වා ඇමති තුමා සාක්ෂි දරනවා. අහලා බලන්න. පෙළපාළි යන වාහන නවත්වන ලෙස පොලිසිය අණ දුන්නත්, මුලින් පැමිණි වාහන නොනවත්වා ධාවනය කර තිබුණා. මැතිවරණ නිලධාරීන්ගේ බල කිරීම මත පොලීසිය පාරට පැමිණ මැදකදී, වාහන නවතාගෙන තිබුණා. ඉන්පසුව මැතිවරණ නිලධාරීන් එම වහාන හා අංක වීඩියෝ කළා. ඒගොල්ලන් ළඟ විඩියෝ කැමරා තිබුණා. ඒගොල්ලො මේ පෙළපාලිය වීඩියෝ කළා. මොකක් ද සිදු වුනේ. එහිදී නිලධාරීන් පොලීසියට දුන් කට උත්තරයේ මෙහෙම සඳහන් කරනවා."වාහන අතර පී.එස්.ඩී. එකට අයත් වාහන දහයක්, දොළහක් පමණ තිබුණා."

ජනාධිපති ආරක්ෂක ඒකකයේ වාහන මැතිවරණ පෙළපාළියක තිබෙන්නේ කොහොමද? පී.එස්.ඩී එකට අයත් වාහන 10 කට 12කට වැඩි ප්‍රමාණයක් තිබිලා තියෙනවා.

"එම වාහන ඇතුලේ ජනාධිපති ආරක්ෂක අංශයට අදාල නිළ ඇඳුම් ඇඳගත් පිරිස් සිටියා." කියලා ඔවුන් කියා තිබෙනවා. මේ රටේ නීතිය ආරක්ෂා වෙන්නේ කොහොමද. ඒ විතරක් නොවෙයි. පෙළපාළිය නවතා ඇතිබව දැනගත් අනුර විදානගමගේ හා තේනුක විදානගමගේ මන්ත්‍රීවරයා පැමිණ තලංගම මහතාට අසභ්‍ය වචනයෙන් බැන වදිමින්, "තෝ කොහේ හිටියත් මරනවා" යයි මරණ තර්ජන එල්ල කළා. මෙහෙම කියන්නේ, මැතිවරණ රාජකාරී සඳහා ගිහින් සිටි නිළධාරී තුමාට.

එතැනින් නතර වෙන්නේ නැහැ. ඒ අය අත තිබුණු කැමරා උදුරාගෙන ඒවායේ ඡායාරූපගතකර තිබුණු සියල්ල මකලා දැම්මා. ඩිලීට් කලා. තර්ජනය කරලා ගියා. අන්තිමට මොකද වුණේ. මේ නිළධාරීන් වෙනත් පාරකින් බදුල්ලට ගිහිල්ලා පොලිසියට පැමිණිලි කළා. බදුල්ල පොලිසියේ මේ පැමිණිලි සියල්ල තිබෙනවා. සොයලා බලන්න. දැන් මොකක්ද මේ රටේ නීතිය. මම අධිකරණ ඇමති තුමාගෙන් අහන්නේ ඒකයි. මොකක්කද මේ කරන්න හදන්නේ. මැතිවරණය පටන් ගන්න කොටම, නාම යෝජණා දුන්න දිනයේදීම ජනාධිපති ආරක්ෂක අංශය කොහොමද මහියංගනයට යන්නේ. පෙළපාළි යන්නේ? මොකක්ද, මේ කරමින් සිටින්නේ?

මම කියන්නේ ඒකයි. මේ රටේ නීතියක් හැදුවා නම්, ඒ නීතියට අනුව කව්රුත් ඊයේ නාම යෝජණා භාර දිය යුතුව තිබුණා. ඒ නීතිය කඩන්න උපදෙන් දෙන්නේ කව්ද? ඉහළින්ම නේ. ඒ සඳහා වාහන යවනවා නම්, පිරිස් යවනවා නම්, පෙළපාළි යනවා නම් මොන තත්වයටද මේ රටේ නීතිය 15වැනි පිටුවට

අගෝස්තු 05

# දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වෙනම රස්සාවක් කරන්න වෙලා



පාර්ලිමේන්තු මන්ත්‍රී

## සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

(වසර මැද මූල්‍ය තත්වය පිළබඳ විවාදයට එක්වෙමින්)

අද අපි කථා කරන්නේ වසර මැද ආර්ථිකය පිළිබඳව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වාර්තාව. මෙම වාර්තාව 2003 මූල්‍ය කළමණාකරණ (වගකීම්) පනත යටතේ ආපු වගකීමක් හැටියටයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්නේ. මෙහි හරයාත්මකභාවය ගත්තොත්, වසර මැද ආර්ථිකය වටිනේ කාටද? පළමුවැනිම දේ තමයි මේ ආර්ථිකය ඇතුළේ සංවර්ධනය වෙන්න ඕනෑ. මේ ආර්ථිකය ඇතුළේ ගොනැගෙන්න ඕනෑ. මේ ආර්ථිකය ඇතුළේ දියුණු වෙන්න ඕනෑ ජනතාවගේ ජීවිතය. දෙකෝටි හැත්තෑ පන්ලක්ෂයක් වන අපේ රටේ ජනතාවගේ ජීවත්වීම තමයිමේ ආර්ථිකයේ අරමුණ බවට පත්වෙන්න ඕනෑ. මෙම වාර්තාවේ බෙහෝ හරබර ආර්ථික විද්‍යාත්මක යෙදුම් තිබෙනවා. ගණිතමය සූත්‍ර තිබෙනවා. ඉලක්කම් තිබෙනවා; ප්‍රස්ථාර තිබෙනවා. හැබැයි ඒ එකකින්වත් අපේ සාමාන්‍ය ජනතාවගේ ආර්ථිකය වර්ධනය කර තිබෙනවාද? සාර්ථක කර තිබෙනවාද? ඒකේ මිනුම් දණ්ඩක් මේකේ තිබෙනවාද? මම ඒ ගැන යමක් කියන්න ඕනෑ.

මේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ දත්තවලින් අපට පේන්නේ නැහැ තමුන්නාන්සේලා සාක්ෂාත් කර ගත්තා කියලා අපේ රටේ ගොවි ජනතාවගේ ජීවිතය වයපත් කිරීමේ පැත්ත;ධීවර ජනතාවගේ ජීවිතය යහපත් කිරීමේ පැත්ත; කාන්තාවන්ගේ සහ දරුවන්ගේ අධ්‍යාපනය; සෞඛ්‍ය හා ප්‍රවාහනය පැත්ත. ඒවා දියුණු වුණා කියලා අර්ථ කථනයක් ගන්නනට, මොන වචනවලින් මේ වාර්තාව කියෙව්වත් පුළුවන්කමක් නැහැ. අපි තමුන්නාන්සේලාට කියනවා පුළුවන් නම් ඒක පෙන්වන්න කියලා. මම ඒක එහෙම නැහැ කියලා ඔප්පු කරනවා. නමුත් ඒ වෙනුවට මේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව 2014හි මේ වාගේ දෙයක් පෙන්වනවා.

මෙම වාර්තාවේ පළමුවෙනි පිටුවේම රාජ්‍ය මූල්‍ය ආංශයේ රාජ්‍ය ණය සම්බන්ධව සඳහන්ව තිබෙනවා. 2013මාර්තු අවසානය වනවිට රාජ්‍ය ණය තිබුණේ රුපියල් මිලියන 6,322,478යි. 2014වනවියට එය වැඩි වෙලා තිබෙනවා රුපියල් මිලියන 7,184,625 දක්වා. මේ රුපියල් බිලියන 7,184,625 මම දෙකෝටි පන්ලක්ෂයේ ජනගහනයෙන් බෙදුවා. ඒ රාජ්‍ය ණය ප්‍රමණය දෙකෝටි පන්ලක්ෂයේ ජනගහනයෙන් බෙදන විට මොකක්ද වෙලා තිබෙන්නේ? අද අපේ රටේ උපදින හැම දරුවක්ම මේ ණය බර නිසා රුපියල් 351,000ක ණයකාරයෙක් වෙලා තිබෙනවා. ගිය වසර මැද සිට මේ වසර මැද වනවිට ඊක පුද්ල ණය බරේ වැඩිවීම රුපියල් 43,107යිගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කයනිනේ 2013 වසර මැද වනවිට එක පුද්ගලයකුගේ ණය බර තිබුණේ රුපියල් 316,000යි. 2014වසර මැදවන විට ඒ ණය බර රුපියල් 359,000දක්වා වැඩි වුණා. එතකොට තමුන්නාන්සේලාගේ සංවර්ධනය වෙනුවෙන්, ඔය ඊනියා සංවර්ධනය වෙනුවෙන්, -මම හය නැතිව එහෙම කියනවා මොදක මේක ජනතාවට බලපාන්නේ

> දළදා මාළිගාව ළඟ කාර් රේස් පදින්න දවසකට රෑට රුපියල් ලක්ෂ 200ක් ඕනෑ. අපේ සමහර ඇමතිවරුන්ගේ ලයිට් බිල ගෙවන්න මාසයකට රුපියල් 143,000ක් ඕනෑ. ඒවාට වියදම් දරන්න සිදුවන නිසා නිදහස් අධ්‍යාපනය පවත්වා ගෙන යන්න අපට බැහැ. ඒ නිසා අධ්‍යාපනයේ බර අපි දෙමව්පියන්ගේ කර මත තබනවා. එය බාර ගනිල්ල." කියලා කියන්න. එහෙම කිවුවාට පස්සේ දෙමව්පියන් තීරණය කරව් මේ ආණ්ඩුවත් එක්ක මේ රටේ ජනතාව ඉන්නවාද නැද්ද කියලා.

නැති සංවර්ධනයක්. කොමිස් ගහන්න හොරකම් කරන්න, වංචා කරන්න, හගඩි ගහන්න බලපාන සංවර්ධනයක්. ඒක ජනතාවට බලපාන්නේ නැති සංවර්ධනයක්. හැම පුරවැසියෙක්ම 2013 වසර මැද සිට 2014 වසර මැද වනවිට රුපියල් 43,107ක ණයකාරයෙක් බවට පත් කරලා තිබෙනවා. මේක තමයි ආර්ථිකයේ තත්වය. ජනගහනයට, ජනතාවට ඒක අදාළ කරන්න බැරි වෙලා තිබෙන්නේ, බලපාන්නේ නැත්තේ ඇයි කියලා මම කියන්නම්.

මේ වාර්තාවට අනුව, අධ්‍යාපනයට කළ මුදල් වෙන්කිරීම ගැන සලකා බලන විට අධ්‍යාපනයේ ගාස්තු ගෙවීම්, ඒ කියන්නේ පාසැල් සංවර්ධනය සඳහා අඩුම අඩු වියදම් ප්‍රමාණයක් තමයි තමුන්නාන්සේලා පෙන්නුම් කරන්නේ. ඒ සඳහා හේවතුවක් තිබෙනවා. ඒ හේතුව මම ඉලක්කම්වලින්ම පෙන්නන්නම්. වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව 2014හි 3.14වගුව අනුව අධ්‍යාපනය අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල වියදම්, මුලු වර්තන වියදම් ලෙස රුපියල් මිලියන 44,898ක් තිබෙනවා. ඒ යටතේ, 2013ජනවාරි-අප්‍රේල් ද්කවා රුපියල් මිලියන 2.195ක්ව තිබුණු අනෙකුත් සේවා සැපයුම් වියදම් වියදම 2014 ජනාවරි -අප්‍රේල් දක්වා රුපියල් මිලියන 2,195ක් වියදම් කළ තමුන්නාන්සේලා රුපියල් මිලියන 669 දක්වා අඩු කරගෙන තිබෙනවා. ඒ කියන්නේ 2013 අවුරුද්දේ ජනවාරි-අප්‍රේල් දක්වාරුපියල් මිලියන 2,195ක් වියදම් කළ තමුන්නාන්සේලා දැන් මේ අවුරුද්ද වන විට වියදම් කරන්නේ රුපියල් මිලියන 669යි. බොහොම සාර්ථකයි. එහෙම වෙන්න හේතුව මොකක්ද? හේතුව තමයි තමුන්නාන්සේලා අද අධ්‍යානයේ බර සම්පූර්ණයෙන් දෙමව්පියන් වත පටවා තිබීම. අපේ අධ්‍යාපන ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී අවස්ථා ගණනාවකදී කිව්වා, පහසුකම් ගාස්තු හැර දරුවන්නේ දෙමව්පියන්ගෙන්-වෙනත් ගාස්තු අය කරන්න පාසැල්වලට අයිතියක් නැහැ කියලා. නමුත් ද වෙනකොට සාමාන්‍ය පෙළ පන්තියේඉන් ළමයා ඒ පාසලේම උසස් පෙළ පන්තියට යන කොට ගාස්තු අයකරනවා. බොහොම වගකීම්සහගතව. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට පුළුවන් නම් "එහෙම කරන්නේ නැහැ"කියලා කියන්න. මා එය ඔප්පු කරනවා. සුළු ගණනක් නොවෙයි, අය කරන්නේ.

අද සාමාන්‍ය පෙළ පන්තියේ ඉගෙන ගන්නා ළමයාට සාමාණ්‍ය පෙළ පන්තියේ ඉඳලා ඒ විභාගය සමත් වෙලා උසස් පෙළ 15වැනි පිටුවට

## කවුළුව හැර තබමි

# ලොකුම 'හොරා' කවුද?



රුපියල් කෝටියක කප්පමක් ඉල්ලා පසුගියදා පැහැරගෙන ගිය මීගලෑවේ යසේන් දරුවාගේ සිද්ධිය රට තුළ මහත් ආන්දෝලනයක් ඇති කළේය. කප්පම්කරුවන් එම දරුවා පැහැරගෙන ගියේ කප්පම් ගන්නටය. පසුව අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් මහත් වෙහෙසක් දරා එම දරුවා සොයා ගන්නා ලදී.

එම සිද්ධියේ දෝංකාරය දැන්නම් මැකී ගොස්ය. අපි කථා කරන්න යන්නේ එම සිද්ධිය ගැන නොව එම සිදුවීම තුළ රඟ දුන් විශේෂ නාටකයක් ගැනය. එහි ප්‍රධාන නළුවා රටේ ජනාධිපතිවරයාය. නැතිනම් මහාරජාණෝය. ඔහු වරක් කීවේ තමන් මුළු රටේම දරුවන්ගේ ආඩම්බරකාර තාත්තා කියාය.

මේ ආඩම්බරකාර තාත්තා පැහැරගෙන ගිය දරුවාව සොයා ගත් පසු ඔහුගේ මව්පියන්ද සමඟ අරලියගහ මන්දිරයට ගෙන්වා ගත්තේය. දරුවා ඔඩොක්කුවේ තියාගෙන හුරතල් කළේය; දුක සැප ඇසුවේය; මුළු රටේම මව්පියන්ගේ සිත්පැහැර ගැනීම සඳහා අර දරුවා පාවිච්චි කළේය. ඔහු තම ඔඩොක්කුවේ තියාගෙන නැලවූයේ අර දරුවා නොව තම දේශපාලන වුවමනාව බව තේරුම් ගත්තේ මේ රටේ කීයෙන් කී දෙනාද? ප්‍රශ්නය ඇත්තේ එතනය.

රටේ සිදුවන මෙවැනි ඕනෑම සිදුවීමක් තම දේශපාලන වාසියට හරවා ගැනීමට මේ රටේ ජනාධිපතිවරයා තරම් දක්ෂයෙකු ලොව කිසිම රටක නැත.

තම පටු පවුල්වාදී දේශපාලන වුවමනාවට රටේ මිනිසුන්ගේ සිත් පැහැර ගැනීම අර දරුවා පැහැර ගැනීමටත් වඩා බරපතළ කාරණාවකි. එය බරපතළව සිතිය යුතු කරුණකි. මෙතරම්ම දරුවන්ට ලෙන්ගතු තාත්තා කෙනෙකු රජ කරන රටක දිනකට නූපන් දරුවෝ 800ක් ගබ්සා කෙරෙති. රටේ දරුවන්ගෙන් 1/3ක් මන්දපෝෂණයෙන් පෙළෙති. දරුවන්ගේ අධ්‍යාපනය දිනෙන් දින වළපල්ලට ඇදී යයි. උන්ගේ කිරිපිටි ටිකට බදු පිට බදුය. කසාද බඳින විටත් බදු ගහන රටේ තව ටික දිනකින් උපදින දරුවාටද බද්දක් ගසනු ඇත. දැනට ඉතිරිවී ඇත්තේ එබඳු බදු කිහිපයක් පමණි.

ඒ අනුව බලන විට අර කප්පම්කරුවන් පැහැර ගත්තාටත් වඩා බරපතළ පැහැර ගැනීමක් රටේ මහතැන විසින් සිදුකර ඇත. රටේ ජනතාවගේ සිත් පැහැර ගැනීම සඳහා ඒ දරුවාව නැවත පැහැරගනු ලැබ ඇත. ඒ රටේ මහරජා විසිනි. ඒ දරුවා පැහැරගෙනු ලැබිණි. වරෙක කප්පම්කරුවන්ය. අනෙක් වර මහරජාය. මේ දෙන්නාගෙන් ලොකුම 'හොරා' කවුදැයි තීරණය කිරීම ඔබ සතුය.

# ඉතිහාසය විසින් අප නිදොස් කරනු ඇත



88-89දී මෙරට මිනී කනත්තක් විය. එවකට පැවති එජාප ආණ්ඩුව තම තරුණ සංහාරය සාධාරණීකරණය කරගනු පිණිස බොහෝ අපරාධ දැමුවේ ජ.වි.පෙ. පිටය. ප්‍රේමකීර්ති ද අල්විස් ඝාතනය වැනි රටේ ජනප්‍රිය පුද්ගලයින්ගේ ඝාතනද ආණ්ඩුව විසින් ජ.වි.පෙ. ගිණුමට බැර කරන ලදී. එහෙත් දැන් සැබෑ තත්වය හෙළිදරව් වෙමින් ඇත. ඒ සාක්ෂි ලබා දෙන්නේ ඉතිහාසය විසිනි. ඉතිහාසයේ සාක්ෂිය කිසිවෙකුටත් බොරු කළ නොහැකිය.

ප්‍රේමකීර්ති මහතාගේ බිරිඳ 'ප්‍රේමකීර්තිනී' කෘතිය මගින්ම තම සැමියා මැරුවේ කවුද? කිනම් වුවමනාවකටද යන්න සාක්ෂි ඇතුවම පෙන්වා දී හමාරය. පසුගියදා ප්‍රේමකීර්ති ද අල්විස් නමින් පාරක් විවෘත කිරීම හා සමගාමීව ජ.වි.පෙ.ට මඩ ගැසීම සඳහා ආණ්ඩුව විසින් සංවිධානයක කරන ලද ප්‍රදර්ශනයකදී එම කෘතිය ජනාධිපතිවරයාට දෙන ගමන් ඇය ඔහුට පවසා සිටියේ 'මගේ මහත්තයා මැරූ මිනීමරුවා දැන් ඉන්නේ ඔබේ සෙවණේ' කියාය. එය ඓතිහාසික සාක්ෂිය ඉදිරියේ සියලු බලධාරීහු තක්බීර් වූහ. ආණ්ඩුවට කටඋත්තර නැත.

1971 අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා නඩු විභාගයේදී එදා රෝහණ විජේවීර සහෝදරයා සිය සාක්ෂියේදී මෙවැනි ප්‍රකාශයක්ද කළේය. එනම් "ඉතිහාසය විසින් අප නිදොස් කරනු ඇත." යන්නයි. ඒ අද එය පැහැදිලි සත්‍යයක් බවට පත්වී ඇත.

# මව් කුස වධකාගාරයක් වූ කල!



මේ ආශ්චර්යමත් රටේ තවත් ආශ්චර්යමත් පුවතක් පසුගිය ඉරිදා පුවත්පතක පළවී තිබුණි. එනම් දිනකට අප රට තුළ නූපන් දරුවන් 800ක් මරා දමන බවය; එනම් ගබ්සා කරන බවය. මෙය මවිතය දනවන කරුණක්ම වන්නේ රටේම දරුවන්ගේ 'ආඩම්බරකාර තාත්තා' රටේ සිටින රටේ මෙය සිදු වීම නිසාය. දරුවන් වැදීමට අයිතියක් තිබිය යුතුවාක් මෙන්ම දරුවන් හැදීමටද අයිතිය තිබිය යුතුය. ඉහත සිදුවීමෙන් පෙනෙන්නේ දැන් අපේ රටේ මව්වරුන්ට දරුවන් වැදීමේ අයිතියද අහිමි වී ඇති බව නොවේද? දරුවන් නොමරා ජීවත්කරවීමට තිබෙන ආර්ථික ශක්තිය මිනිසුන්ගෙන් උදුරාගෙන ඇති බව නොවේද? මෙම කරුණ බරපතළ සමාජ ගැටලුවක් ලෙස රටේ කිසිදු බලධාරියෙකුගේ සැලකිල්ලට ලක්වී ඇති බවක් නොපෙනේ.

දිනකට 800ක් යනු මසකට 24,000කි. මසකට 24,000ක් යනු අවුරුද්දකට 288,000කි. උපදින්නට සිටින දරුවන් අවුරුද්දකට දෙලක්ෂ අසූදහසක් මරා දමන රටක්. මොන තරම් ආශ්චර්යයක්ද?

මෙය දැන් ලංකාව උපතේ සිට විපත දක්වාම මිනිසුන් මරා දමන රටක් බවට පත්වී හමාරය. ජීවත් වන මිනිසාවද දිනෙන් දින පැයෙන් පැය මරා දමයි. බඩු මිල, බදු බර දඩ ගැසීම්, අයකිරීම් කෙළවරක් නැත. උපතේ සිට විපත දක්වාම බදුය. දඩය. ඉතිං මොන කරුමයකට මේ රටේ දරුවන් හදන්නේදැයි මිනිසුන්ට හිතෙන්නට ඉඩ ඇත. එවන් ලොවකට බිහිකරනවාට වඩා මරණය සැපයයි ඔවුන් සිතනවා විය හැක. අනාගත දරු පරම්පරා හතකටත් ගෙවා ගැනීමට බැරි තරම් රට ලෝකයට ණය කර ඇති පාලකයෝ ඒ ණයවලින් තම දරුවන් පිනවීමට සැණකෙළි පවත්වති.

සදහටම දරුවන් හැදීම රටේ මව්පියන් විසින් නවතා දමනු ලැබුවද මෙහෙව් පාලකයන්ට නම් එයද ගණන්ගත යුතු දෙයක් නොවේ.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක බර අඩි තියල පංතියට ආවෙ හිනාවක් කටේ ගාගෙන.

"ආයුබෝවන් සර්" වසන්තිය ඉස්සර වුණා.

"ගුඩ් මෝනිං ළමයිනේ" පොලිටික්ක හිනා කටින්ම කිවුව.

"සර්ට ස්වීප් එකක් ඇදිල වගේ... හිනා කටයි මල් දෙකටයි," කනිය මංජුව අතරෙ සතර කන් මන්ත්‍රණේ පංතියෙ වැඩිකොටසකට ඇහුණා.

"ඔව් ඔව්... අදනම් සර් විශේෂයක් තියෙනව." අනුරුද්දිය සද්දෙටම කියල දැම්ම.

"ඔය ළමයින්ට වෙනසක් පේනවද?" පොලිටික්ක අගේ වැඩුව. "මට සතුටකට වඩා තියෙන්නෙ ආඩම්බරයක්." පොලිටික්ක කතාව පටන්ගන්න කොණක් පාදනව.

"සර්ට ප්‍රොමෝෂන් එකක් වගේ." මංජුව උපකල්පනයක් කළා.

"ළමයිනේ මේක මට නෙමෙයි, රටට ප්‍රමෝෂන් එකක්." පොලිටික්ක ඔළුව වටේ අත දානව නහය අල්ලන්න.

"ඇයි ජිනීවා කමිටුව පරීක්ෂණේ අතඇරලද?" චමිය ඇහුවට ප්‍රශ්නෙ සමනගෙ.

"විහිළුවට ගන්න එපා ළමයිනේ. මේක ලෝකෙට ලොක්කන්ට උණ ගැනෙන වැඩක්" පොලිටික්ක අහසෙ.

"ඉබෝලා ලංකාවට ඇවිත්ද සර්?" කනිය ඇහුවෙ ඉබෝලා කියල උණක් ගැන මතකෙට.

"මරු කියෝනව" පොලිටික්ක මල පැන්නා. එත් දුර බලල අකුළගත්ත. "ළමයිනේ ඔයගොල්ලො බුද්ධිමත් ළමයි."

"ඉතින් කියන්නකො සර්." වසන්තිය කතන්දරේට සෙට් වෙලා.

"මම කිවුවෙ ළමයිනේ, ජනාධිපතිතුමා පලස්තීනෙ මිනිස්සුන්ට ඩොලර් මිලියනයක් දුන්න. අපිට... මං කිවුවෙ රටට ආඩම්බරයක් නෙමෙයිද?" පොලිටික්ක හිත හිත හිටපු බිත්තරේ දැම්ම.

"පොලියටද... නිකංද සර්?" චමිය ඇහුවෙ ආඩම්බර වෙන්න ඕනෙ ඇයි කියල හරියටම දැනගන්න.

"චික්...අර අහිංසකයින්ට පොලියට දෙන්න පුළුවන්ද?" පොලිටික්ක කේන්තිය යට කරගෙන කිවුව.

"අයියෝ...සර් පොලියට නෙමෙයිද? අපි ආඩම්බර වෙන්න ඕනෙ තේරුමක් නැතුවද?" චමිය බන්දු සමරසිංහව උපුටනව.

"පලස්තීනෙට සල්ලි දෙන්න වුණේ මෙහෙ මුස්ලිම් මිනිස්සු සන්තෝස කරන්න නෙමෙයිද සර්? ජාතිවාදියො. ආගම්වාදියො අවුස්සල කරපු දේවල් වහන්න නෙමෙයිද?" සමනගෙන් හරස් ප්‍රශ්න.

"නැහැ, ඒ මොකකටවත් නෙමෙයි සමන්. පලස්තීනෙට ජනාධිපතිතුමාගෙ සහයෝගය පෙන්නන්න." පොලිටික්ක කිවුවෙ ජනාධිපති ලේකම් වගේ. "එතුමා පලස්තීන සහයෝගිතා සංවිධානෙ හිටපු සභාපති කෙනෙක්නෙ."

"දැන් ජනාධිපතිතුමා පලස්තීනෙට සල්ලි දුන්නා. ආධාරයක් විදිහට. මිනිස්සු මාස ගාණක් වතුර නැතුව දුක්විඳිද්දි පොලියට සල්ලි අරන් පලස්තීනෙට නිකන් දුන්න. මෙහෙ මොකද මැදමුලනෙන් ගෙනාපුවද? රටේ මිනිස්සු එපායෑ ඕව හොයල දෙන්න." සමන ෂෙල් වෙඩිල්ලක් පත්තු කළා.

"සමන්, ජනාධිපතිතුමාගෙ හදවත... උණු..." පොලිටික්ක මොකද්ද කියන්න වචන එකතු කළා.

"මොන බොරුද සර්. පලස්තීනෙට ඊශ්‍රායලේ බෝම්බ දාල මෙච්චර මිනිස්සු මැරෙනකොට විදේශ අමාත්‍යාංශෙන් පලස්තීනෙවත් ඊශ්‍රායලේවත් නම කියන්නෙ නැතුව කොන්ද පණ නැති නිවේදන දානව. රටක් විදිහට ලැජ්ජ නැති වැඩ නේද? ඒව රටේ සල්ලිවලින් වහන්න පුළුවන්ද?" සමන කියාගෙන යනව.

"ලෝකෙට පරකාසෙ...ගෙදරට මරගාතෙ" මංජුව බෝලෙ උස්සල දෙනව.

"මාලදිවයිනේ පාරවල්වලට කාපට් දැම්ම. උගන්ඩාවට බොන්න වතුර දෙන්න ඩොලර් මිලියන 150ක් දුන්න. මේව ලෝකෙට ලොක්කන්ට උණ ගැනෙන වැඩ නෙමෙයි; එදාවේල හොයාගෙන කන අපිට උණ ගැනෙන වැඩ." සමන කියනකොට ළමයින්ගෙ හිනා සද්දෙට පොලිටික්ක දත්මිටි කන සද්දෙ ඇහුණෙ නැහැ."

13 පිටුවෙන්

## ජනාධිපති ආරක්ෂක ඒකකයේ...



පත්කරමින් තිබෙන්නේ?

අධිකරණ ඇමති තුමනි, නීතිය ගැන මේ පාර්ළිමේනතුවේ කථා කළොත් ඔබ තුමාට නේ වගකීම එන්නේ. ඔබ තුමාට වගකීම් ආවාට ඉතින්, වගකීම විතරම තමයි. වෙන මොකවත් නැහැ. හැබැයි දැන් ඔබ තුමා මොකක්ද මේ කරන්නේ? අපි දැන් නීතිය හදලා වැඩක් තිබෙනවාද? ඒ නිළධාරීනට බලය දීලා වැඩක් තිබෙනවාද? පාර්ළිමේන්තුවේ සම්මත කර තිබෙන නීතිය අනුව මැතිවරණ කොමසාරිස්වරයාට බලය ලබා දීලා තිබෙනවා. ඒ බලයට අනුව කටයුතු කරන්න හදනවා. ඒත් කටයුතු කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඒවාට තර්ජනය ආවාට පස්සේ ඔහු ඒවා වහනවා. මම වගකීමෙන් කියන්නේ, තමන්ගේ පහළ නිළධාරියකුට මරණ තර්ජන එල්ලකර තිබෙනවා නම් ඒ ගැන මොකක්ද කරන්නේ කියලා මැතිවරණ කොමසාරිස්වරයා අපි බගාපොරොත්තු වෙනවා.

ඒ නිසා මේ පිළිබඳව විශාල ලෙස අවධානය යොමුකරලා කටයුතු කළ යුතුයි කියන ස්ථාවරයක අපි ඉන්නවා. හෙට මැතිවරණ කොමසාරිස්වරයා හමුවෙලා ඒ පිළිබඳව දැනුම් දෙන්නත් බලාපොරොත්තු වෙනවා. අපේ පක්ෂයෙන් අපි දැනටමත් ලිපියක් යවලා තිබෙනවා. මේ පිළිබඳව පාර්ළිමේන්තුවේ අවධානය යොමුකරමින් මම නතර වෙනවා.

## දරුවන්ගේ අධ්‍යාපනය...



පන්තියට මාරුවෙනකොට ඒ නිවාඩු කාලයේදී රක්ෂාවක් කරන්න වෙනවා, රුපියල් 9800ක් සොයා ගගන්න. කෝ, නිදහස් අධ්‍යාපනය? තමුන්නාන්සේලාගේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාවේ බොහොම අපූරුවට කියනවා. අධ්‍යාපනයේ අනෙකුත් සේවා සැපයුම් වියදම් රුපියල් මිලියන 2,129සිට රුපියල් මිලියන 669 දක්වා අඩු කළා කියලා. සාර්ථකයි, ඇමතිතුමා. කොහොමද, සාර්ථක වෙලා තිබෙන්නෙ? කොහොමද? අධ්‍යපනය සාර්ථක කර ගෙන තිබෙන්නෙ? මහින්ද චින්තනයෙන් අධ්‍යාපනයේ සම්පූර්ණ බර අද පටවා තිබෙනවා, දෙමව්පියන්ගේ කර මතට.

කල්පනා කරලා බලන්න. තමුන්නාන්සේලාගේ අධ්‍යාපන ප්‍රතිපත්තිය මේක නම්, ඒක කෙලින් කියන්න. ඒක මේ රටේ ජනතාවට කෙලින් කියන්න. "මොකද, අපට දළ දා මාළිගාව ලඟ කාර් රේස් පදින්න දවසකට රෑට රුපියල් ලක්ෂ 200ක් ඕනෑ. අපේ සමහර ඇමතිවරුන්ගේ ලයිට් බිල ගෙවන්න මාසයකට රුපියල් 143,000ක් ඕනෑ. ඒවාට වියදම් දරන්න සිදුවන නිසා නිදහස් අධ්‍යාපනය පවත්වා ගෙන යන්න අපට බැහැ. ඒ නිසා අධ්‍යාපනයේ බර අපි දෙමව්පියන්ගේ කර මත තබනවා. එය බාර ගනිල්ල." කියලා කියන්න. එහෙම කිව්වාට පස්සේ දෙමව්පියන් තීරණය කරවි මේ ආඩුවත් එක්ක මේ රටේ ජනතාව ඉන්නවාද කියලා. මේක තමයි, ඇත්ත තත්වය. මම මේ කිව්ව් එක උදාහරණයක් විතරයි. තමුන්නාන්සේලාගේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාවේ කියා තිබෙනවාද, නිදහස් අධ්‍යාපනයේ බර-අද සාමාන්‍ය පෙළ පන්තියේ ඉන්න ළමයා උසස් පෙළට යනකොට ඒ බර- දෙමව්පියන්ගේ කරමත තබා තිබෙනවා කියලා? එනම් ඒකත් මේ වාර්තාවේ තිබෙන්න ඕනෑ. මේකේ තිබෙන සියල්ලම පම්පෝරි; මේකේ තිබෙන සියල්ලම ආඩම්බර කතා. මේකේ තිබෙන කතා ඇහුවාට පසු සුරංගනා ලෝකයක් මවන්න පුළුවන්. ඇත්ත තත්වය මේ වාර්තාවේ නැහැ. අද අධ්‍යාපනයේ බර සම්පූර්ණයෙන්ම දෙමව්පියන්ගේ කරමත පටවලයි තිබෙන්නේ. දරුවෝ දෙන්නෙක් ඉස්කෝලේ යන දෙමව්පියන්ට තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වෙනම රක්ෂාවක් කරන්න සිද්ධවෙලා තිබෙනවා. කල්පනා කර බලන්න. සාධාරණද? අපි අහන්නේ ඒකයි. තමුන්නාන්සේලා ඒ බර සම්පූර්ණයෙන්ම දෙමව්පියන් මත පටවලා තිබෙනවා.

02 පිටුවෙන්

## විදෙස්ගත ලාංකික...

පිරුණු පසු ලබාගැනීමට හැකිවන ලෙස විශ්‍රාම අරමුදලක් ගොඩනගන බවයි. ඒ සම්බන්ධයෙන් අනුර දිසානායක සහෝදරයා පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කළ අතර ඩිලාන් පෙරේරා ඇමතිවරයා ලබා දුන්නේ බාල පිළිතුරක්. ඔහු සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපතිනියට දෝෂාරෝපණය කළත් විෂය භාර ඇමතිවරයා ලෙස කොරියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට ඒ පිළිබඳව සහතිකයක් ලබාදුන්නේ නැහැ. ඒ නිසා ගැටලුව විසඳිලා නැහැ.

● ඌව මැතිවරණ කටයුතුවලට විදේශ සේවා නියුක්ත කාර්යාශංයේ නිලධාරීන් යොදවාගෙන තිබෙනවා. ඩිලාන් පෙරේරා ඇමතිවරයා සෘජුවම අමාත්‍යාංශයේ දේපළ යොදාගනිමින් කටයුතු කරමින් තිබෙනවා. ඒ වගේම විදේශ රැකියා සම්බන්ධයෙන් ඉල්ලුම්පත්‍ර බෙදීමේ කටයුතුවලද, විදෙස් රැකියා ලබාදෙන බවට පවසමින් සම්මුඛ පරීක්ෂණද පවත්වන්න පුළුවන්කම තිබෙනවා. අපි ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ එවැනි කරුණු සම්බන්ධයෙන් අවධානයෙන් සිටින ලෙසයි."

සෞදි අරාබියේ ජෙඩා ප්‍රදේශයේ අත්අඩංගුවේ පසුවන පිරිසක් වෙනුවෙන් අත්අඩංගුවේ සිට සුරේෂ් මහතා විසින් දුරතනය ඔස්සේ මාධ්‍ය සාකච්ඡාවට සම්බන්ධ විය. එම සිද්ධිය සම්බන්ධයෙන් පැහැදිලි කරන එතෙර අපි සංවිධානයේ භාණ්ඩාගාරික නීතිඥ ජානක අධිකාරි සහෝදරයා මෙසේ පැවසීය.

"සෞදි අරාබියේ ජෙඩා ප්‍රදේශයේ ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් ලංකාවේ පිරිමි 37ක් සහ කාන්තාවන් 13 දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඔවුන් තමන් කරන රැකියාවේ අසීරුතාවයන් නිසා පලා ආ පිරිසක්. ඔවුන් ශ්‍රී ලංකාවෙන් යවා තිබෙන්නේ නිශ්චිත කාර්යයකට වුවත් සෞදි අරාබිය තුළදී ඔවුන්ට ලබාදී තිබෙන්නේ වෙනත් රැකියාවන්. උදාහරණයක් විදියට ගත්තොත් රියදුරු රැකියාවට ගියපු ඇතැම් පුද්ගලයින්ට පැවරී තිබෙන්නේ කුකුල් කොටු නැත්නම් එළු කොටුවල වැඩ කිරීමටයි. පොරොන්දු වුණු වැටුප ලැබී නැහැ. එනිසා ඔවුන් මේ වනවිට විශාල අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ඔවුන් වෙනුවෙන් මැදිහත් විය යුතු තානාපති කාර්යාලවල සේවක මණ්ඩලවන කාර්යභාරය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. එම ගැටලුවලදී මැදිහත් වනවිට අරාබි භාෂාව ඉතාම වැදගත්. නමුත් තානාපති කාර්යාලයේ නිලධාරීන්ට අරාබි භාෂාව පිළිබඳව දැනුමක් නැහැ. බොහෝ අය දේශපාලන හිතවතුන්. ඔවුන්ගේ මැදිහත්වීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ වගේම සෞදි අරාබියට යන සේවකයින් එළඹෙන ගිවිසුම් සම්බන්ධයෙන් නියාමනය කිරීමට ක්‍රමවේදයක් ගොඩනැගී නැහැ. ඒ සම්බන්ධයෙන්ද මේ වනවිට තානාපති කාර්යාලවලට විශාල චෝදනාවක් එල්ල වී තිබෙනවා."

16 පිටුවෙන්

## ආර්ථිකයේ ප්‍රතිලාභ...

ආදායම වැඩිවෙලා කියලා. රටක ආර්ථිකය නැගලා නම් එහි ප්‍රතිඵල රටේ ජනතාවට ලැබෙන්න ඕනෑ. නමුත් ඇත්ත මොකක්ද? කඩේ මුදලාලි කියනවා බිස්නස් බැහැලා කියලා. බඩු මිල වැඩිවෙලා; ගොවි අම්ම තාත්තට එක කන්නයක් ගොවිතැන් කරලා ඊළඟ කන්නය වෙනකල් ඒ ආදායමෙන් ජීවත් වෙන්න බැරිවෙලා තිබෙනවා. ඉගෙන ගත්ත, විභාගයක් පාස් කරපු දුවා දරුවන්ට රස්සාවක් නැහැ. ආණ්ඩුවේ රෝහල්වල බෙහෙත් නැහැ. පාසල්වල ගුරුවරුන්ට පඩි ගෙවන එක ඇරුණාම අනෙක් සියලු දේම කරන්න සිදුවෙලා තිබෙන්නේ දෙමව්පියන්ට. ඇතැම් ගම්වල ගුරුවරුන්ටත් පඩි ගෙවන්නේ දෙමව්පියො. අධ්‍යාපනයේ මුදල් කපලා. ඉතිං මහින්ද මහත්තයලා, සොයිසා ඇමතිලා කියනවා ආර්ථිකේ නැගලා කියලා. ආර්ථිකේ නැගලනම් අධ්‍යාපනයට, සෞඛ්‍යයට මෙහෙම වෙන්නේ කොහොමද?

ආණ්ඩුවට බදු ගෙවන්න තමයි, ජනතාව මුදල් හම්බ කරන්නේ. මේ රටේ නායකයෝ ලැජ්ජා විය යුතුයි මෙවැනි තත්වයකට අපේ රට පත්කළාට. රුපියල් දාහක බඩුමල්ලක් ගත්තාම ඒකේ රුපියල් හයසීයක විතරයි බඩු තියෙන්නේ. අනෙක් රු. හාරසීයම බදු. ගිය අවුරුද්දේ අපි දාහක බඩුමල්ලක් ගත්තාම බදු තිබුණේ රුපියල් සීයක විතරයි. දැන් ඒක හාරසීය දක්වා රාජපක්ෂ මහත්තයා බදු වැඩි කරලා තියෙනවා. වෙනස් කරන්න ඕන නැද්ද මේ පාලනය. අපි පොරොන්දු වෙනවා ජනතා විමුක්ති පෙරමුණු පාලනයක් යටතේ ආහාර පානවලට ගහන බදු ඉවත් කරලා මිල පහත දානවා කියලා. අධ්‍යාපන ඇමති කියනවා වයිමටවත් බඩු මිල අඩුකරන්න බැහැ කියලා. ඒත ජ.වි.පෙ. ආවොත් බඩු මිල අඩුකරනවා කියලා අපි වගකීමෙන් කියනවා." අනුර සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

03 පිටුවෙන්

## ජනතාවට ජයග්‍රහණ...



*ටිල්වින් සිල්වා සහෝදරයාඃ-*

ප්‍රථමයෙන් රාජපක්ෂ පාලනයේ මෙම ඒකාධිපති, ප්‍රජාතන්ත්‍ර විරෝධී දුෂ්ට ප්‍රයත්නය පැරදවීමට නම් ඒ පිළිබඳව විශාල ජනමතයක් සකස්කළ යුතු වෙනවා. රාජපක්ෂ පාලනයේ සැඟවුණු අරමුණු ජනතාවට හෙළිකළ යුතු වෙනවා. මෙම ඒකාධිපති පාලනයත් මෙවැනි ඒකාධිපතියන් බිහිකරන බංකොලොත් ධනේශ්වර ක්‍රමයත් දෙකම පැරදවිය හැකි සැබෑ ජනතා ව්‍යාපාරයක් ගොඩනැගිය යුතු වෙනවා. එම පුළුල් ජනතා ව්‍යාපාරයේ ජයග්‍රහණය මගින් මහින්ද රාජපක්ෂ මහතාත් ඒකාධිපති විධායක ජනාධිපති ක්‍රමයත් එවැනි ක්‍රමයකට උපත දුන් බංකොලාත් ධනපති ක්‍රමයත් පරදා සැබෑ ජනතාවාදී පාලනයක් ගොඩනැගීම සඳහා කටයුතු කළ යුතු වෙනවා. ජ.වි.පෙ. කටයුතු කරන්නේ ඒ අරමුණ වෙනුවෙන්.

**නියමුවාඃ- නමුත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා පොදු අපේක්ෂකයෙක් පිළිබඳ සාකච්ඡාවක් හා ඒ සඳහා වුණු විවිධ ව්‍යාපාරයන් සමාජය තුළ මතුවී තිබෙනවා. ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?**

**ටිල්වින් සිල්වා සහෝදරයාඃ-**

විධායක ජනාධිපති ක්‍රමය වෙනස්කොට ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීම සඳහා වූ ඉතාම වැදගත්, ඉතාම නිවැරදි සටන්පාඨය මේ වනවිට විවිධ අය තම තමන්ගේ පටු දේශපාලන අරමුණු සඳහා දොගනිමින් තිබෙන බවයි අපි දකින්නේ. විධායක ජනාධිපති ක්‍රමයෙන් සැබෑ ලෙසම පීඩාවට පත්වුණු සැබෑ ලෙසම ප්‍රජාතන්තත්‍රවාදය ඉල්ලා සිටින ජනතාවගේ හා බලවේගයන්ගේ වුවමනාව වංචනික ලෙස කොල්ලකමින් තම තමන්ගේ පටු දේශපාලන අරමුණු ඉටුකරගැනීමට එය යොදගන්නවා නම් ඒ පිළිබඳ මතුපිටින් නොව ගැඹුරින් බලා කටයුතු කිරීමට අපට සිදුවෙනවා. විධායක ජනාධිපති ක්‍රමය පැරදවීම සඳහා පොදු අපේක්ෂකයෙක් හොයන සමහර දේශපාලන ව්‍යාපාරවල ප්‍රධානීන් වෙලා ඉන්නේ කවුද? විධායක ජනාධිපති ක්‍රමයෙන් බැටකාපු අය නෙවෙයි. ඒ ක්‍රමයේ රස බලපු, ඒ ක්‍රමයෙන් තමන්ට වාසි ලබාගත් අයයි. විධායක ක්‍රමය අහෝසි කිරීමට පොරොන්දු වෙලා තව වසර 11ක පාලන කාලය තුළ එය ඉටු නොකළ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය සමඟ, විධායක ජනාධිපතිවරුන් සමඟ මිත්‍ර වෙලා කටයුතු කරපු වික්ටර් අයිවන් වැනි අය සමඟ, මහින්ද රාජපක්ෂ සමඟ තිබෙන පෞද්ගලික ගැටලු නිසා මහින්ද රාජපක්ෂට මිස සැබෑ ලෙසම විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධ නැති විවිධ අය සමඟ, මේ ප්‍රශ්නයට උත්තර හොයන්න බැහැ.

මේ බොහෝ දෙනා යළිත් මේ සූදානම් වන්නේ, ඉතිහාසයේ නැවත නැවත සිදුවූ ලෙස මේ මොහොතේ සියලු දෙනා එකතු කළහැකි සටන්පාඨය වූ ප්‍රජාතන්ත්‍රවාදයේ සටන්පාඨය පෙරට දමා රාජපක්ෂ මහතාගේ ධනපති පාලනය වෙනුවට තවත් එවැනි ධනවාදී පාලනයකට පාර කැපීමටයි. ඒ නිසා පොදු ජනතාවගේ සැබෑ අරමුණු හා වුවමනාව සැබෑ ලෙසම ජයග්‍රහණය කරවිය හැකි දේශපාලන මාවතකට රට රැගෙන යා යුතුයි. අප ඉදිරියේ මේ මොහොතේ ඇති අභියෝගය එයයි. ඒ සඳහා රට වර්තමානයේ පත්ව ඇති අගාධයෙන් ගොඩ ගත හැකි නිවැරදි ප්‍රතිපත්ති මාලාවක් මත මේ සමාජය වෙනස් කිරීමට නායකත්වය හා දායකත්වය දියහැකි පුළුල් ජනතා ව්‍යාපාරයක් ගොඩනැගිය යුතුයි. ජනාධිපතිවරණයද ඇතුළු ඉදිරි මැතිවරණවලදී වත්මන් ආණ්ඩුව පරදා ජයග්‍රහණය කරවිය යුත්තේ එවැනි දේශපාලන බලයකුයි. අපි වෙහෙසෙන්නේ ඒ වෙනුවෙනුයි.

***නියමුවාඃ- ඔබ කියන කාරණය පැහැදිලියි. ඒත් සමාජය තුළ මේ මොහොතේ විවිධ කණ්ඩායම් කලඑළි බසිමින් සිටිනවා. ඒ ගැන ඔබේ අදහස කුමක්ද?***

*ටිල්වින් සිල්වා සහෝදරයාඃ-*

ලංකාවේ දේශපාලනය උණුසුම් වී ආණ්ඩු මාරුවක් සඳහා තත්වයන් පෙළ ගැසෙන, දේශපාලන පිටිය කැළඹෙන මෙවැනි කාලවල ඒ කැළඹුණු දේශපාලනයේ තම තමන්ට කුඩා කුඩා හෝ වාසි ලබාගැනීම අරමුණු කරගෙන විවිධ සංවිධාන හා ව්‍යාපාර බිහිවෙනවා. මීට පෙරත් ආණ්ඩු පැරදවීම් සඳහා තත්වය පෙළගැසුණු අවස්ථාවල මෙවැනි විවිධ සංවිධාන මතුවෙලා තිබෙනවා. ඊට පස්සේ ඒව අතුරුදහන් වෙනවා. මේක හරියටම පෙරහැර කාලෙට හාමදෙනාම පුංචි කඩ දානවා වගේ වැඩක්. පෙරහැර ඉවර වුණාම මේ 'කඩ' අතුරුදහන් වෙනවා. ඒනිසා ඒවා ඒ තරම් බරපතළ ලෙස සැලකිය යුතු නැහැ. ඒත් මේ කුඩා කඩා අවස්ථාවාදී කණ්ඩායම් හා දේශපාලන වශයෙන් බංකොළොත් වූ පුද්ගලයින් රට ගෙනයා යුතු සැබෑ හා නිවැරදි දේශපාලන ගමන්මඟට බාධා කරනවා. ඒ බාධාත් මැඩගෙන පෙරට යාම තමයි අපේ වගකීම.

***නියමුවාඃ-ඃ- මේ තත්වය තුළ ඉදිරි ජනාධිපතිවරණයකදී පොදු අපේක්ෂකයා විය යුත්තේ කවුද? ඉදිරි ජනාධිපතිවරණ සටන පෙළ ගැස්විය යුත්තේ කුමන දිශාවටද?***

*ටිල්වින් සිල්වා සහෝදරයාඃ-*

පැහැදිලිවම මෙහිදී අප කෙටිකාලීන ජනප්‍රිය හා පහසු ලෙස පෙනෙන එහෙත් දිගුකාලීනව ජනතාවට හානිකර ක්‍රියාමාර්ග වෙනුවට දුෂ්කර වුවත් දිගුකාලීනව ජනතාවට ජයග්‍රහණ ගෙනෙන මාවතකට රටේ දේශපාලනය යොමුකළ යුතු වෙනවා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව සිතුවත් එය තනි පුද්ගලයෙකුට කරන්න බැහැ. මේක සරදියෙල්ලා, රොබින්හුඩ්ලා වගේ තනි 'වීරයන්ට' කරන්න පුළුවන් කාර්යයක් නෙමෙයි. ධනවාදය නියෝජනය කරන බලයට ආශාකරන පෞද්ගලික අරමුණුවලින් පිරුණු කෙනෙකුට එය කරන්න බැහැ. එවැනි අය එය කරන්නේ නැහැ. පසුගිය ඉතිහාසයෙන්ම අපේ අත්දැකීම එයයි. ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට නම් ඒ සඳහා වූ සවිමත් ජනතා ව්‍යාපාරයක්, ජනතා බලයක් අවශ්‍ය වෙනවා. එහිදී එම ජනතා ව්‍යාපාරයට හා ජනතාවගේ බලයට වගකියන, පටු අරමුණු නැති, කැපකිරීම් කළ හැකි, අවංක, කියු දේ කරන, ජනතාවගේ විශ්වාසය දිනාගත හැකි අපේක්ෂකයෙක් අවශ්‍ය වෙනවා. අප පෙනී සිටින්නේ, ඒ වෙනුවෙන්. දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති රනිල් වික්‍රමසිංහ මහතාට දේශපාලන අර්ථයෙන් මෙන්ම පෞද්ගලික අර්ථයෙන්ද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන පොදු අපේක්ෂකයා වෙන්න බැහැ. ඒ වගේම දැනට ඒ සඳහා කලඑළි බැස තිබෙන දේශපාලන කණ්ඩායම්වල ඉන්න බංකොළොත් පුද්ගලයින්ටත් ඒ සඳහා හැකියාවක් නැහැ. මේ සන්ධාන බොහොමයකට ජන පදනම් නැහැ. සංවිධාන ශක්තිය නැහැ. ධෛර්යය නැහැ. නිර්භීතකම නැහැ. ඒ නිසා මෙවැනි සටනකට නායකත්වය දෙන්න බැහැ.

අනෙක් අතට මේ බොහෝ දෙනාට රටේ මේ මොහොතේ පවතින සමාජ ආර්ථික සංස්කෘතික ප්‍රශ්නවලට විසඳුම් දියහැකි දැක්මක් හෝ ප්‍රතිපත්ති නැහැ. විධායක ජනාධිපති ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදය නැමති සටන්පාඨය තුළ ඉතිරි සියල්ල සඟවා තැබීමයි ඔවුන්ගේ අරමුණ. එබැවින් එය නිවැරදි නැහැ. මේ සියලු තත්වය මත වහාම මේ රටේ ධනවාදය විසින් නිර්මාණය කර ඇති සියලු සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදයන්ට දිගුකාලීන විසඳුම් ලබාදිය හැකි දැක්මක්, ප්‍රතිපත්ති මාලාවක් හා වැඩපිළිවෙළක් මත ශක්තිමත් පුළුල් ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීමත් එම ව්‍යාපාරයට වගකියන විශ්වසනීය ප්‍රගතිශීලී නායකයෙක් පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කිරීමත් හැර වර්තමාන අර්බුදයට වෙනත් නිවැරදි විසඳුමක් නැහැ. අපි ඒ වෙනුවෙන් කටයුතු කරනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

**පලස්තීනයට ජීවත්වෙන්න ඉඩ දෙනු! - එ.ජ. තානාපති කාර්යාලය ඉදිරිපිට**



**ජීවන වියදමට සරිලන වැටුපක් ඉල්ලා...**




**ඌවේ ප්‍රචණ්ඩත්වය ගැන කීමට මැතිවරණ කොමසාරිස් හමුවී..**



**බඩු මිල අඩු කරන ලෙස ඉල්ලා වීදි බැස...**




**පලස්තීනයට සහය පළකරමින් ලන්ඩනයේදී...**




# ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතර බෙදී යන පාලනයක් ගොඩනැගිය යුතුයි

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**



පවතින දූෂිත පාලනයක් වෙනස් කර ජනතාව ආර්ථිකයට සම්බන්ධ වෙන සහ එම ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතර සාධාරණ ලෙස බෙදී යන පාලනයක් ගොඩ නැගිය යුතුව ඇතැයිද ඒ සඳහා ආරම්භයක් තැබීමට ඌව පළාත් සභා මැතිවරණය යොදාගත යුතුයැයිද ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

ඔහු මෙසේ පැවසුවේ, පසුගිය 17වැනි දින මොනරාගල, බිබිල ප්‍රදේශයේ පැවති ජනහමුවකට එක්වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් අවුරුදු 66ක කාලයක් පුරා රටේ ජනතාව ප්‍රධානයැයි කියාගන්නා පක්ෂවලට ඡන්දය ප්‍රකාශ කර ඇති නමුත් එම ඡන්දවලින් ජනතාවට සිදුවූ යහපතක් නොමැති බවත් සිදුවූයේ බලය ලබාගත් නායකයින් පොහොසත්වීම පමණක් බවත් පෙන්වා දුන් අනුර දිසානායක සහෝදරයා, එම සමාජ ක්‍රමය වහා වෙනස් කළ යුතුව ඇතැයි අවධාරණය කළේය.

" අපි ඡන්දය පාවිච්චි කළ යුත්තේ රටේ වර්තමානයේ මතුවෙලා තියෙන දේශපාලන තත්වය මොකක්ද? රටට වෙලා තියෙන දේ හොඳද? වෙන්න යන දේ හොඳද? නරක නම් එය වෙනස් කරන්න ඡන්දය පාවිච්චි කළ යුත්තේ කොහොමද? යන්න ගැන සිතා බැලීමෙන් පසුවයි. දැන් අපි පරම්පරාවෙන් පරම්පරාවට ඡන්දය දීපු පුරුද්ද අත්හැරිය යුතුයි.

ගම්වල පක්ෂ සාමාජිකයෝ කැපුවත් කොළ, කැපුවත් නිල් කියලා ඡන්දය දෙනවා. නමුත් ඒ පක්ෂවල නායකයෝ එහෙම ඉන්නවද? ඒ අය එහෙට පනිනවා, මෙහෙට පනිනවා. මහින්ද මහත්තයලා කියනවා ආර්ථිකේ නග්ගලා ගන්නවා කියලා. ආණ්ඩුවේ මාධ්‍යවලින් කියනවා දළ ජාතික නිෂ්පාදිතය නැගලා, ඒකපුද්ගල **15වැනි පිටුවට**

# ඌව දුප්පත් කිරීමට සියලු පාලකයින් වගකිව යුතුයි

**ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා**



ඌව පළාත දුප්පත් ජනතාවගෙන් පිරී ගියද ඔවුන්ගෙන් ඡන්දය ලබාගත් පාලකයින් ධනවතුන් බවට පත්වී ඇති බවට චෝදනා කළ ඌව පළාත් කණ්ඩායම් නායක, ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා එම දුප්පත් කිරීමට එක්සත් ජාතික පක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාලකයින් විසින් වගකිව යුතුව ඇති බව කියා සිටියේය.

සමන්ත විද්‍යාරත්න සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 17වැනි දින බිබිල ප්‍රදේශයේ පැවති ජ.වි.පෙ. ජනහමුවේදීය.

"මේ පළාත දුප්පත් ජනතාවගෙන් පිරුණට ඔවුන්ගෙන් ඡන්දය ගත්ත පාලකයෝ පොහොසතුන් බවට වෙලා ඉන්නවා. මේ පළාතේ දුප්පත් ජනතාවක් සිටිය යුතු නැහැ. මේක සශ්‍රීක පළාතක්. 1818 වෙල්ලස්ස කැරැල්ල ආරම්භ වුණු මොහොතේ රොබට් බවුන්රිග් ආණ්ඩුකාරවරයා වෙල්ලස්සට ඇවිත් කීවේ ආදම්ගේ පළතුරු උයන වගේ සශ්‍රීක පළාතක් කියලා. එවන් සරුසාර භූමියක් දුප්පත් කළේ කවුද? වෙල්යායවල් ලක්ෂයක් තිබුණු වෙල්ලස්ස දුප්පත් කළේ කවුද? එළාර සමග සටනට ගිය දුටුගැමුණුගේ මග වැටී තිබුණේ ඌව පළාත හරහායි. ඔවුන් ගිමන් හරින ස්ථානය වුණේ මහියංගණයයි. ඒ මහා සේනාවට බත සැපයූවේ වෙල් ලක්ෂයක් තිබුණු වෙල්ලස්සෙන්. ඔවුන්ට දියවර සැපයූවේ මහවැලි නදියෙන්. ඒ මහ සේනාවට ශරීර ශක්තිය වර්ධනය කරන්න උදේට කැඳ සැපයුවේ කැඳ කැටි කළ තැන හෙවත් කන්දකැටියෙන්.

එවන් ප්‍රදේශයක් දුප්පත් වූවා නොවේ. ඒ දුප්පත් කිරීමට එක්සත් ජාතික පක්ෂ, පාලකයෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ පාලකයෝ වගකිව යුතුයි." ඔහු අවධාරණය කළේය.

# මුද්‍රණාල දූෂණ කියන්න වෘත්තීය සමිති ජ.වි.පෙ. හමුවෙයි



රජයේ මුද්‍රණාලය තුළ සිදුවන දූෂණ, වංචා, අක්‍රමිකතා හෙළිදරව් කිරීම සඳහා රජයේ මුද්‍රණාලයේ වෘත්තීය සමිති එකමුතුව ජනතා විමුක්ති පෙරමුණ වෙත කරුණු හෙළිදරව් කිරීමේ විශේෂ හමුවක් පසුගිය 22වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී සිදුවිය.

ඡන්ද පත්‍රිකා මුද්‍රණය කරනු ලබන රජයේ මුද්‍රණාලයේ ප්‍රධානියා ලෙස සුදුසුකම් නොලත් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් පත් කිරීමෙන් ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණ සියල්ල කෙරෙහි බරපතළ තත්වයන් ඇතිවන බව මෙහිදී වෘත්තීය සමිති නියෝජිතයෝ පෙන්වා දුන්හ. එමෙන්ම ආයතනයේ පැවැත්ම කෙරෙහිද මෙය බරපතළ තත්වයක් ඇතිකරවන බවද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 'නිල් පවුර' වැඩසටහනට අදාළ මුද්‍රණ කටයුතු සියල්ල රජයේ මුද්‍රණාලයෙන් සිදුකරගැනීම ඉදිරි මැතිවරණවලදී බරපතළ තත්වයක් ඇතිකරන බව වෘත්තීය සමිති එකමුතුවේ කැඳවුම්කරු සරත්ලාල් සහෝදරයා පැවසීය.

මෙම අවස්ථාවට ජ.වි.පෙ. වෙනුවෙන් දේශපාලන මණ්ඩල සභික සෝමවංශ අමරසිංහ සහෝදරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා සහභාගි වූහ.

# දැයට කිරුළ නාස්තියට මුදල් තිබුණත් ජල ප්‍රශ්නයට ආණ්ඩුවට සල්ලි නැහැ

**ජනතා විමුක්ති පෙරමුණ**



ආණ්ඩුවට දැයට කිරුළ නමින් රු. කෝටි 6,000ක්, 7,000ක් වැනි මුදලක් නාස්ති කළ හැකි වුවත් ආර්ථිකය ශක්තිමත් කරන්නා වූ ජනතාවගේ මූලික පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා ආණ්ඩුවට මුදල් නොමැතිවී ඇතැයි ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා පෙන්වා දුන්නේය.

"ගුවන්යානා එන්නේ නැති ගුවන්තොටපොළවල් හදන්න සල්ලි තියෙනවා; නැව් එන්නේ නැති වරායවල් හදන්න සල්ලි තියෙනවා. නමුත් බොන්න වතුර ටිකක් දෙන්න සල්ලි වෙන්කරන්නේ නැහැ." ටිල්වින් සිල්වා සහෝදරයා මේ අදහස් පළකළේ පසුගිය 01වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

# ඌව දිනාගන්න ආණ්ඩුව මැතිවරණ භීෂණයක් මවනවා

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**



ආණ්ඩුව ඌව මැතිවරණය තනිව පවත්වන ලද්දේ විශාල ජයග්‍රහණයක් ලබාගැනීමේ අරමුණින් වුවද මේවන විට එය අසාර්ථක වෙමින් ඇති බැවින් ඌව මැතිවරණය දිනාගැනීම සඳහා ආණ්ඩුව මැතිවරණ නීති උල්ලංඝනය කරමින් භීෂණය වපුරමින් සිටින්නේයැයි ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ප්‍රකාශ කළේය.

ටිල්වින් සහෝදරයා මෙසේ ප්‍රකාශ කළේ පසුගිය 26වැනි දින පැලවත්ත ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය හමුවකදීය.

නීති විරෝධී මැතිවරණ ක්‍රියාවලියක සිටි ආණ්ඩුව තවත් පියවරක් ඉදිරියට තබමින් විපක්ෂයේ පක්ෂවල සාමාජිකයින්ට පහරදීමටත් කාර්යාල කඩා දැමීමටත් වේදිකා ගිනි තැබීමටත් නීති විරෝධී ගිනිඅවි පාවිච්චි කරමින් වෙඩි තබන්නටත් පටන්ගෙන ඇතැයි කී ටිල්වින් සිල්වා සහෝදරයා, නීති විරෝධී ගිනි අවි රැගෙන ආරක්ෂක අංශ භාවිතා කරන ඩිෆෙන්ඩර් රථවලින් පැමිණෙන ආණ්ඩුවේ මැර පිරිස් විශාල භීතියක් ඇතිකර ජනතාව බියවද්දා මැතිවරණයට බාධා කිරීමේ සැලසුම් සහගත ක්‍රියාවලියක නිරතව සිටින බවට චෝදනා කළේය.

"රටක නීතිය ආරක්ෂා කරන්න පොලිසියට නොහැකි නම් මැතිවරණ නීතිය ආරක්ෂා කිරීමට මැතිවරණ කොමසාරිස්ට බැරිනම් ජනතාව තමන්ගේ බලය පාවිච්චි කර මැර කණ්ඩායම් නඩත්තු කරන ආණ්ඩුවට පණිවුඩයක් දිය යුතුයි. ඒ මැරකම් කරන, නීති කඩන අපේක්ෂකයින්ට ඡන්දය නොදිය යුතුයි" ටිල්වින් සහෝදරයා අවධාරණය කළේය.

කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.